

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

2021

කාර්යසාධන වාර්තාව

අංක 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය

කාර්යසාධන වාර්තාව 2021

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය : 161

වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය : 424

පටුන

	පිටුව
පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	11
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	17
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	49
පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක	57
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	58
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	59
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව	63

කෘෂිකර්ම සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ ගරු අමාත්‍යතුමාගෙන්.....

“වනජීවීන් හා වන සම්පත සුරැකි තිරසර දේශයක්”

මේ වනවිට මුළු ලෝකය ම කථා කරන තිරසර ලොවක් වෙනුවෙන් වනජීවී සම්පත සුරැකි දේශයක් බිහිකිරීමේ දායකත්වය ලබාදීමේ මහඟු මෙහෙවරට එක්වෙමින් වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍රගතිය ඇතුලත් කර සකසන ලද ප්‍රගති වාර්තාවට පණිවිඩයක් එක් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව අතිශයින් සතුටු වෙමි. එසේම 2022.05.23 දින අමාත්‍යාංශ සංශෝධනය මගින් **කෘෂිකර්ම වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය ලෙස මෙම අමාත්‍යාංශය නැවත ස්ථාපිත විය.**

කොවිඩ් 19 වසංගත තත්ත්වය රට පුරා පැතිරෙමින් මිනිස් සත්ත්ව ප්‍රජාවට මහත් අභියෝගයක් වෙමින් පවතින මෙම කාල වකවානුව තුළ “රට හදන සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශනයට අදාළ ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කරගැනීමේ කාර්යයට උරදෙමින් වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය මේ වන විට මහඟු කාර්යභාරයක් ඉටුකර ඇත.

අප මුහුණදෙන ප්‍රධාන අභියෝගයක් ලෙස අලි මිනිස් ගැටුම හැඳින්විය හැකි ය. මෙම ගැටුම නිසා වාර්ෂිකව මිනිස් ජීවිත හා අලි ඇතුන් විශාල ප්‍රමාණයක් රටට අහිමි වෙයි. එබැවින්, ඉහත අභියෝගය ජය ගැනීම සඳහා ඉදිරි වසර 3 සඳහා දැනටමත් සැලසුම් සකස්කර ඇත. මෙහි දී විශේෂයෙන් ම අතිගරු ජනාධිපතිතුමා විසින් අලිමිනිස් ගැටුම විසඳීම සඳහා විශේෂ කාර්ය සාධන කමිටුවක් පත්කර ඇත. එම කමිටුව විසින් කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන විසඳුම් ලබා දීමට යෝජනා ඉදිරිපත්කර ඇත. කමිටු යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා වනජීවී රාජ්‍ය අමාත්‍යාංශය හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැනටමත් පියවර ගෙන ඇත.

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය මගින් අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ගම වටකොට “ ග්‍රාමීය විදුලි වැට ” ඉදිකිරීමේ කටයුතු මේ වනවිට සාර්ථකව ක්‍රියාත්මක කරමින් සිටී. අලි මිනිස් ගැටුම උග්‍රව පවතින දිස්ත්‍රික්ක දෙකක් වන අනුරාධපුර හා කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි ජනතා සහභාගිත්වය ඇතිව දැනට මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇත. ඉහත ව්‍යාපෘතිය මගින් වන අලින් විසින් හානි කරනු ලබන අහිංසක ජනතාවගේ වගා ආරක්ෂා කිරීම සඳහා “කෘෂිකාර්මික විදුලි වැට” ඉදිකිරීම ද ආරම්භ කර ඇත.
කෙසේ වෙතත් , අවාසනාවන්ත ලෙස අලි ප්‍රහාර වලින් මිය යන ජනතාව සඳහා රජය විසින් වන්දි ලබාදීම අඛණ්ඩව සිදුකර ඇත.අලි ප්‍රහාරවලින් මියයන හා පූර්ණ කාලීන බෙලහීනතාවයට පත්වන පුද්ගලයකුට ලබාදෙනු ලබන වන්දි මුදල රු. ලක්ෂ 5 සිට රු. ලක්ෂ 10 දක්වා දෙගුණයකින් වැඩි කිරීමට රජය මේ වන විට කටයුතු කර ඇත.

පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ පාරිසරික සංරක්ෂණය සුරක්ෂිත කිරීම සඳහාත් , රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම සඳහාත් ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරයි. තවද පාරිසරික සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම, රක්ෂිත ප්‍රදේශවල භූ දර්ශන කළමනාකරණ සැලසුම් මගින් නිවැරදි දත්ත ලබා දීමට අවශ්‍ය පහසුකම් සැලසීම ද එම ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබයි.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ප්‍රධාන වශයෙන්ම අලි මිනිස් සංඝර්ෂයාව ඇති කරලීම සඳහා අලිවැට ඉදිකිරීම මෙන්ම ස්වභාවික පරිසරය ආරක්ෂා කොට අලි මංකඩවලට ඇති බාධා ඉවත් කර අලින්ට පහසුවෙන් සංචරණ පහසුව ඇති කිරීමට අවශ්‍ය කටයුතු ද සිදු කරමින් පවතී. එසේම සතුන්ට අවශ්‍ය ජලය, ආහාර ලබා ගැනීම සඳහා වාසස්ථාන සුපෝෂණය , ජාතික උද්‍යානවලට පැමිණෙන සංචාරකයින්ගේ පහසුව සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, රක්ෂිත ප්‍රදේශවල මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීමේ කටයුතු ද සිදුකරමින් පවතී.

“රට හදන සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව ඉදිරි වසර 3 තුළදී ශ්‍රී ලංකාවේ වන වැස්ම 30%ක් දක්වා ඉහළ නංවා ගැනීමේ අභියෝගය ජය ගැනීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සුවිශේෂී කාර්ය භාරයක් ඉටුකරමින් සිටියි. තව ද, හරිත ආවරණය පුළුල් කිරීමේ වැඩසටහන්, වගුරු බිම් සහ කඩොලාන පද්ධති සංරක්ෂණය, නැවත වන වගා කිරීම, ගංගා ආශ්‍රිත හා භූමි ආශ්‍රිත නිශ්චිත වැලි කැණීම්, තීරු ස්ථාපනය කිරීම, පාරිසරික සංචාරක කටයුතු ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් දියත් කර ඇත. වන වැස්ම 30% දක්වා ඉහළ නැංවීමේ දී නාගරික, අර්ධ නාගරික ප්‍රදේශවල තුරු උයන් ඉදිකිරීම, අධිවේගී මාර්ග දෙපස ,පාපැදි මාර්ග දෙපස නාගරික මහල් නිවාස, රජයේ ආයතන හා කර්මාන්ත ශාලා ආශ්‍රිතව පැළ සිටුවීම දැනටමත් ආරම්භ කර ඇත.

අමාත්‍යාංශ විෂය ක්ෂේත්‍රයට අයත් දෙපාර්තමේන්තුවක් ලෙස ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව නවීන සංකල්ප යටතේ පිළිගත් නීතිරීති වලට අනුව උපරිම රැකවරණය සලසමින් සතුන් ප්‍රදර්ශනය කිරීම වැනි වැඩසටහන් මගින් දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය දිනා ගැනීම තුළින් ජාතික ආදායම ඉහළ නැංවීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී.

අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය දැව සංස්ථාව 2021 වසරේ පැවති කොවිඩ් තත්ත්වය තුළ වුව ද 2021.12.31 දින වන විට රු.මි. 6153.00 ක අලෙවි ආදායමක් ලබා ගැනීමට සමත් ව ඇත. ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස දිවයිනේ අනර්ඝ ම දැව භාණ්ඩ සැපයුම්කරු වීමේ ඉලක්කය කරා ගමන් කිරීම සඳහා අවශ්‍ය නායකත්වය මා විසින් නිරන්තරයෙන් ම ලබා දෙන්නෙමි.

ගහකොළ සතා සිව්පාවා හා ස්වභාවික පාරිසරික සම්පත් ආරක්ෂාකර ගැනීම සඳහා අමාත්‍යාංශය ලෙස භාරදූර කාර්යයක් ඉටුකිරීම සඳහා මෙතෙක් නායකත්වය ලබාදෙමින් කටයුතු කරනු ලැබූ ගරු වනජීවී හා වන සංරක්ෂණ ගරු අමාත්‍ය සී.බී. රත්නායක මැතිතුමා හා පූර්වගාමී වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් සෝමරත්න විදානපතිරණ මහතාටත් ,මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. ප්‍රගති වාර්තාව සකස් කිරීම සඳහා තොරතුරු ලබාදුන් සියලු ම ආයතන ප්‍රධානීන්ටත්, අනෙකුත් සියලු නිලධාරීන්ට හා භාෂා පරිවර්තන කටයුතු කර දුන් නිලධාරීන්ටත් මාගේ ස්තූතිය පුද කරමි.

මහින්ද අමරවීර
කෘෂිකර්ම සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය

ලේකම්තුමියගේ පණිවිඩය.....

ගෝලීය වශයෙන් මුළු ලෝකය පුරාම කොවිඩ් වසංගත තත්ත්වය පැතිර පවතින කාලවකවානුවක "රට හඳන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය විසින් ඉටුකළ යුතු අභියෝග රාශියක් පවතී. වනජීවී ආරක්ෂණය හා වන සංරක්ෂණයට අදාළ ප්‍රතිපත්ති අණපනත්වලට අනුකූලව මිනිසාට වඩාත් සංවේදී වන ගහ කොළ ,සතා ,සිව්පාවා ආරක්ෂා කර ගැනීම සඳහා අප හමුවේ ඇති ඉදිරි අභියෝග ජය ගැනීමට නිරන්තර මග පෙන්වීම ලබාදීමට අමාත්‍යාංශය සුදානම්ව සිටියි.

ඉදිරි අභියෝග ජය ගැනීම සඳහා වනජීවී සංරක්ෂණ, වන සංරක්ෂණ හා ජාතික සත්වෝද්‍යාන යන දෙපාර්තමේන්තු, ද රාජ්‍ය දැව සංස්ථාව හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පරිසර පද්ධති සංරක්ෂණ කළමනාකරණ ව්‍යාපෘතිය ද හා එක්ව විශේෂ වැඩ පිළිවෙලවල් යටතේ කටයුතු කරමින් සිටී.

දිස්ත්‍රික්ක 19 ක පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 133 ක් වෙනුවෙන් බලපාන අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ප්‍රමුඛ ව කටයුතු කරන අතර අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරන ලද විශේෂ කාර්ය සාධක කමිටුවේ යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් සිටී. අලිවැට ඉදිකිරීම, වන අලි ගම්වැදීම අවම කිරීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම, වන සතුන් සංරක්ෂණය කිරීම, වන සතුන්ගේ ජලය, ආහාර සැපයීම වැඩි කිරීම හා ස්වභාවික පරිසරය ආරක්ෂා කර අලිමංකඩවලින් බාධාවකින් තොරව ගමන් කිරීම සඳහා පවතින බාධක ඉවත් කිරීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගය ගෙන ඇත. එසේම, දෙස් විදෙස් සංචාරකයන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රමුඛත්වය ලබාදී ඇත.

ජාතික වන වැස්ම 30% දක්වා ඉහළ නැංවීම සඳහා වන ඉලක්ක ජයගැනීම සඳහා වන වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, 2021 වර්ෂයේ විශේෂ අයවැය යෝජනා යටතේ ලබාදුන් ප්‍රතිපාදන මගින් අධිවේගී මාර්ග දෙපස, පාපැදි මාර්ග දෙපස, නාගරික මහල්නිවාස, රජයේ ආයතන, කර්මාන්තශාලා ආශ්‍රිත රුක් රෝපණය මෙන්ම අර්ධනාගරික තුරු උයන් ඉදිකිරීම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි. එසේම, දෙපාර්තමේන්තුව මගින් හරිත ආවරණය පුළුල් කිරීම, නැවත වන වගා ව්‍යාපෘති, ගංඟා භූමි ආශ්‍රිත නිශ්චිත වැලි කැණීම්, තීරු ස්ථාපනය කිරීම හා පාරිසරික සංචාරක කටයුතු ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් රාශියක් දැනටමත් ආරම්භ කර ක්‍රියාත්මක කරමින් පවතී.

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ ඇති දෙහිවල හා පින්නවල සත්වෝද්‍යාන, පින්නවල අලි අනාථාගාරය හා හම්බන්තොට සෆාරි උද්‍යානවල සංවර්ධන කටයුතු ඉහළ නංවමින් දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණය ලබාගැනීමට අවශ්‍ය වැඩසටහන් නොකඩවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මහ පෙන්වීම ලබා දී ඇත. තවද, පිළියන්දල කහපොල ප්‍රදේශයෙන් අක්කර 70 ක පමණ භූමි භාගයක් තුල නව සත්වෝද්‍යානය ආරම්භ කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග මේ වන විට ගනිමින් සිටී.

රාජ්‍ය දැව සංස්ථාව පවතින කොවිඩ් තත්ත්වය තුළ වුවද 2021 වසරේ දෙසැම්බර් අවසාන වන විට රු.මි 6153ක ඉහළ අළෙවි ආදායමක් ලබා ගනිමින් රටේ ජාතික ආදායම ඉහළ නැංවීමට අවශ්‍ය දායකත්වය ලබාදීමට සමත්ව ඇත. එසේ ම, රාජ්‍ය දැව සංස්ථාව මගින් අපනයනය කෙරෙන දැව කඳන් වෙනුවට අගය එකතු කර අපනයනයට කටයුතු කිරීමත් එමගින් විදේශ විනිමය ඉහළ නංවා ගැනීම සඳහා කටයුතු කරනු ඇත. තවද , ශ්‍රී ලංකාවට විදේශ රට වලින් ආනයනය කෙරෙන දැව නියාමනය කිරීමටත් ප්‍රමිතියකින් යුතු දැව ආනයනය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමටත් පියවර ගෙන ඇත.

පරිසර පද්ධති සංරක්ෂණ කළමනාකරණ ව්‍යාපෘතිය මගින් ජෛව විවිධත්වය ආරක්ෂා කර ගැනීම සඳහාත් පාරිසරික සංරක්ෂණ කටයුතු ප්‍රවර්ධනය කර ගැනීම සඳහාත් අවශ්‍ය වැඩසටහන් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු හරහා ක්‍රියාත්මක කරමින් සිටී. ව්‍යාපෘතිය මගින් රක්ෂිත ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ද පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කරමින් දෙස් විදෙස් සංචාරකයන්ට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ද කටයුතු කරයි. එසේ ම වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවල ධාරිතා සංවර්ධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අවශ්‍ය වැඩසටහන් ද දියත් කර ඇත.

විශේෂයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ගිරිතලේ ඉදිකරමින් පවතින වනජීවී පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය නිම කිරීමෙන් පසු වනජීවී පර්යේෂණවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමටත් හැකිවනු ඇත. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන නුවරඑළිය වන විද්‍යායතනය සංවර්ධනය කිරීම තුළින් විශ්වවිද්‍යාල මට්ටමට උසස්කර දෙපාර්තමේන්තු නිලධාරීන් හා උසස් අධ්‍යාපනය ලැබීමට කැමති ශිෂ්‍යයන්ගේ උසස් අධ්‍යාපන අවස්ථාව ඉහළ නැංවීමට අවශ්‍ය දායකත්වයක් ව්‍යාපෘතිය තුළින් ලබාදෙයි. එමෙන්ම දැනට ඉදිකරමින් පවතින ඉනාමළුව වන විද්‍යා ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානයේ වැඩ නිම වූ පසු උසස් අධ්‍යාපනය ලබන සිසුන් හා විශ්වවිද්‍යාල සිසුන්ට එමගින් බොහෝ ප්‍රතිලාභ ලබා ගත හැකිවනු ඇත.

මිනිසාගේ පැවැත්ම සඳහා වනජීවී මෙන් ම වන සම්පත ද අනිවාර්යෙන් රැකගත යුතුයි. ඒ සඳහා මෙතෙක් නායකත්වය ලබාදෙමින් කටයුතු කරනු ලැබූ ගරු වනජීවී හා වන සංරක්ෂණ ගරු අමාත්‍ය සී.බී. රත්නායක මැතිතුමා හා වර්තමානයේ අමාත්‍යධුරය දරණ මහින්ද අමරවීර මැතිතුමාටත්, පූර්වගාමී වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් සෝමරත්න විදානපතිරණ මහතාටත් , වන සංරක්ෂණ, වනජීවී සංරක්ෂණ, ජාතික සත්වෝද්‍යාන යන දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂ ජනරාල්වරුන්ට හා ,රාජ්‍ය දැව සංස්ථාවේ සභාපතිතුමාට හා සාමාන්‍යාධිකාරිතුමාටත්, පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂතුමාටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. කාර්යසාධන වාර්තාව සකස් කිරීම සඳහා තොරතුරු ලබාදුන් සියලු ම ආයතන ප්‍රධානීන්ටත්, අනෙකුත් සියලු නිලධාරීන්ට හා භාෂා පරිවර්තන කටයුතු කරදුන් නිලධාරීන්ටත් මාගේ ස්තූතිය පුද කරමි.

ආර්.එම්.සී.එම්. හේරත්
ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

2020.08.09 දිනැති අංක 2187 /27 දරන , අති විශේෂ ගැසට් පත්‍රය මගින් වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය පිහිටුවන ලදී.

ඒ අනුව වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයට ‘‘සෞභාග්‍යයේ දැක්ම‘‘ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව වනජීවී ආරක්ෂණ හා වන සංරක්ෂණය සඳහා අදාළ ප්‍රතිපත්ති, අණපනත් වලට අනුකූලව මිහිතලයට වඩාත් සංවේදී වන ගහකොළ සතා සිව්පාවා ආරක්ෂා කිරීමේ වගකීම භාරවී ඇත. එසේම අමාත්‍යාංශය යටතට අයත්වන රාජ්‍ය දැව සංස්ථාව මඟින් ජාතියේ විශ්වසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරු බවට ඉදිරි පස් වසර තුල පත්වීමට අවශ්‍ය නායකත්වය සැපයේ. එමෙන්ම රාජ්‍ය අමාත්‍යාංශයට ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම තුළින් වනජීවී හා වන සංරක්ෂණය මගින් ජෛව විවිධත්වය පෝෂණය කිරීමටත් අවශ්‍ය මග පෙන්වීම් කෙරේ. සංවේදී වන වගාවන් තුළින් ජාතික වන වැස්ම පුළුල් කිරීම හා වන සතුන් ජීවත්වන ස්වභාවික පරිසරය සංරක්ෂණය කරමින් අනාගත පරපුරට දායාද කිරීමට කටයුතු කිරීමේ වගකීමද අමාත්‍යාංශය වෙත පැවරී ඇත.

එසේම, 2022.03.08. දින 2270/14 අංක දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් පූර්වගාමී වනජීවී රැකවරණ, අලි වැට හා අගල් ඉදිකිරීම ඇතුලු වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති විෂය පථයද ඇතුලත් කර වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය පිහිටුවන ලදී. ඒ අනුව එම රාජ්‍ය අමාත්‍යාංශයට අදාල 2021 කාර්යසාධන වාර්තාවද මෙහි අන්තර්ගත කර ඇත.

1.2 අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර

දැක්ම

"වනජීවීන් හා වන සම්පත සුරැකි තිරසර දේශයක්"

මෙහෙවර

" වනජීවී හා වන සංරක්ෂණය මගින් පෙව විවිධත්වය පෝෂණය කිරීම අරමුණු කරගනිමින් ස්ථානීය වෘක්ෂලතා සංරක්ෂණය සහ ස්ථානීය හා පරිබාහිර සත්ත්ව සංරක්ෂණය ද තිරසර දැව කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය, නියමු ආයතන සම්බන්ධීකරණය, මෙහෙයවීම හා ක්‍රියාවට නැංවීම සඳහා නායකත්වය සැපයීම"

1.3 ප්‍රධාන කාර්යයන් හා විෂය පථය

විෂයපථය

වනජීවී හා වන සම්පත් සංරක්ෂණය මගින් පෙව විවිධත්වය පෝෂණය කිරීම හා පරිසර සංවේදී වන වගාවන් තුළින් ජාතික වන වැස්ම පුළුල් කිරීම හා වන සතුන් ජීවත්වන ස්වාභාවික පරිසරය සංරක්ෂණය කිරීම.

කාර්යයන් හා කර්තව්‍යයන්

1. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "වනජීවී ආරක්ෂණය හා වන සංරක්ෂණය" ඇති කිරීම සඳහා නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව වනජීවී හා වන සංරක්ෂණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
2. ජාතික අයවැය , රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම .
3. අමාත්‍යාංශ විෂය යටතට අයත් ආයතනයන්හි විෂයන් හා කාර්යයන් හා ඊට අදාල ප්‍රතිපත්ති , වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

සුවිශේෂී ප්‍රමුඛතා

1. වන ජීවීන්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය වනෝද්‍යාන, ජලාශ හා වන සතුන්ගේ ආහාර භෝග වගා පුළුල් කිරීම.
2. වන සතුන්ගෙන් ග්‍රාමීය පළාත් වල නිවාස, දේපළ හා වගාවන් සඳහා වන හානි අවම කර ගැනීමේ නවීන වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම.
3. අලි මිනිස් ගැටුම් වැළකෙන පරිදි එම අවදානම් ප්‍රදේශවල අලිවැට , අගල් ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් වලට සමගාමීව ප්‍රජා මූල ආරක්ෂණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම.

4. වන වගාවන් පුළුල් කිරීම මඟින් වන ඝනත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා ගෙවතු මට්ටමේ මෙන්ම පාසැල්, රෝහල්, කාර්යාල,වැඩපළවල් හා මාර්ග අවම ප්‍රදේශ වල මෙන්ම නාගරික උද්‍යාන වල වන වගාව හඳුන්වාදීම හා පුළුල් කිරීම.

1. 4. සංවිධාන සටහන


ලේකම්
අති. ලේකම් (පාලන)
SLAS (විශේෂ ශ්‍රේණිය)
අති. ලේකම් (සංවර්ධන)
SLAS (විශේෂ ශ්‍රේණිය)
අධ්‍යක්ෂ ජනරාල්
SLPS (විශේෂ ශ්‍රේණිය)
අති. ලේකම් (ව්‍යාපෘති)
(විශේෂ ශ්‍රේණිය)
SLSS
ප්‍රධාන මූල්‍ය නිලධාරි
SLAcS (විශේෂ ශ්‍රේණිය))
අතිරේක ලේකම් (තාක්ෂණ)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
SLAcS (I)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)
SLAS (I)
ප්‍රධාන ඉංජිනේරු
SLEg.S(I)
අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍යක්ෂ (සැලසුම්)
SLPS (I)
ප්‍රධාන ගණකාධිකාරී
SLAcS (I)
අභ්‍යන්තර විගණක
SLAcS (III/II)
සහකාර ලේකම්
SLAS (III/
නීති නිලධාරී.
Dept.
(III/II)
යාන්ත්‍රික ඉංජිනේරු.
SLEgS
(III/II)
නියෝජ්‍යඅධ්‍යක්/ සහකාර අධ්‍යක්ෂ
SLPS (III/II)
ගණකාධිකාරී
SLAcS
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
තොරතුරු තාක්ෂණ නිලධාරී
සං.නි/කළ.ස
කැමරා කරු/ වීඩියෝ
සං.නි/ කළ.ස
සං.නි/කළ.ස
සං.නි/කළ.ස
සං.නි/කළ.ස
සං.නි/කළ.ස
සං.නි/කළ.ස
රියදුරු
කාර්යාල කාර්ය සහායක
සහකාර කැමරාකරු/ වීඩියෝ ශිල්පී
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක

1.5 අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන හා ව්‍යාපෘති

- රාජ්‍ය දැව සංස්ථාව
- පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

1.5.1 රාජ්‍ය දැව සංස්ථාව

හැඳින්වීම

රාජ්‍ය දැව සංස්ථාව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1968.04.04 දිනැති හා අංක 14796 ගැසට් පත්‍රය මගින් පිහිටුවන ලද අතර, 1969.11.07 අංක 14879 දරණ ගැසට් නිවේදනය, 1982.02.05 අංක 178 /10 අති විශේෂ ගැසට් නිවේදනය, 2001.06.26 අංක 1190/07 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය හා 2008.02.25 අංක 1538/7 ගැසට් නිවේදනය මගින් තවදුරටත් සංශෝධනය කර යාවත්කාලීන කර ඇති අතර , දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ උච්චස්ථානයේ වැජඹෙමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අගනා දායකත්වයක් ලබාදෙයි.

දැක්ම

ජාතියේ විශ්වාසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරුවීම සහ දැව වෙළඳපොළෙහි සැබෑ නායකත්වය ඉසිලීම

මෙහෙවර

තාක්ෂණික දැනුම, කීර්තිනාමය හා නිපුනතාවය උපයෝගි කරගනිමින් නීත්‍යානුකූලව, පරිසර හිතකාමී අන්දමින් ජාතික අවශ්‍යතාවය අනුව ගැනුම්කරුවන්ගේ දැව සහ දැවමය භාණ්ඩ ඉල්ලීම නිෂ්පාදනය කර ලබාදීම.

කාර්යභාරය

- වනාන්තරවලින් දැව කපා ඉවත් කිරීම, එම දැව ඉරුදැව හා නිමි භාණ්ඩ බවට පරිවර්තනය කිරීම, දැව කඳන්, ඉරුදැව හා නිමි භාණ්ඩ නිෂ්පාදන අලෙවිය සහ යථෝක්ත කාර්යයන් සඳහා කැලෑ මාර්ග ඉදිකිරීම.
- දැව කඳන් කිරීමේ මධ්‍යස්ථාන, ඉරුම් මෝල්, තෙල් කැවීමේ හා පරීක්ෂණ යන්ත්‍රාගාර, දැව වියළීම හා වියළීමේ උඳුන් හා අවශ්‍ය උපකරණ මිලදීගැනීම, ඉදිකිරීම හා ක්‍රියාකරවීම.
- දැව අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.
- දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය.
- දැව ආනයනය කිරීම.
- නව වනවගා ව්‍යාපෘති ආරම්භ කිරීම, නැවත වනවගා කිරීම, කැලෑ සහ වන වගාවන් විද්‍යාත්මකව කළමනාකරණය කිරීම.
- කෘෂිකාර්මික නිෂ්පාදන.
- දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ නිෂ්පාදන අපනයනය කිරීම.
- පෞද්ගලික ඉඩම් වලින් දැව මිලදීගැනීම.
- වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන පිරිසැකසුම.
- චේවැල් ආනයනය කිරීම.

- නියැදි පරීක්ෂා කිරීම් මගින් දේශීය හා ආනයනය කරන ලද දැව හඳුනාගැනීම සහ දැව සම්බන්ධ සහතික නිකුත් කිරීම.
- දැව කර්මාන්තය ආශ්‍රිත විෂයයන් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම, සහතික ප්‍රදානය කිරීම සහ පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- සංස්ථාවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල සම්පූර්ණ ප්‍රයෝජනය ලබාගැනීම සඳහා සැලසුම් කිරීම සහ ඒ වෙනුවෙන් ආයෝජනය කිරීම.

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතනගත අරමුදල්

මෙම අමාත්‍යාංශය යටතේ ආදායම් උපයන ආයතනයක් වන රාජ්‍ය දැව සංස්ථාව හා විදේශ ආධාර මත ක්‍රියාත්මක වන පරිසර පද්ධති සංරක්ෂණ කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP) පමණක් පවතින බැවින් ආයතනගත අරමුදල් නොමැත.

1.7 විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති

පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

1.7.1 හැඳින්වීම

ව්‍යාපෘතියේ ආරම්භක පිරිවැය ඇ. ඩො. මිලියන 45.0ක් වූ අතර අරමුදල් සපයන ලද්දේ ජාත්‍යන්තර සංවර්ධන සහයෝගිතාවය (IDA) ණය ආධාරයකිනි. කෙසේ නමුත්, පවත්නා Covid වසංගත තත්ත්වය හේතුවෙන් සමස්ත පිරිවැය අඩුකර ඇත. එබැවින් ව්‍යාපෘතිය ඩොලර් මිලියන 35.0ක් දක්වා පහත දැක්වෙන අයුරින් ප්‍රතිව්‍යුහගත කර තිබේ. මෙම ව්‍යාපෘතිය 2017 ආරම්භ කර ඇති අතර 2021 අවසන් වීමට නියමිත වුවත් ලෝක බැංකුව විසින් වසරක කාල දිගුවක් ලබා දී ඇත.

අනු අංකය	ව්‍යාපෘති සංරචකය	සමස්ත මූල්‍ය ප්‍රතිපාදන (ඇ.ඩො මිලියන)
1	භූ දර්ශන සැලසුම් සහ කළමනාකරණ නියමු ව්‍යාපෘතිය හා සන්නිවේදන කටයුතු	0.7
2	ස්වභාවික සම්පත් තිරසර භාවිතය සහ අලි-මිනිස් සහජීවනය	6.80
3	රක්ෂිත ප්‍රදේශ කළමනාකරණ සහ ආයතනික ධාරිතාව	26.0
4	ව්‍යාපෘති කළමනාකරණය	1.5
එකතුව		**35.0**

1.7.2 ප්‍රධාන සංවර්ධන අරමුණු

ප්‍රධාන සංවර්ධන අරමුණු

- සංරක්ෂණය සහ ප්‍රජාවේ යහපත වෙනුවෙන් ශ්‍රී ලංකාවේ තෝරාගත් ස්ථානවල පරිසර පද්ධතින්හි කළමනාකරණය වැඩිදියුණු කිරීම.
- ව්‍යාපෘතිය මූලික වශයෙන් ජෛව විවිධත්ව කළමනාකරණය වැඩිදියුණු කිරීම.
- රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම.
- අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම.
- රක්ෂිත ප්‍රදේශ වඩාත් ඵලදායි ලෙස හා තිරසර සංවර්ධන භාවිතයෙන් කළමනාකරණය පිණිස වනජීවී සංරක්ෂණ සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවල ධාරිතා සංවර්ධනය කිරීම.

2 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ඒකාබද්ධ අරමුදල ප්‍රගතිය - වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය - 161

2.1 සංවර්ධන වැඩසටහන් ප්‍රගතිය 2021 - ප්‍රගති සාරාංශය

ආයතනය	මූලධන			පුනරාවර්තන		
	ප්‍රතිපාදන (රු .මී)	සත්‍ය වියදම (රු .මී)	වියදම %	ප්‍රතිපාදන (රු .මී)	සත්‍ය වියදම (රු .මී)	වියදම %
වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය	32.77	30.05	92	236.72	233.99	99
පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය	1518.0	1427.34	94			
එකතුව	1550.77	1457.39	94	236.72	233.99	99

වැය විෂය	වැය විස්තරය	2021 ඇස්තමේන්තුව (රු)	අතිරේක ප්‍රතිපාදන (රු)	මු.රෙ. 66 මාරු කිරීම් (රු)	ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු)	2021.12.31 දිනට වියදම (රු)	ප්‍රතිපාදන ඉතිරිවීම් (රු)	ප්‍රගතිය (%)
1001	වැටුප් හා වේතන	47,800,000.00	0	5,000,000.00	52,800,000.00	52,202,212.94	597,787.06	98.87
1002	අතිකාල හා නිවාඩු දින වැටුප්	9,000,000.00	0	-1,750,000.00	7,250,000.00	6,511,312.70	738,687.30	89.81
1003	වෙනත් දීමනා	18,000,000.00	0	-1,950,000.00	16,050,000.00	15,965,686.19	86,713.81	99.46
1101	ගමන් වියදම්	3,000,000.00	0	50,000.00	3,050,000.00	2,966,280.00	83,720.00	97.26
1102	ගමන් වියදම් (විදේශීය)	2,000,000.00	0	-1,982,000.00	18,000.00	0	18,000.00	0
1201	ලිපි ද්‍රව්‍ය	5,000,000.00	0	1,000,000.00	6,000,000.00	5,999,871.86	128.14	100
1202	ඉන්ධන	14,200,000.00	0	-4,050,000.00	10,150,000.00	10,116,617.59	33,382.41	99.67
1203	ආහාරපාන හා නිල ඇඳුම්	150,000.00	0	-100,000.00	50,000.00	36,000.00	14,000.00	72
1205	වෙනත්	1,300,000.00	0	-170,000.00	1,130,000.00	724,366.24	405,633.76	64.1
1301	වාහන	11,000,000.00	0	0	11,000,000.00	10,874,008.17	125,991.83	98.85
1302	යන්ත්‍ර හා යන්ත්‍රෝපකර	3,300,000.00	0	-2,000,000.00	1,300,000.00	1,292,947.96	7,052.04	99.46

වැය විෂය	වැය විස්තරය	2021 ඇස්තමේන්තුව (රු)	අතිරේක ප්‍රතිපාදන (රු)	මු.රෙ. 66 මාරු කිරීම් (රු)	ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු)	2021.12.31 දිනට වියදම (රු)	ප්‍රතිපාදන ඉතිරිවීම් (රු)	ප්‍රගතිය (%)
1303	ගොඩනැගිලි හා ඉදිකිරීම්	1,200,000.00	0	-515,000.00	685,000.00	680,638.16	4,361.84	99.36
1401	ප්‍රවාහන	7,500,000.00	0	-1,438,000.00	6,062,000.00	5,959,387.87	102,612.13	98.31
1402	තැපැල් හා සන්නිවේදන	4,000,000.00	0	-1,100,000.00	2,900,000.00	2,628,382.86	271,617.14	90.63
1403	විදුලිය හා ජලය	9,000,000.00	0	-5,512,000.00	3,488,000.00	3,359,064.87	128,935.13	96.3
1404	කුලී හා දේශීය බදු	80,000,000.00	27,004,679.00	0	107,004,679.00	107,004,650.58	28.42	100
1409	වෙනත්	7,500,000.00	0	-140,000.00	7,360,000.00	7,314,521.70	45,478.30	99.38
1506	දේපල ණය පොලිය රජයේ	300,000.00	0	-100,000.00	200,000.00	142,723.34	57,276.66	71.36
1703	රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක	200,000.00	0	25,000.00	225,000.00	219,216.50	5,783.50	97.43
පුනරාවර්තන වියදම		**224,450,000.00**	**27,004,679.00**	**-14,732,000.00**	**236,722,679.00**	**233,997,889.53**	**2,727,189.47**	**98.85**
2001	ගොඩනැගිලි හා වාසුභය	500,000.00	0	0	500,000.00	0	500,000.00	0
2002	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	1,000,000.00	0	0	1,000,000.00	299,824.06	700,175.94	29.98
2003	වාහන	6,500,000.00	0	0	6,500,000.00	5,303,850.22	1,196,149.78	81.6
2102	ලී බඩු හා කාර්යාල උපකරණ	2,500,000.00	0	-40,000.00	2,460,000.00	2,275,481.00	184,519.00	92.5
2401	කාර්ය මණ්ඩල පුහුණු	1,000,000.00	0	-700,000.00	300,000.00	177,646.00	122,354.00	59.22
2106	මෘදුකාංග සංවර්ධනය			522,000.00	522,000.00	522,000.00	0	
2506-17	ESCAMP	10,000,000.00	0	0	10,000,000.00	9,797,334.43	202,665.57	97.97
2506-12	ESCAMP	990,000,000.00	518,000,000.00	0	1,508,000,000.00	1,417,557,029.00	98,050,123.43	93.49
2509	CITIES		6,545,760.00	14,950,000.00	21,495,760.00	21,495,760.00	0	100
ප්‍රාග්ධන වියදම		**1,011,500,000.00**	**524,545,760.00**	**14,732,000.00**	**1,550,777,760.00**	**1,457,428,924.71**	**100,955,987.72**	**93.98**
	මුළු එකතුව				**1,787,500,439.00**	**1,691,426,814.24**	**96,073,624.76**	**94.63**

2.2 පාලන අංශය

2021.12.31 දිනට ප්‍රගතිය

- අමාත්‍ය මණ්ඩල සංදේශ 28ක් හා අමාත්‍ය මණ්ඩල සටහන් 03 ක් මේ වන විට නිසි පරිදි සම්පූර්ණ කර අමාත්‍ය මණ්ඩල කාර්යාලයට යොමු කර ඇත. අනුමැතිය ලැබූ සංදේශ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට දෙපාර්තමේන්තු දැනුවත් කර ඇති අතර වෙනත් අමාත්‍යාංශ 16ක අමාත්‍ය මණ්ඩල සංදේශ 28ක් සඳහා නිරීක්ෂණ ලබාදී ඇත.
- පාර්ලිමේන්තු වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 28ක් සඳහා ද, පාර්ලිමේන්තු කල්තබනු ලබන අවස්ථාවේ අසනු ලබන ප්‍රශ්න 04ක් සඳහා නියමිත දිනට පෙර පිළිතුරු ලබාදී ඇත.
- තොරතුරු දැන ගැනීමේ පනතට අදාළව 2021 වර්ෂයේ ඉල්ලීම් 14 ක් ලැබී ඇති අතර ඒ සඳහා අදාළ පිළිතුරු ලබා දී ඇත.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධිත මූලික විමර්ශන, නිලධාරීන් 50ක් සඳහා වැටුප් වර්ධක ලබාදීම, නිලධාරීන් 05 දෙනෙකු සඳහා වාහන බලපත්‍ර ලබාදීම, නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධ කටයුතු, ස්ථාන මාරුවීම්, නිලධාරීන්ගේ නිවාඩු දුම්රිය බලපත්‍ර හා වාර ප්‍රවේශපත්‍ර ලබාදීමේ කටයුතු අමාත්‍යාංශයේ දුරකතන, ෆැක්ස් හා අන්තර්ජාල සම්බන්ධතා බිල්පත් ගෙවීම් ,නිලධාරීන්ට අතිකාල දීමනා ලබාදීම සම්බන්ධ කටයුතු, විනය කටයුතු සිදු කිරීම
- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම සිදුකර ඇත.
- පාලන අංශය වෙත 2021 වර්ෂයට නියමිත සියළු රාජකාරී කටයුතු ඉටුකර ඇත.

2.3 සංවර්ධන අංශය

2021.12.31 දිනට ප්‍රගතිය

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාලව ලැබුණු මහජන පැමිණිලි 100ක් පමණ සම්බන්ධව කටයුතු කිරීම සඳහා වාර්තා කැඳවීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට හා රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

- මන්නාරම දිස්ත්‍රික්කයේ යෝජිත ජලජීවී වගා කර්මාන්තපුරය ඇති කිරීම - ධීවර අමාත්‍යාංශය මගින් අදාළ ඉඩමෙහි GPS පාඨාංක සහිත වාර්තාව සංශෝධනය කර එවා ඇති අතර එම ඉඩමට ප්‍රවේශ වීමට වනජීවී අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා දෙන මෙන් දැනුම් දී ඇත. – (වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව)

- රජයේ සංවර්ධන වැඩසටහනේ එක් ව්‍යාපෘතියක් වන කාබනික පොහොර නිෂ්පාදනයට දායකවීම සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ කැටන් වැව ප්‍රදේශයේ මෙට්ට්‍රික් ටොන් 100ක් නිපදවීමේ ව්‍යාපෘතිය -
- වසරක කාලයක් සඳහා පමණක් අලින්ගේ සංක්‍රමණවලට අවහිර නොවන ස්ථිර හෝ තාවකාලික ඉදිකිරීම් සිදු නොකිරීමේ කොන්දේසිය මත අවසර ලබා දී ඇත.(වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව)

- අලිමිනිස් ගැටුම විසඳීම වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද විද්වත් කමිටුවේ කටයුතු සම්බන්ධීකරණය කරමින් කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගු කාලීන විසඳුම් යෝජනා ඇතුලත් වාර්තාවක් ඉදිරිපත් කිරීම.

- යෝජිත හම්බන්තොට වන අලි කළමනාකරණ රක්ෂිතය ප්‍රකාශයට පත් කිරීමට අදාල අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා අනුමැතිය ලබා ගැනීම.

- රාජ්‍ය දැව සංස්ථාවට අදාල කාර්ය භාර්යන් හා ප්‍රගතිය සම්බන්ධව හා අදාල ගැටළු සම්බන්ධව රාජ්‍ය දැව සංස්ථාවේ හා අමාත්‍යාංශය අතර සම්බන්ධීකරණයක් පවත්වාගෙන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා වාර පැවැත්වීම.

- වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයට අනුබද්ධිත දැව නියාමන ඒකකයක් පිහිටුවීම සම්බන්ධයෙන් රාජ්‍ය දැව සංස්ථාව ප්‍රධානව අදාල ආයතන සමඟ සාකච්ඡා පැවැත්වීම.

- ෆයිනස් දැව හා ඉරූ දැව අපනයනය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සැලසීමටත් ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කර ඉදිරිපත් කිරීම රාජ්‍ය දැව සංස්ථාව විසින් සිදු කළ යුතු බවට වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා විසින් උපදෙස් ලබා දී ඇත.

- වන සත්ත්වහා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 71 වගන්තිය සමඟ කිව යුතු, එකී ආඥා පනතේ 22 (අ) වන වගන්තිය යටතේ සකස් කරන ලද, අංක 2241/41 හා 2021 අගෝස්තු මස 19 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කළ "**2021 අංක 01 දරන වන සත්ව හා වෘක්ෂලතා (හීලෑ අලීන්ගේ ආරක්ෂාව, සුඛ සාධනය සහ ලියාපදිංචිය විධිමත් කිරීමේ) නියෝග**" 2021.09.22 දින පාර්ලිමේන්තුවේ දී යථා පරිදි සම්මත විය.

- මේවන විට හීලෑ අලි ඇතුන් පවරා දෙන මෙන් අමාත්‍යාංශය වෙත ලබා දී ඇති ඉල්ලීම් වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගාකිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.
- ඔලියෝ රේසින් නිස්සාරණය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු පයිනස් වන වගා පෞද්ගලික අංශයට බදු දීම මැයෙන් 2021.09.28 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

- විධිමත් කළුගල් කැණීම් සඳහා ඉල්ලීම් සහ පැමිණිලි 35කි. මෙම ඉල්ලීම් සහ පැමිණිලි වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගාකිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය පරිදි යොමු කරන ලදී.

- පැළ තවාන් ලියාදිංචි කිරීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල දැන්වීමක් 2021.11.08 වන දින පළ කරන ලදී. ඒ අනුව 2021.12.31 වන විට අයදුම්පත්‍ර 213ක් අමාත්‍යාංශය වෙත ලැබුණි. තවද මේ වන විට මෙම ව්‍යාපෘතියෙහි චක්‍රලේඛනය සකස් කරමින් පවතියි.

- පොළොන්නරු දිස්ත්‍රික්කයේ ගොවීන්ට හා මහජනතාව විසින් වනජීවී නිළධාරීන්ට බාධා පැමිණවීම සම්බන්ධයෙන් පත්කල අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් පත්කල කමිටුවේ වාර්තාව අමාත්‍යාංශ උපදේශක කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.(ජල ගැලුම් නිමිනය, ජාතික වනෝද්‍යානය, යක්කුරේ ආශ්‍රිත ගැටළුව)

- මතුගම රන්වලාගල ප්‍රදේශය ආශ්‍රිතව සංචාරක සංවර්ධන කලාපයක් ඇති කිරීම සම්බන්ධව සංචාරක අමාත්‍යාංශය හා එක්ව කටයුතු කිරීම.
- සංරක්ෂිත සහ රක්ෂිත වනාන්තර හැර වන සංරක්ෂණ ජනරාල්ගේ පාලනය යටතේ ඇති අවශේෂ කැලෑවලින් කැලෑ නොවන ඉඩම් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත නිදහස් කිරීම සඳහා අමාත්‍යමණ්ඩල සටහන සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී.

- පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ කරනු ලබන ප්‍රධාන ඉදිකිරීම් 2022.06.30දිනට පෙර අවසන් කිරීමට සැලසුම් කිරීම හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු වල හදුනාගත් කඩිනම් ව්‍යාපෘති අවසන් කිරීමට පියවර ගැනීම.
- දැනට කාර්යයන් අවසන් කිරීමට නොහැකි වූ ව්‍යාපෘතිවල ඉදිකිරීම් කඩිනමින් අවසන් කිරීමට පියවර ගැනීම . මේ සඳහා භාණ්ඩාගාර උපදෙස් මත අත්හිටු වන ලද සංවර්ධන ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම සඳහා අනුමැතිය ඉල්ලමින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරනු ලැබුවද අවසානයේ එම කාර්යයන් ඉදිරියට කරගෙනයාමට මුදල් අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දී ඇත.

- පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති මුළු ප්‍රතිපාදන රු. මිලියන 157ක් වන අතර එයින් දැනට රු.මිලියන 133ක් ව්‍යාපෘතිය සඳහා වියදම් කර ඇති අතර ඉතිරි මුදල වන්නේ රු.මිලියන 24 කි.මෙම ව්‍යාපෘතිය 2022 ජූනි 30 වනවිටඅවසන් කිරීමට නියමිතව ඇත.
- පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය තනතුරු 05ක් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා නව නිලධාරීන් බඳවාගෙන ඇත.

- විල්පත්තු ජාතික උද්‍යානය අවට බලපෑම් කලාපය කළමනාකරණ ව්‍යාපෘතිය GIZ ව්‍යාපෘතියේ 2 වන අදියර ක්‍රියාත්මක කිරීමට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- සංචාරක අමාත්‍යාංශය සමඟ එක්ව නානුඔය සිට නුවරඑළිය දක්වා කේබල් කාර් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

- වන සංරක්ෂණ ආඥා පනත සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- ආරණ්‍ය සේනාසන ලියාපදිංචිය සම්බන්ධයෙන් 2021.12.31 දිනට ඉල්ලීම් 70 ක් ලැබී ඇති අතර ඒවා සාරාංශ ගතකොට ලැයිස්තු ගත කර ඇති අතර අවශ්‍ය කටයුතු සඳහා බුද්ධශාසන අමාත්‍යාංශය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.ඒ අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් නව ආරණ්‍ය සේනාසන සඳහා දැනට බලපත්‍ර නිකුත් කිරීම සිදු නොකරන අතර දැනට පවත්නා ආරණ්‍ය සඳහා තත්වය සලකා බලා බලපත්‍ර නිකුත් කරන බවද දන්වා ඇත.

- ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් නවතම ව්‍යාපෘති 09ක් දියත් කිරීමට අදාළව රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එම ව්‍යාපෘති 9 ට අදාළ දීප ව්‍යාප්ත පැළ තවාන් ස්ථාපනය කිරීම ආරම්භ කිරීම හා ඊට අදාළ **හරිත ශ්‍රී ලංකා "සෑම අයෙක් එක් පැළයක්"** ජාතික වැඩසටහන නමින් අංක 02/2022 හා 2022.01.19 දිනැති චක්‍රලේඛනය නිකුත් කිරීමට අදාළ කටයුතු සිදු කිරීම.

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළ ඉඩම් සම්බන්ධ ඉල්ලීම් 76ක් අවශ්‍ය ඉදිරි කටයුතු හා වාර්තා කැඳවීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත හා වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගාකිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයවෙත යොමු කර ඇත.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළව ඉඩම් සම්බන්ධ ඉල්ලීම් 124 ක් වාර්තා කැඳවීම හා අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත හා වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගාකිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයවෙත යොමු කර ඇත.

2.4 සැලසුම් අංශය

2021.12.31 දිනට ප්‍රගතිය

- 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතනයන්හි කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් 03ක් පවත්වන ලදී.
- සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය මුදල් අමාත්‍යාංශයට යොමු කර ඇත.
- 2020 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකසා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට හා අදාල අනෙකුත් ආයතන වෙත ලබාදී ඇත.
- 2021.09.30 දිනට ප්‍රගතිය ඇතුලත් කර සකසන ලද කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තු අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කර ඇත.
- ජනාධිපති ලේකම් කාර්යාලයට, මුදල් අමාත්‍යාංශයට, ශ්‍රී ලංකා මහ බැංකුවට, අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට අවශ්‍ය තොරතුරු ලබාදී ඇත.
- " ගම සමග පිළිසඳර" ජාතික වැඩසටහන යටතේ දිස්ත්‍රික් හා දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණ කටයුතු කිරීම
- " ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ ජාතික වැඩසටහන යටතේ දෙපාර්තමේන්තුවලට අදාලව දිස්ත්‍රික්ක වල පවතින ගැටළු සම්බන්ධ තොරතුරු හා ප්‍රගතිය අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත යොමුකිරීම

2.5 ගිණුම් අංශය

2021.12.31 දිනට ප්‍රගතිය

- වාර්ෂික විසර්ජන පනතින් බලය ලැබූ වියදම්, මුදල් රෙගුලාසි, අණපනත්, චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල ව කටයුතු සිදුකර ඇත.
- විගණකාධිපතිට හා මහාභාණ්ඩාගාරයට අවශ්‍ය මාසික, ත්‍රෛමාසික, අර්ධවාර්ෂික හා වාර්ෂික වාර්තා ඉදිරිපත් කර ඇත.
- අවසාන ගිණුම් සැකසීම හා ඉදිරිපත් කිරීම සිදු කර ඇත.
- ගබඩා හා වත්කම් කළමනාකරණයට අදාළ කටයුතු සිදුකර ඇත.
- වාර්ෂික වියදම් හා ආදායම් ඇස්තමේන්තු සැකසීම සිදු කර ඇත.
- අමාත්‍යාංශයට අදාළ වැටුප්, පොදු තැන්පත් ඇතුලු සියලුම මූලධන හා පුනරාවර්ථන ගෙවීම් කටයුතු ඉටු කිරීම හා වියදම් කළමණාකරණය කිරීම සිදුකර ඇත.
- අමාත්‍යාංශයට අදාළ රාජ්‍ය ගිණුම් කාරක සභා හා රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා කටයුතු ඉටු කිරීම හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ගිණුම් කාරක සභා කටයුතු සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.
- අමාත්‍යාංශයෙහි මාසික හා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම, අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනවල වාර්ෂික ගිණුම් හා වාර්තා අධීක්ෂණය කිරීම් සිදු කර ඇත.
- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමෙන් ණය ගෙවීම, ඒවා නිසි පරිදි අය කර ගැනීම, ණය ශේෂ නිරවුල් කිරීම, ඊට අදාළ ගිණුම් පවත්වා ගැනීම හා මු.රෙ. 506 ඩී අවසන් වාර්තා සකස් කර ඇත.
- විගණකාධිපතිගේ විගණන විමසුම් සඳහා පිළිතුරු සපයා ඇත.
- වාර්ෂික මුදල් ප්‍රවාහ කටයුතු, ප්‍රධාන අග්‍රිම, අතුරු අග්‍රිම, අධීක්ෂණය හා පාලනය, ගිණුම් තැබීම හා වාර්තා කිරීම සිදු කර ඇත.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල අරමුදල් පාලන කටයුතු හා ගිණුම් කටයුතු පිළිබඳ අධීක්ෂණමය කාර්යයන් ඉටු කිරීම සහ ඒවායේ අයවැය හා වාර්ෂික ගිණුම් පිළිබඳ කටයුතු අධීක්ෂණය කර ඇත.
- වත්කම් නඩත්තු කිරීම් කටයුතු සිදුකර ඇත.

2.6 තාක්ෂණ අංශය

2021.12.31 දිනට ප්‍රගතිය

- දේශගුණික විපර්යාසයන්ට තිරසර විසඳුම් සහිත හරිත ශ්‍රී ලංකාවක් ඇති කිරීමේ ජනාධිපති කාර්ය සාධක බලකාය වෙත වනජීවී හා වන සංරක්ෂණ ක්ෂේත්‍රයන්ට අදාල ක්‍රියාකාරී වැඩසටහන් සකස් කර ඉදිරිපත් කිරීම.
- මුතුරාජවෙල තෙත්බිම් කලාපයේ සංරක්ෂණය හා තිරසර භාවිතය සම්බන්ධයෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය සහ පරිසර අමාත්‍යාංශය සමඟ ඉදිරිපත් කල ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීම හා එම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සම්පාදනය කිරීම.
- යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගයේ පිහිටා ඇති පණු කරඳ ශාකය වෙනත් ස්ථානයක රෝපණය කිරීම හෝ ආරක්ෂා කිරීම සම්බන්ධව සම්බන්ධීකරණය කිරීම.
- වන සතුන්ගෙන් සිදුවන වගා හානි අවම කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමේ කමිටුව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් වන සතුන්ගෙන් සිදුවන වගා හානි අවම කිරීම සම්බන්ධව කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන කළමනාකරණ සැලැස්මක් ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය දැව සංස්ථාවේ මූල්‍යමය තත්වයන් පිළිබඳව සොයා බැලීමට පත් කළ කමිටුව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් අදාල වාර්තාව ඉදිරිපත් කිරීම.
- තර්ජනයට ලක් වූ වනජීවී විශේෂයන්ගේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතිය (CITES) ශ්‍රී ලංකාව තුළ බලාත්මක කිරීම හා විධිමත් කිරීම සඳහා වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත සංශෝධනය කිරීම සම්බන්ධව අදාල ආයතන සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- 2019 වර්ෂයේ මැයි මස පැවැත්වීමට නියමිතව තිබූ වඳ වී යාමේ තර්ජනයට මුහුණපා ඇති සත්ත්ව හා ශාක විශේෂ සම්බන්ධ අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතියේ (CITES) පාර්ශවකරුවන්ගේ 18 වන සමුළුවට අදාලව ආරම්භ කරන ලද සියළුම ලිපිගොනුවල කාර්යයන් සහ ගෙවීම් කටයුතු අවසන් කිරීම.
- ශ්‍රී ලංකාව වටා වූ මුහුදු තීරයේ ඇති කොරල් පද්ධතිය සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතියට අදාලව නීතිපති දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද ලිපියෙහි අඩංගු යෝජනා අනුව අවබෝධතා ගිවිසුම සංශෝධනය කිරීම සඳහා විදේශ අමාත්‍යාංශය වෙත යොමු කිරීම.
- වනදිවිය අතිරේකය සඳහා ලිපි ලබා ගැනීමේ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු වලට අමතරව අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් ද ලබා ගැනීමට කටයුතු කිරීම සහ වනදිවිය අතිරේකයේ අන්තර්ගත විෂය කරුණුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා යෝජනා ලබා ගැනීමට කටයුතු කිරීම සහ එම සඟරාව සෑම මසකම දිනමිණ පුවත්පත සමඟ පල කිරීමට කටයුතු කිරීම.
- ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසර භාවිතය යටතේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ආනවිලුන්දාව රැමිසා තෙත් බිම් ආශ්‍රිතව නැවත කඩොලාන වගා කිරීමේ නියමු ව්‍යාපෘතිය සඳහා සහය ලබාදීම.
- ජාතික සංචාරක ප්‍රතිපත්තිය (National Tourism Policy) සකස් කිරීමට අදාලව සංචාරක අමාත්‍යාංශය මගින් පත් කළ අන්තර් අමාත්‍යාංශ කමිටුව සමඟ එක්ව කටයුතු කිරීම.
- පරිසර අමාත්‍යාංශය මගින් පිහිටුවා ඇති තිරසර පරිසර කළමනාකරණය පිණිස අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව වෙත අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාලව කරුණු ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- එක්සත් ජාතීන්ගේ වනාන්තර පිළිබඳ 16 වැනි සමුළු සැසියට (16th of United Nations Forum on

- නැවත වන වගා කටයුතු සඳහා South – South Cooperation වැඩසටහන යටතේ අරමුදල් ලබා ගැනීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කර අදාල ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක "ජෛව පද්ධති සංරක්ෂණය සහ කළමනාකරණ " (Eco system conservation and Management Project) ව්‍යාපෘතියේ කටයුතු සඳහා සහය වීම.
- අමාත්‍යාංශීය උපදේශක කාරක සභා රැස්වීම් මගින් ලබා දෙනු ලබන උපදෙස් අනුව අදාල විමර්ශණ වාර්තා ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකාව තුළ GSP+ සහනය ක්‍රියාත්මක කිරීම සඳහා වූ බැඳීම් සම්බන්ධව අදාල ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- ශ්‍රී ලංකාව තුළ GSP+ සහනය ක්‍රියාත්මක කිරීම පහසු කරවීම පිණිස මෙරට CITES සම්මුතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අදාල නියෝග මාලාව ප්‍රකාශයට පත් කිරීමට වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත සංශෝධනය කිරීම සම්බන්ධව අදාල ආයතන සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය මඟින් සංවිධානය කල වනාන්තර ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම පිළිබඳව කන්දකාඩු, නවසේනපුර, වව්නියා ප්‍රදේශ වල ස්ථාපිත පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි විශේෂ දේශන පැවැත්වීම.
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක පුරවැසියන්ගේ දායකත්වයෙන් නීති විරෝධී පාරිසරික ක්‍රියා පිළිබඳව තොරතුරු ලබා ගැනීමට ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් යෙදුමක් සකස් කිරීම සඳහා වූ ව්‍යාපෘතියේ කටයුතු සිදු කිරීම.
- 2022 අයවැය යෝජනා මඟින් ක්‍රියාත්මක හරිත ශ්‍රී ලංකා ජාතික වැඩසටහනට අදාල කටයුතු සංවර්ධන අංශය හා එක්ව සම්බන්ධීකරණය කිරීම.
- දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම යටතේ යාවත්කාලීන කරන ලද ජාතිකව නිර්ණය කළ දායකත්ව වැඩසටහනට අදාලව ජෛව විවිධත්ව අංශය සහ වනාන්තර අංශය සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම.

2.7 ව්‍යාපෘති අංශය

2021.12.31 දිනට ප්‍රගතිය

- අමාත්‍යාංශ මාධ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම/ ජනමාධ්‍යවල පළ වන තොරතුරු සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු අදාළ ආයතන වෙතින් ලබා ගෙන අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කිරීම
- අවශ්‍ය අවස්ථාවන්හි මාධ්‍ය සාකච්ඡාවන් කැඳවා තොරතුරු නිවැරදි කිරීම
- මහජන පැමිණිලි හා අමාත්‍යතුමා වෙතින් ලැබෙන ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම
- වන සංරක්ෂණ හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු විසින් එවනු ලබන වාර්තා සම්බන්ධව කටුයුතු කිරීම
- අමාත්‍යාංශ වෙබ් අඩවිය සැකසීම සඳහා දායක වීම
- වෙබ් අඩවිය සඳහා විශේෂ පුවත් ලබාදීම
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මුහුණ දෙන තර්ජනාත්මක අවස්ථා අලලා කෙටි කථාවක් සකස් කර ඒ සමඟ වන උද්‍යාන පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් භාෂා ත්‍රිත්වයෙන් වෙබ්

2.8 අභ්‍යන්තර විගණන අංශය

2021.12.31 දිනට ප්‍රගතිය

- 2020 වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා හා 2021 වර්ෂයේ ජනවාරි සිට ජුලි දක්වා වවුචර් පරීක්ෂා කිරීම
- ලුණුගම් වෙහෙර ජාතික උද්‍යානයට අයත් වැව් ප්‍රතිසංස්කරණය කිරීමට අදාල විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකිරීම
- වැල්ලවාය මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග ව නඩු අංක බී/ආර්/220606/19 නඩුව සසඳහා අගනියක් වන පරිදි නීති විරෝධී කටයුත්තක් සිදුකර ඇත්දැයි පරීක්ෂා කිරීම
- යාල වනෝද්‍යානයේ සිදුකරනු ලැබූ මූල්‍ය වංචාවන් පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකිරීම සම්බන්ධනේ යාල ජාතික වනෝද්‍යානයේ සේවක පිරිසක් විසින් ඉදිරිපත් කල පැමිණිල්ල පිළිබඳ පරීක්ෂණ සිදුකිරීම
- රාජ්‍ය දැව සංස්ථාවේ 2021 අප්‍රේල් මස සිට අගෝස්තු දක්වා අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වාර්තා සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂණය
- රාජ්‍ය දැව සංස්ථාවේ 2021 වර්ෂයේ වෛද්‍ය රක්ෂණ ටෙන්ඩරය කැඳවීම සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂණය
- අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලන කටයුතු පරීක්ෂාව
- භාණ්ඩ සමීක්ෂණ කටයුතු, බැංකු සැසඳුම් පත්‍ර සකස් කිරීම හා අත්තිකාරම් බී ගිණුම් කටයුතු පිළිබඳව පරීක්ෂාව
- 2021 වර්ෂයේ පළමු හා දෙවන කාර්තුවලට අදාල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2021.08.03 දින පවත්වන ලද අතර තෙවන කාර්තුවට අදාල විගණන හා කළමනාකරණ රැස්වීම 2021.11.12 දින පවත්වන ලදී.
- පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය මගින් ජීවනෝපායන් වැඩිදියුණු කිරීම සඳහා ස්වභාවික සම්පත් තිරසර ලෙස භාවිතා කිරීම යටතේ උඩවලව ජාතික උද්‍යානයට මායිම්ව පිහිටි ගම්මාන ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන ප්‍රජාමූල සංවර්ධන වැඩසටහන් පරීක්ෂා කිරීම

2.9 අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කර ඇති ප්‍රධාන අමාත්‍ය මණ්ඩල සංදේශ

- අලි- මිනිස් ගැටුම විසඳීම සඳහා ඉදි කර ඇති විදුලි වැටවල් නඩත්තු කිරීම හා පසු විපරම් කාර්යය සහා සිංගල් කැබ් රථ 50 (පනහක්) මිල දී ගැනීම සඳහා වන යෝජනාව
- වන අලි- මිනිස් ගැටුම පාලනය කිරීම කිරීම සඳහා දීප ව්‍යාප්ත විදුලි වැට ඉදි කිරීම

- වඳවී යෑමේ තර්ජනයට ලක් ව සිටින වන සත්ව හා වෘක්ෂ ලතා විශේෂ සම්බන්ධව අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතියේ පාර්ශවකරුවන්ගේ 18 වන සමුළුවෙහි සත්කාරකත්වය දැරීම. ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිතව තිබූ පාර්ශවකරුවන්ගේ 18 වන සමුළු රැස්වීමේ කටයුතු නිමාවට පත් කිරීම.

- වන අලි වන්දි ක්‍රමය යටතේ ගෙවනු ලබන වන්දි මුදල සංශෝධනය කිරීම

- වෙඩිතලතිව් ස්වභාව රක්ෂිතයේ මායිම් සංශෝධනය කර නැවත ප්‍රකාශයට පත් කිරීම

- (469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආරක්ෂක ආඥා පනතේ 71 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 22(අ) වන වගන්තිය යටතේ සාදන ලද හීලෑ අලින්ගේ ආරක්ෂාව සහ ලියාපදිංචිය විධිමත් කිරීමේ නියෝග

- තර්ජනයට ලක් වූ වනජීවී විශේෂයන්ගේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතිය (Convention on international trading endandge spices fauna and floral (CITES) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමේ කළමනාකරණ අධිකාරිය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වන විට එම සම්මුතිය හා අදාළ ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාව තුළ බලාත්මක කිරීම හා විධිමත් කිරීම සඳහා වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත සංශෝධනය කිරීම

- ඔලියෝ නිස්සාරණය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු පයිනස් වන වගා පෞද්ගලික අංශයට බදු දීම

- මාදම්පාවිල අභයභූමිය තුළ පිහිටි හෙක්ටයාර් 15.5 ක භූමිය ඉවත් කර මායිම් නැවත ප්‍රකාශයට පත් කිරීම

- අම්පාර අභයභූමිය තුළ පිහිටි හෙක්ටයාර් 46.18ක භූමිය ඉවත් කර නව මායිම් නැවත ප්‍රකාශයට පත් කිරීම

- ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය යාල කලාප අංක vi ලෙස ප්‍රකාශයට පත් කිරීම

2.10 රාජ්‍ය දැව සංස්ථාව 2021.12.31 දිනට ප්‍රගති සාරාංශය

ආයතනය	මූලධන			පුනරාවර්තන		
	ප්‍රතිපාදන (රු .මී)	සත්‍ය වියදම (රු .මී)	වියදම (%)	ප්‍රතිපාදන (රු .මී)	සත්‍ය වියදම (රු .මී)	(%)
රාජ්‍ය දැව සංස්ථාව	793.04	126.54	16	4,510.60	3,965.98	87
එකතුව	793.04	126.54	16	4,510.60	3,965.98	87

2.10.1 රාජ්‍ය දැව සංස්ථාවේ වැඩසටහන් අනුව 2021.12.31 දිනට ප්‍රගතිය

අනු අංකය	ක්‍රියාකාරකම	ඇස්තමේන්තුගත මුදල (රු.මී)	වියදම් (රු.මී)	භෞතික ප්‍රගතිය (%)
1	ඉඩම්		32.60	
2	ස්ථාවරගොඩනැගිලි	113.10	9.31	43
3	අර්ධස්ථාවර ගොඩනැගිලි	9.00	9.37	45
4	ඉඩම්සංර්ධනය	14.70	6.00	76
5	මහාමාර්ග හා දුම්රිය මාර්ග (ඩිපෝවලට යාම සඳහා මාර්ග ඉදිකිරීම)	3.50	3.05	100
6	වාහන මිලදීගැනීම්	270.80	0.76	30
7	යන්ත්‍රෝපකරණමිලදී ගැනීම්	348.97	45.84	30
8	විදුලිඋපකරණ මිලදී ගැනීම්	4.94	1.15	40
9	කාර්යාල උපකරණ හා පරිගණකමිලදී ගැනීම්	22.13	17.24	40
10	වෙනත්වත්කම් මිලදී ගැනීම්	4.90	0.64	30
11	උපකරණමිලදී ගැනීම්	1.00	0.58	30
	එකතුව	**793.04**	**126.54**	

2.10.2 රාජ්‍ය දැව සංස්ථාවේ නිෂ්පාදන හා ආදායම් ප්‍රගතිය 2021.12.31 දිනට

ප්‍රධාන සංරචකය	වාර්ෂික ඉලක්කය	2021.12.31 දිනට	
		ඉලක්කය	ප්‍රගතිය
කඳන්(ඝ.මී)	103,813	103,813	127,698
සිල්පර (ඒකකය)	40,000	40,000	29,049
ගෘහ භාණ්ඩ (රු.මි)	662	662	389
විදුලි කණු (ඒකක)	4,500	4,500	2,624
ඉරුදැව (ඝ.මී)	7,971	7,971	3,924
වටකණු (ඒකක)	17,470	17,470	97,846
වැටකණු(ඒකක)	41,810	41,810	151,893
අලිවැටකණු (ඒකක)	29,000	29,000	11,913
දර (ඝ.මී)	42,155	42,155	86,971

2.10.3 අලෙවි ආදායම 2021.12.31 දිනට

අනු අංකය	ප්‍රධාන සංරචකය	2021 වාර්ෂික අලෙවි ඉලක්කය (රු.මි)	2021.12.31 දිනට අලෙවි ප්‍රගතිය	
			ඉලක්කය (රු.මි)	ප්‍රගතිය (රු.මි)
1	කඳුන්	3,499.0	3,499.0	4,929.0
2	සිල්පර	392.0	392.0	302.0
3	ගෘහ භාණ්ඩ	841.0	841.0	393.0
4	විදුලි කණු	41.0	41.0	30.0
5	ඉරුදැව	764.0	764.0	309.0
6	වටකණු	3.0	3.0	12.0
7	වැටකණු	8.0	8.0	22.0
8	අලිවැට කණු	132.0	132.0	104.0
9	දර	22.0	22.0	52.0
	මුළු එකතුව	**5,702.0**	**5,702.0**	**6,153.0**

2.11 රාජ්‍ය දැව සංස්ථාව

දැව සංස්ථාව යටතේ ඇති ප්‍රධාන අංශ

2.11.1 නිෂ්පාදන හා ඉංජිනේරු අංශය

නිෂ්පාදන හා ඉංජිනේරු අංශය ප්‍රධාන වශයෙන් අංශ දෙකකින් සමන්විත වන අතර රාජ්‍ය දැව සංස්ථාවේ මෙහෙවර හා අරමුණු ඉටු කිරීමේ දී පහත සඳහන් කාර්යභාරය ඉටු කරනු ලැබේ.

ගෘහ භාණ්ඩ නිෂ්පාදන කටයුතු

රාජ්‍ය හා පුද්ගලික අංශ සඳහා අවශ්‍ය උසස් තත්වයේ හා මනා නිමාවකින් යුතු ගෘහ භාණ්ඩ හා දැව නිර්මාණ නිෂ්පාදනය කිරීම . බූස්ස,අම්පාර, කල්දෙමුල්ල නිෂ්පාදනාගාර 3හිද පල්ලේකැලේ ප්‍රාදේශීකයෙහිද මගින්ද සිදුකරනු ලැබේ.

ඉංජිනේරු අංශයේ කටයුතු

- රාජ්‍ය දැව සංස්ථාවේ සිදු කරනු ලබන සියලු ඉදිකිරීම් හා අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය සිවිල් ඉංජිනේරු සහය ලබා දීම හා අදාල කටයුතු සිදුකර ඇත.
- නවීන තාක්ෂණයෙන් යුතු යන්ත්‍රෝපකරණ හා රථ වාහන මිල දී ගැනීම් සඳහා අවශ්‍ය වන තාක්ෂණික පිරිවිතර ලබා දීම හා තාක්ෂණික ඇගයීම් කටයුතු සිදුකර ඇත.
- සියලු යන්ත්‍රෝපකරණ හා රථ වාහන නඩත්තු කිරීම් හා අලුත්වැඩියා සිදුකර ඇත.
- ඉරුම්හල් හා අනෙකුත් යන්ත්‍රාගාර නඩත්තු කිරීම් හා අලුත්වැඩියා කටයුතු සිදුකර ඇත.

2.11.2පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය

රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය මගින් සියළුම දැව සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම, විශ්ව විද්‍යාල සිසුන් සමඟ එක්ව පර්යේෂණ දැනුම ව්‍යාප්ත කිරීම, දැව වර්ග හඳුනාගැනීම, දැව සහතික නිකුත් කිරීම, පුහුණු පාඨමාලා පැවැත්වීම්, බාහිර ආයතන වලින් පවත්වන වැඩමුළු හා විදේශ ශිෂ්‍යත්ව වලට සේවකයන් යොමුකිරීම සිදුකරයි. තවද පැලතවාන් කළමණාකරණය, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ එක්ව පාරිසරික වැඩසටහන් සඳහා නොමිලේ පැල නිකුත් කිරීම, ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාරවල ISO ජාත්‍යන්තර තත්ත්ව සහතිකකරණය ක්‍රියාවට නැංවීම, ප්‍රචාරක වැඩසටහන් තුළින් මහජනතාවගේ දැව සම්බන්ධ දැනුම යාවත්කාලීන සහ පුළුල් කිරීම, දැව සම්බන්ධ පර්යේෂණ ප්‍රකාශන, ලිපි, සඟරා, පොත්, අත්පත්‍රිකා ආදිය මුද්‍රණය සහ බෙදාහැරීම, ගුරුභවතුන් දැනුවත් කරමින් පාසල් විෂය නිර්දේශය හරහා අනාගත පරපුර වෙත දැව සම්බන්ධ දැනුම ලබාදීම මෙන්ම ජගත් පරිසර දින වැඩමුළුවලට සමගාමීව වත්මන් රජයේ සෞභාග්‍යයේ දැක්ම යටතේ ක්‍රියාත්මක කිරීමට විවිධ ක්‍රියාකාරකම් සංවිධානය සහ ඒවා මෙහෙයවීම

- පැල තවාන් මඟින් නොමිලේ පැල බෙදා දීම පිළිබඳ තොරතුරු

තවද රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රාදේශීක 14හරහා පැල තවාන් 25ක් නඩත්තු කෙරෙන අතර ඒවායේ දැවමය වටිනාකමින් යුත් පැල නිෂ්පාදනය කෙරේ. මෙම පැල විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත නොමිලේ නිකුත් කිරීමේ ද පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය මගින් සිදු කෙරේ.

ඒ දින



අනුව 2021.12.31 වන විට පැල 31268 පමණ නිකුත් කර ඇත.



2.11.3 අළෙවි අංශය

රාජ්‍ය දැව සංස්ථාවේ අලෙවිකරණ අංශය මගින් සංස්ථාවේ ව්‍යාපාර හා මෙහෙවර ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සාමූහික ලෙස පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් මෙම අංශය මගින් සිදු කෙරේ.

- පාරිභෝගික මිලදී ගැනීමේ රටාවන් පර්යේෂණය හා වෙළඳපොල අළෙවි රටාවන් නිරීක්ෂණය කිරීම මගින් අළෙවිය සඳහා ඉදිරිපත් කල යුතු නිෂ්පාදනයන් තීරණය කිරීම
- වෙළඳ පොළ තරගකාරිත්වයට මුහුණ දීමට නවීන ගෘහභාණ්ඩ නිෂ්පාදනයන් සිදු කිරීම
- රාජ්‍ය දැව සංස්ථාවේ නිෂ්පාදනයන් පිළිබඳ පාරිභෝගික දැනුවත් කිරීම් අලෙවිකරන වැඩසටහන් අළෙවි අංශය මගින් සිදු කිරීම.
- 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ රු.මිලියන 1850 ක ආදායමක් ඉපැයීම.
- පයිනස් දැව භාවිතයෙන් අලෙවි අංශය නවීකරණය කිරීම.

2.11. 4 ගිණුම් අංශය

රාජ්‍ය දැව සංස්ථාවේ ගිණුම් අංශයේ ප්‍රමුඛතම කාර්යභාරය වන්නේ නිසි පරිදි ගිණුම් සම්බන්ධ පොත්පත් පවත්වා ගනිමින් ආයතනයට ලැබෙන මුදල් හා පිටව යන මුදල් පිළිබඳ නිසි ක්‍රමවේදයක් ඇතිව ආයතනයේ මූල්‍ය පාලනය පවත්වාගෙන යෑම හා වර්ෂාවසාන ගිණුම් ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කිරීම සහ අයවැය සකස් කර ඉදිරිපත් කිරීම වේ.

2.11.5 මානව සම්පත් කළමනාකරණ අංශය

සංස්ථාවේ සාර්ථකත්වයට උපරිම දායකත්වය ලබා දෙන සුදුසු සහ තෘප්තිමත් සේවක බලකායක් ජනනය කිරීම හා රඳවා ගැනීම මෙම අංශයේ ප්‍රධාන අරමුණු වන අතර මානව සම්පත් සැලසුම් කිරීම, මණ්ඩලිකරණය ,මානව සම්පත් සංවර්ධනය ,ප්‍රතිලාභ කළමනාකරණය සහ සේවක හා කම්කරු සබඳතා පවත්වා ගෙන යාම මානව සම්පත් කළමනාකරණ අංශයේ ප්‍රධාන කාර්යයන් වේ. මෙම අංශය පාලන ,නීති ආරක්ෂක ,ප්‍රවාහන යන උප අංශයන්ගෙන් සමන්විතය.

2.11.6 මෙහෙයුම් අංශය

ගෝලීය කොවිඩ් වසංගතය උග්‍රව පැවති 2021 වර්ෂයේ රට පුරා මාස 3කට අධික කාලයක් සංචරණ සීමා පණවා තිබූ අතර, මෙහෙයුම් අංශය විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පූර්ණ හෙලීම් යටතේ නිදහස් කර තිබූ හෙක්ටයාර් 1200කට වඩා කාර්මික වනවගාවල අස්වනු නෙලීම සඳහා අධියර 4කින් ප්‍රසම්පාදන ලංසු කැඳවා රාජ්‍ය දැව සංස්ථාව වෙත වාර්තාගත ලෙස ඝණ මීටර 127,698ක දැව අස්වැන්නක් 2021 වර්ෂය සඳහා නිෂ්පාදනය කිරීමට හැකි විය.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නිදහස් කරන ලද වන වගා හා වනජීවී දෙපාර්තමේන්තුව විසින් මුදා හරින ලද වනාන්තර වලින් විද්‍යාත්මකව දැව නිස්සාරණය කිරීම

- දැව වෙළඳපොළට අවශ්‍ය කඳන්, දුම්රිය දෙපාර්තමේන්තුවට අවශ්‍ය සිල්පර, ලංකා විදුලි බල මණ්ඩලයට අවශ්‍ය විදුලි සම්ප්‍රේෂණ කණු සහ වනජීවී දෙපාර්තමේන්තුවට අවශ්‍ය අලිවැට කණු මෙන්ම පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සඳහා ඉරු දැව නිෂ්පාදනය කිරීම.

- වතු සමාගම් වලින් සහ අනෙකුත් පෞද්ගලික ඉඩම්වලින් වාණිජමය වශයෙන් වටිනා ගස් මිලදී ගැනීම

- රාජ්‍ය ආයතන වලින් අනතුරුදායක පදනම යටතේ ලබා දෙන පරිත්‍යාග හා අධිකරණය මගින් ලබාගනු ලබන වන අපරාධ සම්බන්ධ දැව ලබා ගැනීම.

- අලුතෙන් වනාන්තර ඇති කිරීම හා ප්‍රතිවනරෝපණ කටයුතු සඳහා සක්‍රියව දායක වීම.

- පරිරක්ෂිත සිල්පර නැවත ප්‍රති අපනයනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

2.11.7 මිලදී ගැනීම් හා නාවික අංශය
ප්‍රාග්ධන මිලදී ගැනීම්

2021 වර්ෂය තුලදී මිලදී ගැනීම් හා නාවික අංශය මගින් සිදු කරන ලද ප්‍රාග්ධන මිලදී ගැනීම් පහත පරිදි වේ.

අයිතමය	ප්‍රමාණය	වියදම (රු.)
High Reach Log Loader	1	27,930,000
Tennor Machine – Boossa FF	1	4,060,000
Clamp Carrier	1	4,524,100
Tennor Machine – K'mulla FF	1	4,060,000
Multimedia Projector	1	156,000
Air Conditioner	1	100,000
Air Conditioner System	1	600,000
Finger Scan Machine With 30 Hours Ups	8	381,750
Network Hardware & Installation	1	276,050
Printer Dot Matrix (Narrow Carriage)	10	395,000
Pallet Truck	1	555,740
Wet dust tank	1	538,630
මුළු වියදම		**43,577,270**

2021 ප්‍රාග්ධන අයවැය සඳහා භාණ්ඩාගාර අනුමැතිය 2021.10.04 දින ලැබීමෙන් අනතුරුව ආරම්භ කරන ලද ප්‍රසම්පාදනයන්හි ප්‍රගතිය 2021.12.31 දිනට පහත පරිදි දැක්විය හැකිය.

	අවලංගු කරන ලද මිලදී ගැනීම්	සම්පූර්ණ කරන ලද මිලදී ගැනීම්	පත්කරන ලද ලංසු ඇගයීම් කමිටු	නියමිත පිරිවිතර	සම්පූර්ණ කරන ලද ලංසු	ප්‍රසම්පාදන කමිටුව අනුමත කරනලද ප්‍රමාණය	ලබාදීමට නියමිත
වාහන	3	0	6	6			
යන්ත්‍රෝපකරණ	2	4	45	45	15	15	
විදුලි උපකරණ	4	3	3	3	2		
පරිගණක උපාංග		2					4
මෙවලම් හා උපකරණ		1	1	1			
විවිධ	1	1	2	2			

- **පාරිභෝගික ද්‍රව්‍ය මිල දී ගැනීම්**

ඉහත මිලදී ගැනීම් හා නාවික අංශය මගින් එදිනෙදා අවශ්‍ය ලිපිද්‍රව්‍ය හා අනෙකුත් දෑ (ටෝනර් ,)ටයර් හා වාහන අමතර කොටස්,යන්ත්‍රෝපකරණ අමතර කොටස් ,නිල ඇඳුම් හා අනෙකුත් උපාංග ,ආරක්ෂක උපකරණ විශේෂයෙන් විෂබීජ නාශක දියර,හා මුඛ ආවරණ යනාදිය සඳහා සිදුකරන ලද වියදම් හි මුළු වටිනාකම රු 11,121,942,326.08 ක් වනු ඇත.

- **සුළුමුදල් මිල දී ගැනීම්**

මීට අමතරව සුළුමුදල් මගින් දරන ලද මුළු වියදම රු. 251,694.77 ක් පමණ වනු ඇත.

- **ආනයන මගින් මිලදී ගැනීම්**

තහඩු ඇන මිලදී ගැනීම් (100mm x 225mm -60,000Nos. - රු.10,967,659.22

ක්‍රියෝසොට් තෙල් ලීටර 160,000ක් මිල දී ගැනීම සඳහා මූලික ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක වෙමින් පැවතුනි.

2.11. 8 තොරතුරු තාක්ෂණ අංශය

අනු අංකය	පද්ධතිය	2021 ඉලක්කය	2021 සපුරාගැනීම
1	කෙටි පණිවිඩ පදනම් කරගත් කොන්ත්‍රාත්කරුවන්ගේ තොරතුරු කළමණාකරනපද්ධතිය	100%	100%
2	විවෘතමූලාශ්‍රයන් වෙත මාරුවීම	80%	80%
3	දෛනිකඅලෙවි තොරතුරු කළමණාකරණ පද්ධතිය	100%	100%
4	ලේඛණකළමණාකාර පද්ධතිය	80%	95%
5	ණයට විකුණුම් කළමණාකාරණ පද්ධතිය	100%	100%
6	ඔන්ලයින් භාණ්ඩ ලේඛන පාලන පද්ධතිය	70%	70%
7	ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීම් පද්ධතිය (ERP) ප්‍රදර්ශනාගාර පද්ධතිය	95%	100%
8	ව්‍යවසායසම්පත් සැලසුම් කිරීම් පද්ධතිය (ERP)-පිරිවැය සැකසුම් පද්ධතිය	95%	98%
9	ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීමේ පද්ධතිය (ERP) - කර්මාන්ත ශාලා කළමණාකරන පද්ධතිය	85%	85%
10	වන වගා තොරතුරු කළමණාකාරණ පද්ධතිය	100%	100%
11	ඉරූ දැවතොග කළමණාකරණ පද්ධතිය	80%	80%
12	මාර්ගගත ගෙවීම් පද්ධතිය	100%	100%
13	ප්‍රධානකාර්යාලය තුළ මධ්‍යම ජාල පද්ධතිය ස්ථාපනය කිරීම	50%	25%
14	RFID මතපදනම් වූ කඳන් හඳුනාගැනීමේ පද්ධතිය	25%	10%

2.12 දැව සම්බන්ධ පරීක්ෂණ ප්‍රගතිය - 2021.12.31

රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ, සංවර්ධන හා පුහුණු අංශය ආයතනයේ වාණිජ අවශ්‍යතා අනුව මෙන්ම සමාජයට අවශ්‍ය නව දැනුම හා දැව හා ඒ සම්බන්ධයෙන් පැන නගින ගැටළු වලට පිළියම් යෙදීමේ අරමුණෙන් පර්යේෂණ සිදු කරනු ලබන අතර ඒවා පර්යේෂණ පත්‍රිකා, පර්යේෂණ සම්මන්ත්‍රණ, පොත්, සඟරා ලිපි ආදිය මඟින් පල කරනු ලැබේ. එසේ පල කරන ලද පර්යේෂණ හා 2021 වර්ෂයේ ආරම්භ කර ඇති පර්යේෂණ තොරතුරු පහත දැක්වේ.

Published Research papers
Journal papers

C. K. Muthumala, Sudhira De Silva, P.L. A. G. Alwis, and K. K. I. U. Arunakumara 2021.Failure Modes and Compression Strength of Seven Finger-Jointed Wood Species from Sri Lanka*, J Fail.Anal.andPreven*. https://doi.org/10.1007/s11668-021-01274-9 springer journal

Muthumala, C.K., De Silva, S., Alwis, P.L.A.G. and Arunakumara, K.K.I.U. 2021. Identification of the best finger joint configuration for Sri Lankan wood species based on the flexural strength. *J Indian Acad Wood Sci* (2021). https://doi.org/10.1007/s13196-021-00284-2.springer journal

Muthumala, C.K., Arunakumara, K.K.I.U., De Silva, Sudhira. andAlwis, P.L.A.G. 2021. Assessment of finger-joint efficiencies in Sri Lankan timber species, *The Sri Lanka Forester*, Forest Department, Sri Lanka.Vol. 40, 2021 pp.57 – 70.

Muthumala, C.K., Arunakumara, K.K.I.U., De Silva, Sudhira. andAlwis, P.L.A.G. 2021. Investigation of the strength parameters and physical properties timber species in Sri Lanka , *The Sri Lanka Forester*, Forest Department, Sri Lanka. Vol. 40, 2021 pp.57 – 70.

Muthumala, C.K., De Silva Sudhira., Arunakumara K.K.I.U. and Alwis P.L.A.G. 2021.Evaluation of the failure modes of the finger-jointed timber species for utilization of waste timber.*International Conference On Innovations in Energy Engineering & Cleaner Production, 2021*, San Francisco, CA – USA.

W.V. TharinduAmarasinghe, Toru Terada and Hirokazu Yamamoto (2021). Enhancing the carbon sequestration of high-elevation Eucalyptus plantations in Sri Lanka for future carbon market activities. Journal of Forest Research, 26(1):1-7. DOI: 10.1080/13416979.2021.1927501

Abstract papers in symposia and conferences

C.K. Muthumala. 2021. Identification of Jack (*Artocarpusheterophyllus*) and Bedidel (*Artocarpusnobilis*) timber species using anatomical features , International Symposium on Agriculture and Environment 2021 University of Ruhuna, Sri Lanka, p.84.
Muthumala, C.K., De Silva Sudhira.,Arunakumara K.K.I.U. and Alwis P.L.A.G. 2021. Assessment of the mix timber combination effect of finger –jointed timber species using flexural and tensile strength, International Conference on Structural Engineering and Construction Management, Kandy, Sri Lanka.

Amarasinghe W.V.T.D. and Muthumala C.K. (2021). Assessment of the Wastage in the Sawmilling Industry of Sri Lanka, a Case Study of STC Sawmills. International Conference on Environmental Good Governance, Colombo, Sri Lanka

Balasooriya L.S., Amarasinghe W.V.T.D., Weerakkody J. and Muthumala C.K. (2021). A New Bucking Approach to Improve Teak (*Tectonagrandis*) Grading: A Case Study InKurunegala District. Open University Research Sessions 2021 (OURS 2020).

Jinadari W.M., Weerakkody J, Amarasinghe W.V.T.D. and Muthumala C.K. (2021).Above Ground Carbon Stock Estimation of Intermediate Zone Teak (*Tectonagrandis*) Grown in Sri Lanka.Open University Research Sessions 2021 (OURS 2020).

Book Chapters

Muthumala, C.K., Amarasinghe W.V.T.D. and Mudalige T.S. (2021).Assessment of Wood Properties in Lesser-Known *Shorea*spp.in Sri Lanka. ICSBE 2020 - Lecture Notes in Civil Engineering Chapter: Sustainable Material and Manufacturing Publisher: Springer Nature Singapore PteLtd.DOI: 10.1007/978-981-16-4412-2_36

2.13 දැව හඳුනා ගැනීම පිළිබඳ ප්‍රගතිය

රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය මගින් දැව හඳුනාගැනීම සඳහා නවීන තාක්ෂණය යොදාගනිමින් දැව වල අභ්‍යන්තර පටක කොටස් පරීක්ෂා කොට ඒවායේපටක ව්‍යුහාත්මක කෙරෙන විශ්ලේශණ මඟින්දැව හඳුනා ගැනීම සිදුකෙරේ. වසරකට දැව හඳුනා ගැනීමේ සහතික පත්‍ර හා අනෙකුත් වාර්තා 150 – 200 ක් අතර ප්‍රමාණයක් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට මේ යටතේ නිකුත් කිරීම සිදු කරනු ලැබේ. දැව හඳුනාගැනීමට අමතරව දැවවල ශක්ති ගුණාංග විශ්ලේශණය සඳහාවන MOR, MOE, Compression test, Density tests, Tension tests ආදියදකල්පැවත්ම හා පරිරක්ෂණය සම්බන්ධ Boron Test, CCB Test ආදිපරීක්ෂණ කටයුතුද සිදුකෙරේ.

ඒ අනුව 2021 වර්ෂය සඳහා පහත දැක්වෙන වාර්තා නිකුත් කර ඇත.

වාර්තා	නිකුත් කර ඇති වාර්තා ගණන
දැව හඳුනාගැනීම (පරීක්ෂාකරන ලද සාම්පල් ගණන)	205
දැව හඳුනාගැනීම (නිකුත් කර ඇති වාර්තා)	96
තෙතමන පරීක්ෂාව	30
ඝණත්ව පරීක්ෂාව	16
බෝරෝන් පරීක්ෂාව	12
CCB පරීක්ෂාව	05
දැව වල ශක්ති පරීක්ෂා	13
අනෙකුත් දැව වාර්තා (බාහිර ආයතන වෙත ගොස් සිදුකරන ලද)	21
මුළු වාර්තා ගණන	**193**

2.14 රාජ්‍ය දැව සංස්ථාවේ ගෘහ භාණ්ඩ සඳහා ISO ප්‍රමිතිකරණය

රාජ්‍ය දැව සංස්ථාවේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය වඩාත් කාර්යක්ෂම කිරීම හා පාරිභෝගික විශ්වාසය වැඩි දියුණු කිරීම සඳහා ISO 9001:2015 ප්‍රමිති සහතිකය ලබා ගැනීමේ වැඩපිලිවෙල පර්යේෂණ සංවිධන හා පුහුණු අංශයේ මුලිකත්වයෙන් ආරම්භ කර ඇත. ඒ අනුව පළමු අදියරේදී බුස්ස ගෘහ භාණ්ඩ නිෂ්පාදනාගාරයට ප්‍රමිති සහතිකය ලබා ගැනීමට අතර ඊට අදාල ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ මූලික විගණනය පවත්වන ලද අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අවසාන විගණනය සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී.

2.15 පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය 2021.12.31 දිනට ප්‍රගති සාරාංශය

ආයතනය	ප්‍රතිපාදන (රු .මී)	සත්‍ය වියදම (රු .මී)	%
පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)	1518.0	*1429.0	94

*** රු.මී.1.73 බිල්ගතවී නොමැත**

2.16 2021.12.31 දිනට සංරචක අනුව ප්‍රගතිය

විස්තරය	2021.01.01-2021.12.31 දිනට ප්‍රතිපාදන (රු. මී.)	2021.01.01-2021.12.31 දිනට සත්‍ය වියදම (රු.මී)	මූල්‍ය ප්‍රගතිය %
සංරචක 1: නියමු භූ දර්ශන සැලසුම් කිරීම සහ කළමනාකරණය			
සංරචක **1:** නියමු භූ දර්ශන සැලසුම් කිරීම සහ කළමනාකරණය	53.0	43.91	82
සංරචක 2: ස්වභාවික සම්පත් තිරසර භාවිතය හා මිනිස් -අලි සහජීවනය			
උප සංරචක **2 (**අ): ජීවන තත්වය ඉහල නැංවීම සඳහා ස්වභාවික සම්පත් තිරසර භාවිතය	66.0	63.48	96
උප සංරචක **2 (**ආ): ජීවනෝපාය ආරක්ෂාව සඳහා අලි-මිනිස් සහජීවනය	247.0	218.51	89
සංරචක 3: රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය සහ ආයතනික ධාරිතාව			
උප සංරචක **3 (**අ): ආරක්ෂිත සහ කළමනාකරණය ප්‍රදේශ සංරක්ෂණය	263.0	342.0	100
උප-සංරචක 3 (ආ): ආරක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කර්මාන්තය	98.0	84.61	86
උප-සංරචක **3 (**ඇ): වනජීවී සංරක්ෂණ සහ වන සංරක්ෂණ ෙදපාර්තෙමේන්තු හි ආයතනික ධාරිතාව සහ ආයෝජන හැකියාව වර්ධනය	752.0	618.84	82
සංරචක 4 : ව්‍යාපෘති කළමනාකරණය	39.0	57.66	100
එකතුව	**1518.0**	**1429.0**	**94**

2.17 පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන වැඩසටහන් ප්‍රගතිය (ESCAMP)

2.17.1 භූ දර්ශන සැලසුම් හා කළමනාකරණ වැඩසටහන

මෙම සංරචකයේ පරමාර්ථය වන්නේ වියළි කලාපයේ (DZ) සහ තෙත් කලාපයේ (WZ) තෝරාගත් ස්ථාන දෙකක් (2) සඳහා නියමු භූ දර්ශන කළමනාකරණ සැලසුම් සකස් කිරීම සහ පාරිසරික සමතුලිතතාවය සඳහා එහි ආරක්ෂිත ප්‍රදේශ (PAs) සහ අනෙකුත් ස්වභාවික සම්පත් සංරක්ෂණය කරමින් තිරසාර ලෙස භූ දර්ශනය තුළ.සංවර්ධන/සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඉඩම් පරිහරණ කළමණාකරුවන්/ පාර්ශ්වකරුවන් විසින් ඒවා මාර්ගෝපදේශ ලේඛන ලෙස භාවිතා කිරීමයි.

ව්‍යාපෘතිය / වැඩසටහන	2021.01.01 2021.12.31 දිනට ප්‍රතිපාදන (රු.මි)	2021.01.01 2021.12.31 දිනට වියදම (රු.මි)	භෞතික ප්‍රගතිය (වචනයෙන්)
• භූදර්ශන සැලසුම් සහ කළමනාකරණ නියමු ව්‍යාපෘතිය • සිංහරාජ වනාන්තර ප්‍රදේශ (SFR) භූ දර්ශන කළමනාකරණ සැලැස්ම සකස් කිරීම • භූ-දර්ශන කළමනාකරණ නියමු ව්‍යාපෘතිය හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, පොළොන්නරුව දිස්ත්‍රික්කය, වියළි කලාපය.	19.75	19.24	• 2020 වසරේ ආරම්භ කරනලද තෙත් කලාපය සඳහාවූ සිංහරාජ අඩවි භූ දර්ශන සැලසුම් සැකසීම දෙවන කෙටුම්පත සකස්කර අවසන් කරන ලදී. • රත්නපුර, ගාල්ල, මාතර හා කළුතර දිස්ත්‍රික්ක වල දිස්ත්‍රික් ප්‍රධානීන් (පාර්ශවකරුවන්) ගේ සහභාගිත්වයෙන් වැඩමුළු 4 ක් පවත්වන ලදී.

2.17 .1.1 සන්නිවේදන ක්‍රියාකාරකම් වල ප්‍රගතිය

සන්නිවේදන ක්‍රියාකාරකම්	2021.01.01 2021.12.31 දිනට ප්‍රතිපාදන (රු.මි)	2021.01.01 2021.12.31 දිනට වියදම (රු.මි)	භෞතික ප්‍රගතිය (වචනයෙන්)
රූපවාහිනී වැඩසටහන්, වීඩියෝ පට, පුවත්පත් ලිපි,සමාජ මාධ්‍ය හරහා දැනුවත් කිරීමේ වැඩසටහන්,	33.0	24.67	• මිහිකතට හුස්මක් නම් කොටස් හයකින් යුත් රූපවාහිනී ටෙලි නාට්‍යය මාලාවක් ස්වාධීන රූපවාහිනී සේවයේ විකාශය කිරීම; • ජාතික රූපවාහිනී සේවය සතිපතා විකාශනය වන වෙස්සගිරි ගවේෂණාත්මක වැඩසටහන. • ESCAMPහඳුන්වාදීමේ වීඩියෝව සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන්; • සමාජ පණිවිඩ ප්‍රවර්ධනය කිරීම සඳහා උසස් තත්ත්වයේ කෙටි වීඩියෝ 06ක් නිර්මාණය කිරීම.

සන්නිවේදන ක්‍රියාකාරකම්	2021.01.01 2021.12.31 දිනට ප්‍රතිපාදන (රු.මි)	2021.01.01 2021.12.31 දිනට වියදම (රු.මි)	භෞතික ප්‍රගතිය (වචනයෙන්)
			• ජාතික පුවත්පත් වල පළ කරන ලද සහ ES-CAMP වෙබ් අඩවියේ පළ කරන ලද සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් මුහුණු පොතේ පිටුවක් ආරම්භ කිරීම. • අමාත්‍යාංශයේ වනදිවිය පුවත්පත් අතිරේක සඳහා අනුග්‍රහය දැක්වීම සහ එහි ලිපි පළකිරීම. • පාර්ශවකරුවන්ට ලබාදීම සඳහා භූ-දර්ශනප්‍රවේශ පොත් පිංච සහ අලිවැට පොත් පිංච සැලසුම් කිරීම සහ මුද්‍රණය කිරීම. • රූපවාහිනී, ITN සහහරි TV හි රූපවාහිනී කතාමාලා ඉදිරිපත් කිරීම. • ESCAMPපණිවිඩ යැවීම සමඟ වානගම්පත්තුව ගුවන්විදුලි නාට්‍යය මාලාව. • වනකේෂ්ත්‍ර මහා සැලසුම හඳුන්වාදීම සඳහා ජාතික මට්ටමේ රැස්වීමක් සංවිධානය කිරීම සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ ඉහළම ට්ටමේ සංසදයක්ආරම්භකිරීම.

2.17.2. ස්වභාවික සම්පත් තිරසර භාවිතය හා මිනිස් - අලි සහජීවනය (සංරවක 2)

2.17.2. 1 ජීවන තත්ත්වය ඉහල නැංවීම පිණිස ස්වභාවික සම්පත් තිරසර ලෙස භාවිතය (සංරවක 2අ)

ව්‍යාපෘති ප්‍රදේශ	ව්‍යාපෘති/ වැඩසටහන්	2021.01.01 2021.12.31 දිනට ප්‍රතිපාදන (රු.මී)	2021.01.01 2021.12.31 දිනට වියදම (රු.මී)	භෞතික ප්‍රගතිය
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව				
පොළොන්නරුව	කෘෂි ළිං ඉදි කිරීම	12.0	14.4	කෘෂි ළිං 18 ක් ඉදි කර ඇත.
	වාරි ඇල සංවර්ධනය	19.72	23.61	වාරි ඇල ඉදි කර ඇත.
	ගංගා ඉවුරු සංරක්ෂණය			පැල සිටුවා ඇල ඉවුරු 5 ක් සංරක්ෂණය කර ඇත.
මාතලේ	ජල දූෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන			දැනුවත් කිරීමේ වැඩසටහන් 1 ක් සිදු කර ඇත.
	පොදු ළිං ප්‍රතිසංස්කරණය			පොදු ළිං 3ක් ප්‍රතිසංස්කරණය කර ඇත.
	කෘෂි ඇල මාර්ග ප්‍රතිසංස්කරණය			ඇල මාර්ග 1ක් ප්‍රතිසංස්කරණය කර ඇත.
	වෘත්තීය පුහුණුව ලබා දීම.			ආහාර සැකසීම පිළිබඳ පුහුණුව ලබා දී අවශ්‍ය උපකරණ බෙදා දී ඇත.
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව				
යාල	• කෝමාරිකා වගා කිරීමේ ප්‍රජා සංවර්ධන වැඩසටහන අදියර 1 .	8.57	6.03	රණකෙළියගම හා විහාරමහාදේවිපුර කෝමාරිකා වගා කිරීමේ ප්‍රජා සංවර්ධන වැඩසටහන අදියර 1 අවසන් කර ඇත.
	• කෝමාරිකා සිටුවීමේ වැඩසටහන අදියර ii,	4.67	3.49	රණකැලියගම,විහාරමහාදේවිපුර) ක්‍රියාත්මක වෙමින් පවතී. - 60%
	• හඳගිරිගොඩ පානීය ජල පහසුකම් ලබාදීම	2.67	2.67	වැඩ අවසන් කර ඇත.

ව්‍යාපෘති ප්‍රදේශ	ව්‍යාපෘති/වැඩසටහන්	2021.01.01 2021.12.31 දිනට ප්‍රතිපාදන (රු.මි)	2021.01.01 2021.12.31 දිනට වියදම (රු.මි)	භෞතික ප්‍රගතිය
යාල	• මීමැසි පාලනය පිළිබඳ පුහුණුව ලබා දීම සහ මීමැසි පාලන පෙට්ටි බෙදා දීම • පවුලක් සඳහා පර්චස් 80 බැගින් කුරුඳු වගාවට පහසුකම් සැලසීම	1.39	1.38	වැඩ අවසන් කර ඇත.
	• කුමාරපුර, මවු-ආර ජල සැපයුම් පද්ධතියක් ස්ථාපිත කිරීම	6.0	5.26	වැඩ අවසන් කරඇත
	• කුමාරපුර කුරුඳු වගා කිරීමට පහසුකම් සැලසීම	1.04	1.03	වැඩ අවසන් කර ඇත
	• උඩවලව කුමාරපුර ජල ටැංකි ප්‍රතිසංස්කරණ කටයුතු	2.09	1.79	වැඩ අවසන් කර ඇත
	• රතම්බලාගම වගා කිරීම සඳහා එක් පවුලකට අක්කර 1/2 ක් සඳහා ජල බිංදු වැඩසටහනක් ආරම්භ කිරීමට සහාය වීම	3.87	3.86	වැඩ අවසන් කර ඇත
	• රතම්බලාගම පවුලකට පර්චස් 80 බැගින් ගම්මිරිස් වගාවට පහසුකම් සැලසීම	0.93	0.92	වැඩ අවසන් කර ඇත
	• රතුගල කෘෂිකාර්මික අවශ්‍යතාවය සඳහා ජල ප්‍රභවයන් සංවර්ධනය කිරීම • රතුගල ආදිවාසීන් සඳහා වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම, • ගෙවතුවගා සඳහා පැළ හා බීජ ලබා දීම. • ආදර්ශ ගෙවතු වගා වැඩසටහන, • කිරි ගවයින් ලබාදීමේ වැඩසටහන	2.8	2.66	• ජල ප්‍රභවයන් 04ක් සංවර්ධනය කිරීම. - 95%ක වැඩ අවසන් කර ඇත. • වැසිකිලි 14ක් ඉදි කිරීම - 20%ක් වැඩ අවසන් කර ඇත

2.17.2.2 ජීවනෝපාය ආරක්ෂාව සඳහා අලි මිනිස් සහජීවනය (සංරවක 2 ආ) - ව්‍යාපෘති අංශය හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

ව්‍යාපෘතිය / වැඩසටහන	2021.01.01 2021.12.31 දිනට ප්‍රතිපාදන (රු.මී)	2021.01.01 2021.12.31 දිනට වියදම (රු.මී)	භෞතික ප්‍රගතිය
අලි මිනිස් ගැටුම් අවම කිරීම සඳහා ග්‍රාමීය විදුලි වැට හා කෘෂිකාර්මික විදුලි වැට ඉදිකිරීම: කුරුණෑගල සහ අනුරාධපුර දිස්ත්‍රික්කය	151.8	140.77	**ග්‍රාමීය වැටවල් 11 ක ඉදිකිරීම් අවසන් කර ඇත.** **කුරුණෑගල දිස්ත්‍රික්කය** වතුපොලගම(කි.මී.7.5),දේවගිරිපුර (කි.මී.10),කට්ටකඩුව(කි.මී.10),ඉහළගම (කි.මී.10),පලමුගෙදර(කි.මී.7.5),තම්මිටගම (කි.මී.8.5), ගනේදිවුල්වැව 1 කොටස (කි.මී.3.2),ගනේදිවුල්වැව 2 කොටස(කි.මී.4), විහාර මාවත,කදුරුවැව(කි.මී.8), කොන්වැව(කි.මී.8), **අනුරාධපුර දිස්ත්‍රික්කය** හැලඹවැවගම් (කි.මී.6) **විදුලි වැටවල් 10 ක ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතී.** **කුරුණෑගල දිස්ත්‍රික්කය** වඩුගම(කි.මී.6.5),ඉපලෝගම කොටස I (කි.මී.10),සහ II,(කි.මී.10), සිංහරාගම,(කි.මී.10), රත්නදිවුල්වැව (කි.මී.10) **අනුරාධපුර දිස්ත්‍රික්කය** කඳානෙකැටුවන වැව(කි.මී.10), නායකපුවැව (කි.මී.7.0), කපිරිගම(කි.මී.6.5),පුදුන්කුලම වැව (කි.මී.4.5), කෘෂිකාර්මික විදුලිවැට ඉදිකිරීම සඳහා උපකරණ මිලදී ගැනීම් සිදුකර ඇත.
වන අලි සමීක්ෂණය (DNA)	50.0	49.78	අවසන් කර ඇත
වන අලින්ට කරපටි පැළඳවීම	1.5	0.09	39ක් අවසන්

2.17.2.3 රක්ෂිත ප්‍රදේශවල ජල සම්පත් හා මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම (සංරචක 2 ආ) - ව්‍යාපෘති අංශය හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

ව්‍යාපෘතිය / වැඩසටහන	2021.01.01 2021.12.31 දිනට ප්‍රතිපාදන (රු.මි)	2021.01.01 2021.12.31 දිනට වියදම (රු.මි)	භෞතික ප්‍රගතිය
ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයන්හි සැපයුම් මාර්ගය ඉදි කිරීම (කි.මී 30.5)	19.18	13.31	මාර්ගය ඉදිකර අවසන් කර ඇත. කෝසු
ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයන්හි හි අභ්‍යන්තර මාර්ගය ඉදි කිරීම (කි.මී 40.00)	21.95	24.2	වැඩ අවසන් කර ඇත
ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයන්හි සපත්තු පාලම් 48 ඉදි කිරීම	53.23	24.53	සපත්තු පාලම 47 වැඩ අවසන් කර ඇත.
ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයන්හි හි වැව් ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය අදියර I, II, III සහ IVඅදියර (වැව් 12)	83.9	64.89	වැඩ අවසන් කර ඇත.
උඩවලව ජාතික වනෝද්‍යානයේ ජල සම්පත් සංවර්ධනය	29.36	10.28	කුඩා වැව් 1ක් ,දියවලවල් 04ක්, කොන්ක්‍රීට් දියවලවල් 9ක් ඉදිකර අවසන් කර ඇත. කුඩා වැව් 03ක අළුත්වැඩියාව75%ක් අවසන් කර ඇත. තවත් වැව් 01 ක් 20% හා දියවලවල් 03ක් 60% වැඩ අවසන් කර ඇත
යාල ජාතික උද්‍යානයේ කාර්ය මන්ඩලයට හා උද්‍යානයට පැමිණෙන සංචාරකයන් හා වන සතුන් සඳහා ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා මැණික් ගඟේ සිට පලටුපාන දක්වා ජල නල එලීම මැණික් ගඟේ සිට පලටුපාන දක්වා ජල නල එලීම	107.59	42.06	40% අවසන් කර ඇත.

2.17.3රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය සහ ආයතනික ධාරිතාවය (සංරචක 3)

රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය සහ කළමනාකරණය (සංරචක 3අ)

ව්‍යාපෘති ප්‍රදේශ	ව්‍යාපෘති/වැඩසටහන්	2021.01.01 2021.12.31 දිනට ප්‍රතිපාදන (රු.මි)	2021.01.01 2021.12.31 දිනට වියදම (රු.මි)	භෞතික ප්‍රගතිය
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව				
අනුරාධපුර, මාතර, ගාල්ල	වනාන්තර මායිම් නිරූපනය	34.81	15.1	කි.මී 256 මායිම් කණු සිටුවා ඇත.
දිවයින පුරා	ජාතික වන සංගණනය දත්ත ලබා ගැනීම.	22.0 (සාම්පල 2700 සඳහා)	9.2	දත්ත සාම්පල 900 ක් ලබා ගෙන ඇත.
අනුරාධපුර, මාතර, පුත්තලම	වනාන්තර පුනර්ජනනය සඳහා සහය වීම.	14.26	4.7	හෙක්. 258 ක් නඩත්තු කර ඇත.
රත්නපුර, ගාල්ල, නුවර, මාතලේ	පයිනස් යටි වගාව සිදු කිරීම.	5.44	2.5	හෙක්. 63 ක් සිදු කර ඇත.
නුවර, මාතලේ	පෝෂණීය වන වගා නඩත්තුව	4.02	0.53	හෙක්. 40 ක් සිදු කර ඇත.
දිවයින පුරා	පැල නිෂ්පාදනය	30.0	28.3	පැල ලක්ෂ 6 ක් නිපදවා ඇත.
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව				
උඩවලව	උඩවලව ජාතික උද්‍යානයේ ආක්‍රමණශීලී ශාක විශේෂයන් ඉවත් කිරීම (හෙක්. 400)	29.36	5.37	වැඩ අවසන් නඩත්තු කටයුතු සිදුකරමින් පවතී
	බුන්දල ජාතික උද්‍යානයේ ආක්‍රමණශීලී ශාඛ ඉවත් කර නඩත්තු කිරීම (හෙක්. 100)	14.31	3.0	වැඩ අවසන් නඩත්තු කටයුතු සිදුකරමින් පවතී
	ආක්‍රමණශීලි ආගන්තුක ශාඛ ඉවත් කර නඩත්තු කිරීම - ලුණුගම්වෙහෙර ජා.උ(හෙක්. 600)	2.13	2.42	අවසන් කර ඇත.
	බිට්ටු කාර්යාල සහ අලි පාලන ඒකක සඳහා යතුරු පැදි 55ක් මිලදී ගැනීම - අදියර I සහ II	23.17	21.45	මිලදී ගැනීම් අවසන් කර ඇත
	නැගෙනහිර වනජීවී සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ඉදිකිරීම	47.61	16.38	60% අවසන්

2.17.3.1 වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරින් සඳහා ඒකාබද්ධ බිවිටු වන නිලධාරී කාර්යාල , නිල නිවාස හා ප්‍රාදේශීය කාර්යාල ඉදිකිරීම (සංරචක 3අ)

දිස්ත්‍රික්කය	ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රමාණය	2021.01.01 2021.12.31 දිනට ප්‍රතිපාදන (රු.මි)	2021.01.01 2021.12.31 දිනට වියදම (රු.මි)	භෞතික ප්‍රගතිය
මුලතිව්, මන්නාරම, කිලිනොච්චි, වව්නියාව, අම්පාර, මොණරාගල, මඩකලපුව,	බිවිටු වන නිලධාරී නිල නිවාස 17 ක් ඉදි කිරීම.	102.9	19.16	ඉදිකරමින් පවතී.
ගාල්ල	අඩවි වන කාර්යාලයක් ඉදි කිරීම.	15.0	4.0	ඉදිකරමින් පවතී.
වව්නියාව	කලාප නියෝජ්‍ය වන සංරක්ෂක කාර්යාලයක් හා නිල නිවසක් ඉදි කිරීම.	48.98	10.71	ඉදිකරමින් පවතී.

2.17.3.2 ආරක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කර්මාන්ත වැඩසටහන දියුණු කිරීම (සංරචක 3ආ)

ව්‍යාපෘති/වැඩසටහන්	දිස්ත්‍රික්කය	2021.01.01 2021.12.31 දිනට ප්‍රතිපාදන (රු.මි)	2021.01.01 2021.12.31 දිනට වියදම (රු.මි)	භෞතික ප්‍රගතිය
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව				
ස්වභාවික මංපෙත් නඩත්තුව	රත්නපුර, ගාල්ල, මාතර, මාතලේ	14.2	11.82	කි.මී 91 මංපෙත් නඩත්තු කර ඇත.
සෆාරි ජීප් රථමාර්ග සංවර්ධනය	පොලොන්නරුව	1.0	1.0	කි.මී 2 සංවර්ධනය කර ඇත.
ගල්ඔය වන නිවහන සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම.	පොලොන්නරුව	8.0	3.6	මිලදී ගෙන ඇත.
වැසිකිළි පද්ධතිය ඉදි කිරීම	පොලොන්නරුව	5.0	4.9	ඉදි කර ඇත.
ඊරිගෙඔය වැව අසල වන නිවහන ගොඩනැගිල්ලේ සූර්ය බල පද්ධතිය ස්ථාපිත කිරීම	පොලොන්නරුව	2.5	2.5	ස්ථාපිත කර ඇත.
ගල්ඔය පාරිසරික වන උද්‍යානයේ වන නිවහනේ විදුලි වැට ඉදිකිරීම	පොලොන්නරුව	1.35	1.34	ඉදි කර ඇත.
කඳවුරු භූමි නඩත්තුව	මාතලේ	3.0	2.0	කඳවුරු භූමි 2 ක් නඩත්තු කර ඇත.
රිවස්ටන් හා රඹුක්ඔළුව ප්‍රවේශ ස්ථාන වල භූ දර්ශ කලමනාකරනය	මාතලේ	2.0	1.9	අවසන් කර ඇත.
නල ළිං ස්ථාපනය	මාතලේ	0.5	0.34	රඹුක්ඔළුව ප්‍රවේශ පත්‍ර කවුළුවේ හා වන නිවහනේ නල ළිං 2 ක් ස්ථාපනය කර ඇත.
රඹුක්ඔළුව ප්‍රවේශ පත්‍ර කවුළුවේ වහල අලුත්වැඩියාව	මාතලේ	0.5	0.49	අවසන් කර ඇත.
කන්නෙලිය රථ ගාල සඳහා ප්‍රවේශ මාර්ගය, අනගි මල ඇල්ල මංපෙත හා අනෙකුත් අත්‍යවශ්‍ය ඉදිකිරීම්	ගාල්ල	5.0	4.45	අවසන් කර ඇත.
දොරණ ඇල්ල - වතුරාව මාර්ගය ප්‍රතිසංස්කරණය	රත්නපුර	6.0	5.65	අවසන් කර ඇත.

ව්‍යාපෘති/වැඩසටහන්	දිස්ත්‍රික්කය	2021.01.01 2021.12.31 දිනට ප්‍රතිපාදන (රු.මි)	2021.01.01 2021.12.31 දිනට වියදම (රු.මි)	භෞතික ප්‍රගතිය
කොස්ගුලන වන නිවහනේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම.	රත්නපුර	1.0	1.09	අවසන් කර ඇත.
REEC මධ්‍යස්ථානය සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම.	රත්නපුර	2.0	1.5	අවසන් කර ඇත.
ඩීන්ස්ටන් සංචාරක බංගලාව, දෝතළුගල සංචාරක බංගලාව හා කඳවුරු භූමිය වැඩිදියුණු කිරීම.	මහනුවර	80.0	64.51	වැඩ අවසන් කර ඇත.
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව				
යාල	යාල ජාතික උද්‍යානයේ පටනංගල සංචාරක විවේකාගාරය වාහන නැවතුම් අංගනය ඇතුළු ඒ ආශ්‍රිත ඉදිකිරීම් හා භූමි අලංකරණ කටයුතු	77.64	14.9	30% අවසන් කර ඇත.

2.17.3.3 වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවල පුහුණු ධාරිතා සංවර්ධනය (3ඇ)

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ඉදිකිරීම් වල ප්‍රගති සාරාංශය

	ක්‍රියාකාරකම්	2021.01.01 2021.12.31 දිනට ප්‍රතිපාදන (රු.මි)	2021.01.01 2021.12.31 දිනට වියදම (රු.මි)	භෞතික ප්‍රගතිය
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව				
නුවරඑළිය	කණිෂ්ඨ මාණ්ඩලික නිල නිවාස හා ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිල නිවාස ඉදි කිරීම-	88.0	59.89	56%
	අධ්‍යාපන ගොඩනැගිල්ල සහ නේවාසිකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම නුවරඑළිය	71.0	27.79	50%
	ආපනශාලා ඉදි කිරීම, වැඩබිම් සහ ඉරුම් හල් ප්‍රතිසංස්කරණය -	80.0	26.32	46%

	ක්‍රියාකාරකම්	**2021.01.01 2021.12.31 දිනට ප්‍රතිපාදන (රු.මි)**	**2021.01.01 2021.12.31 දිනට වියදම (රු.මි)**	**භෞතික ප්‍රගතිය**
නුවරඑළිය	ව්‍යායාම ශාලාව, අධ්‍යක්ෂවරුන්ගේ බංගලාව, සංචාරක බංගලාව ප්‍රතිසංස්කරණය කිරීම සහ ගරාජ ඉදිකිරීම	96.0	56.46	87%
	නව පරිපාලන ගොඩනැගිල්ල සහ කාර්ය මණ්ඩල නවාතැන් ඉදිකිරීම ක්‍රීඩා පිටිය සහ මාර්ග ජාල ඉදිකිරීම (ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනය)	89.0	74.07	34%
	නව පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සහ කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරී නවාතැන් ප්‍රතිසංස්කරණ (ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනය)	75.0	62.18	18%
ඉනාමළුව	ඉනාමළුව ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම්	93.0	67.51	98%
වනජීවීසංරක්ෂණදෙපාර්තමේන්තුව				
ගිරිතලේ	ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ පවතින අධ්‍යයන පරිපාලන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම	51.0	11.06	31%
	පැරණි නේවාසිකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම	102.0	58.49	19%
	ගිරිතලේ නව අධ්‍යයන සංකීර්ණය ඉදිකිරීම	73.0	21.73	39%
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව				
දීප ව්‍යාප්ත	වනජීවී කේෂ්ත්‍ර කාර්යාල 100ක් අලුත්වැඩියා කිරීම.	120.55	74.84	91ක් අවසන් කර ඇත.

2.18 අමාත්‍යාංශයේ විශේෂ ජයග්‍රහණ අභියෝග හා ඉදිරි ඉලක්ක

2.18.1 විශේෂ ජයග්‍රහණ

- අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය දැව සංස්ථාව මගින් රු.මි 6153ක ආදායමක් රටේ ජාතික ආදායමට එකතු කිරීමට හැකිවීම
- රාජ්‍ය දැව සංස්ථාවේ 2021 වර්ෂයේ අලෙවි ඉලක්කය රු.මි. 408කින් අභිබවා යාම
- ශ්‍රේණිගත උසස්වීම් (Grade Promotion) ලබාදීම සඳහා ක්‍රමවේදයන් සකස් කිරීම
- ජෛව විවිධත්වයෙන් ඉහළ පාරිසරික වටිනාකමක් ඇති පාරිසරික කලාප සඳහා භූ දර්ශන සැලසුම් 2 ක් සකස් කර නිම කිරීමට හැකිවීම
- පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ සෘජු ප්‍රතිලාභීන් ගණන ලෝක බැංකුව අනුමත කරන ලද ඉලක්කය අභිබවා යාම
- GSP Plus පහසුකම් ලබා ගැනීම සඳහ වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනතට සිදුකළ යුතු සංශෝධන පසුගිය වසර 15 ක කාලයක් තුළ සිදු නොකිරීම හේතුවෙන් යුරෝපා සංගමය (EU) වෙතින් 2022 වර්ෂයේ සිට GSP Plus සහනය ලබා ගැනීමට යම් ගැටලුකාරී තත්වයක් උදා වී තිබුණි. එම ගැටලුවට විසඳුම් ලබා දෙමින් ගරු නීතිපතිතුමා හා නීති කෙටුම්පත් සම්පාදක සමග ඉතා කෙටි කාලයක් තුල මනා සම්බන්ධීකරණයක් කරමින් තර්ජනයට ලක් වූ වන සත්ත්ව හා වෘක්ෂලතා විශේෂයන්ගේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතිය ශ්‍රී ලංකාව තුළ බලාත්මක කිරීම හා විධිමත් කිරීම සඳහා වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත සංශෝධනය කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අමාත්‍ය මන්ඩලය වෙත 2021.09.27 දිනයෙන් ඉදිරිපත් කිරීමට හැකිවිය. එමෙන්ම යුරෝපා සංගමය තුළ ශ්‍රී ලංකාව තෙවන පියවරේ සිට පළමු පියවර දක්වා ලගා වීමට හැකියාව ලැබුනු අතරම GSP Plus සහනය ලබා ගැනීමට තිබූ නීතිමය බාධා ඉවත් කර ගැනීමටද හැකියාව ලැබිණි.

2.18.2 අභියෝග

- අමාත්‍යාංශයේ විෂය ක්ෂේත්‍රයට අයත් දෙපාර්තමේන්තු හා ආයතන වල අණපනත් යාවත් කාලීන කිරීම.
- දිනෙන් දින වර්ධනය වන අලි මිනිස් ගැටුම
- ශ්‍රී ලංකාවේ වන ඝනත්වය 29.2% - 30% දක්වා ඉහළ නංවා ගැනීම
- ශ්‍රී ලංකා වනවිද්‍යා ආයතනය සහ ජාතික වනජීවී පර්යේෂණ ආයතනයේ සිදුකරන මහා පරිමාණ ඉදිකිරීම සඳහා අමුද්‍රව්‍ය සපයා ගැනීමේ අපහසුතාවය හා ද්‍රව්‍යයන්ගේ මිල අධික ලෙස ඉහළ යාම හේතුවෙන් සිදුවූ ඉදිකිරීම් ප්‍රමාදයන් හා සම්බන්ධ ගැටළු
- ආර්ථික අසමතුලිතතාවය මත මිල ගණන්හි උච්චාවචන ඇතිවීම මත රාජ්‍ය දැව සංථාව විසින් මිල ගණන් ලබාගැනීම සම්බන්ධ ගැටළු පැවතීම හා ඇතැම් ඇනවුම් අවලංගුවීම
- රාජ්‍ය දැව සංස්ථාවේ නියමිත කාලය තුළ සැපයුම්කරුවන් මගින් භාණ්ඩ ලබාගැනීම සඳහා අපහසුතා පැවතීම
- අවශ්‍ය පුහුණු සේවක හිඟය නිසා ගෘහභාණ්ඩ නිෂ්පාදනයට සොයා ගැනීම අපහසුවීම
- වෙළඳ පොළෙහි තතත්වයෙන් බාල ගෘහ භාණ්ඩ නිෂ්පාදනවල මිලට නිවැරදි අමුද්‍රව්‍ය යොදා නිෂ්පාදනය කර වෙළඳ පොළට භාණ්ඩ යොමු කිරීම අපහසුවීම
- ප්‍රමාණවත් තේක්ක දැව නොලැබීම
- පනවා තිබූ ආනයන සීමා හමුවේ දම්වැල් කියත් ඇතුළු දැව සැපයීම් සඳහා අත්‍යවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට සිදුවූ බාධාවන්

2.18.3 ඉදිරි ඉලක්ක 2021 - 2025

- ‘‘සෑම අයෙක් එක් පැළයක්‘‘ හරිත ශ්‍රී ලංකා වැඩසටහන මගින් 2023 පෙබරවාරි මාසයේ දී සැමරීමට අපේක්ෂා කරනු ලබන 75 වන නිදහස් දියමන්ති ජුබිලිය වෙනුවෙන් පැළ ලක්ෂ 75ක් සිටුවීමේ වැඩසටහනට දායක වෙමින් ක්‍රියාත්මක වීම
- අමාත්‍යාංශයේ විෂය ක්ෂේත්‍රයට අයත් දෙපාර්තමේන්තු හා ආයතනවල අණ පනත් යාවත්කාලීන කිරීම.
- අලින් හැර වෙනත් සතුන්ගෙන් වන වගා හානි අවම කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ජනාධිපති කාර්ය සාධක බලකා යෝජනා ක්‍රියාත්මක කිරීම.
- ග්‍රාමීය හා කෘෂිකාර්මික විදුලි වැට කි.මී.700 ඉදිකිරීම.
- ගිරිතලේ වනජීවී සංරක්ෂණ පුහුණු මධ්‍යස්ථානය හා නුවර එළිය ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනය වැඩි දියුණු කිරීම.
- ඉනාමළුව පුහුණු මධ්‍යස්ථානය විවෘත කිරීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය දැව සංස්ථාවේ ISO 9001:2015 තත්ත්ව ප්‍රතිපත්තිය ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සපයමින් මිලදී ගැනීම් හා නාවික අංශයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කරගැනීම
- රාජ්‍ය දැව සංස්ථාව විසින් ගෘහ භාණ්ඩවලට අමතරව දැවමය නිෂ්පාදන විශාල ප්‍රමාණයක් ඉදිරියේදී වෙළෙඳපලට හඳුන්වාදීම සඳහා සැලසුම් කර ඇත.
- පයිනස් දැව පදම් කිරීම හා පරිවර්තනය කිරීමේඉඩකඩ ප්‍රමාණය වැඩිකිරීම තුලින් තත්වයෙන් උසස් දැව වෙළෙඳපලට විශාල වශයෙන් යොමු කිරීම.
- අගය එකතු කළ නිෂ්පාදන මගින් උපයනු ලබන ආදායම වැඩි කරගැනීම (ගෘහ භාණ්ඩ, ඉරුදැව)
- වනාන්තර සෞන්දර්යය ඉහළ නැංවීම සඳහා ගෙවතු, පාසැල්, රෝහල්, කාර්යාල, වැඩබිම්, අඩු මාර්ග සහිත උද්‍යානවල සුදුසු වනවගාව හඳුන්වා දීම හා පුළුල් කිරීම සඳහා අවශ්‍ය පැල ලබාදීම.
- පුද්ගලික දැව හා ගෘහභාණ්ඩ නිෂ්පාදන ආයතන සම්බන්ධ කරගනිමින් ගෘහභාණ්ඩ නිෂ්පාදන ප්‍රවර්ධනය කර වෙළෙඳපොළ පුළුල් කිරීම.
- අපනයන වෙළෙඳපොළ ඉලක්ක කර ගෘහභාණ්ඩ හා අගය එකතු කළ නිෂ්පාදන තුළින් විදේශ විනිමය ඉපැයීමට කටයුතු කිරීම.
- තුනීලෑලි හා තුනීලෑලි ආශ්‍රිත නිෂ්පාදන රාජ්‍ය දැව සංස්ථා ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර ආශ්‍රිතව නිෂ්පාදනය තුළින් නව වෙළෙඳපොළ අවශ්‍යතාවය ජය ගැනීම.
- රුක් කලා ඒකකයක් ස්ථාපිත කර දෙස් විදෙස් වෙළෙඳපොළ ඉලක්ක කර නිෂ්පාදන කටයුතු පුළුල් කිරීම.
- ඉදිරියේදී හෙලීම් කිරීමට නියමිත ෆයිනස් කඳන්වලින් ඉරුදැව පරිවර්ථනය කර, එම දැව පරිරක්ෂණය කර අවශ්‍ය පරිදි නව ඉරුම්හල් සවිකරමින් එම කටයුතු ප්‍රසාරණය කිරීම.
- ප්‍රාදේශීය වඩුකාර්මික ශිල්පීන් හා බැංකු සම්බන්ධ කරගනිමින් නව ගෘහභාණ්ඩ නිෂ්පාදන ව්‍යවසායකයින් බිහිකිරීම.
- අඩු ආදායම්ලාභී තරුණයන් සඳහා දැව කර්මාන්තය පිළිබඳ නිපුණත්වයක් ලබාදීම.
- හම්බන්තොට සෆාරි උද්‍යානය අක්කර 500 තුළම සම්පූර්ණයෙන් ඉදිකර අවසන් කිරීම.
- පිළියන්දල කහපොළ වත්තෙන් අක්කර 70ක පමණ භූමි භාගයක ජාතික සත්වෝද්‍යානයක් ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කර ඇති අතර 2022 වර්ෂයේදි නියමිතව ඇති එහි මූලික සංවර්ධන කටයුතු ආරම්භ කිරීම.

03. පරිච්ඡේදය වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු. , 000

අයවැය 2021		සටහන	තත්‍ය		
				නැවත ගලපන ලද	
			2021	2020	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		163,088,000	67,665,000	ඒසිඒ-3
-	තැන්පතු		428,466	66,126,031	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		5,316,004	6,052,280	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්			-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**168,832,470**	**139,843,311**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**168,832,470**	**139,843,311**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**71,001,124**	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**97,831,346**	**139,843,311**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
76,100,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	74,679,212	66,907,117	
160,197,679	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	158,956,738	36,675,520	ඒසිඒ-2(ii)
200,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	142,723	385,580	
-	පොළී ගෙවීම්	**8**	-	-	
225,000	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	219,217	51,978	
236,722,679	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**233,997,890**	**104,020,195**	

අයවැය 2021		සටහන	තත්‍ය		
				නැවත ගලපන ලද	
			2021	2020	
රු.			රු.	රු.	
	මූලධන වියදම්				
8,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	5,603,674	6,586,071	
2,982,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	2,797,481	3,317,646	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසීඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
300,000	හැකියා වර්ධනය	**14**	177,646	83,500	
1,539,495,760	වෙනත් මූලධන වියදම්	**15**	1,448,850,124	1,139,642,848	
1,550,777,760	**මුළු මූලධන වියදම් (උ)**		**1,457,428,925**	**1,149,630,065**	
	තැන්පතු ගෙවීම්		348,816	66,126,031	**ඒසීඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		5,278,742	16,935,153	**ඒසීඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**5,627,558**	**83,061,184**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,697,054,373	1,336,711,444	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(1,599,223,027)	(1,196,868,133)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(1,599,223,027)	(1,196,868,133)	**ඒසීඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	**ඒසීඒ-3**

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2021.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2021	2020
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	200,995,929	186,784,016
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	10,845,610	10,882,872
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**211,841,539**	**197,666,888**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		10,765,960	10,882,872
දේපළ පිරියත හා උපකරණ සංචිතය		200,995,929	186,784,016
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	79,650	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**211,841,539**	**197,666,888**

පිටු අංක 07 සිට 10 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 41 සිට 57 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය :	දිනය :	දිනය : 2022.02.21

සෝමරත්න විද්‍යානපතිරණ
ලේකම්
වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

2

කුමාරසිරි පෙරේරා
ප්‍රධාන මූල්‍ය නිලධාරි
වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය
නො: 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත
රාජගිරිය

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2021.12.31 දිනෙන් අවසන් කල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

රු.000

	තත්‍ය	
		නැවත ගලපන ලද
	2021	2020
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ		-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	85,172,356	53,312,016
අග්‍රිම ලැබීම්	163,088,000	69,785,184
අත්තිකාරම් අයකර ගැනීම්	4,863,396	19,067,066
තැන්පතු ලැබීම්	398,116	15,208,716
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**253,521,868**	**157,372,982**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	136,077,087	50,701,177
සහනාධාර සහ මාරුකිරීම්	142,723	74,725
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	606,001	10,653,036
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	71,001,124	2,205,000
අත්තිකාරම් ගෙවීම්	5,504,571	19,712,037
තැන්පතු ගෙවීම්	318,466	66,126,031
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**213,649,972**	**149,472,006**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**39,871,896**	**7,900,976**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර	39,871,896	7,900,976

	තත්‍ය	
		නැවත ගලපන ලද
	2021	**2020**
	රු.	රු.
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**39,871,896**	**7,900,976**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(39,871,896)**	**(7,900,976)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

01. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

02. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

03. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

04. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී

05. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

06. මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

07. මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය (අදාල නොවේ)

රු. , 000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාල නොවේ					

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. , 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	224,450,000	236,722,679	233,997,890	98.84%
ප්‍රාග්ධන	1,011,500,000	1,507,777,760	1,457,428,925	96.66%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම අංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. , 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය	උපාධිධාරී අභ්‍යාසලාභීන්ගේ දීමනා ගෙවීම	120,000	120,000	120,000	100
02	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාමිකයින්ගේ ණය ශේෂ නිරවුල් කිරීම	486,001	486,001	486,001	100

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. , 000

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	2020.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය %
9152	යන්ත්‍රෝපකරණ	200,348,929.09	200,348,929.09		100
9154	අස්පෘශ්‍ය වත්කම්	647000	647000		100

3.9 විගණකාධිපති වාර්තාව අමුණා ඇත. (පිටු අංක 71-79)

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්ය සාධන දර්ශක (අමාත්‍යාංශය සහ ආයතන)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතය තත්‍ය නිමැවුම් ලෙස %		
	100-90	75-89	50- 74
රාජ්‍ය දැව සංස්ථාවේ නිෂ්පාදනය	√		
රාජ්‍ය දැව සංස්ථාවේ ආදායම රු.මි.	√		
පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය			
සංරචකය 1: නියමු භූ දර්ශන සැලසුම් කිරීම සහ කළමනාකරණය			
පුරවැසි සහභාගීත්වය සහිතව උපායමාර්ගික කරන ලද නියමු භූ දර්ශන සැලසුම	√		
සංරචකය 2 අ: ජීවනෝපාය වැඩි දියුණු කිරීම සඳහා ස්වාභාවික සම්පත් තිරසර ලෙස භාවිත කිරීම			
සකස් කර ඇති ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් (ගණන)	√		
සංරචකය 2: ස්වාභාවික සම්පත් තිරසර ලෙස භාවිත කිරීම සහ මිනිස්-අලි සහජීවනය			
ව්‍යාපෘති මැදිහත්වීම්වල ප්‍රතිඵලයක් ලෙස ආදායම් උත්පාදනය කිරීමේ ක්‍රියාකාරකම් සඳහා වැඩි ප්‍රවේශයක් ඇති පුද්ගලයින් (ගණන -දහස්)	√		
Direct project beneficiaries (Number - Thousand)සෘජු ව්‍යාපෘති ප්‍රතිලාභීන් (ගණන- දහස්)	√		
ඉලක්කගත ප්‍රජාවන්හි කාන්තා ජීවනෝපාය ක්‍රියාකාරකම් වැඩිවීම (ප්‍රතිශතය)	√		
ඉදිරිපත්ව ඇති වැට ඉදිකිරීමේ වැඩ සටහන තිරසාර කළමනාකරණය සඳහා ආයතනික රාමුව (ඔව් / නැත)			√
ඉදිරිපත්ව ඇති අලි කළමනාකරණය පිළිබඳ දැනුම් නිෂ්පාදන (සංඛ්‍යාව)	√		
සංරචකය 3: ආරක්ෂිත ප්‍රදේශ කළමනාකරණය සහ ආයතනික ධාරිතාව			
සංරක්ෂණ තත්ත්වය සහ බලාත්මක කිරීමේ අධීක්ෂණ සහ වාර්තාකරණ පද්ධති (සංඛ්‍යාව)	√		
උප සංරචක 3 ඇ: වනජීවී සංරක්ෂණ සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවල ආයතනික ධාරිතාව සහ ආයෝජන හැකියාව			
පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය (සංඛ්‍යාව)	√		
උප සංරචකය 3 අ: රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය හා කළමනාකරණය			
රක්ෂිත ප්‍රදේශ කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම (සංඛ්‍යාව)		√	
ජෛව විවිධත්වය වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම් ප්‍රදේශය	√		
උප සංරචක 3 ඇ: වනජීවී සංරක්ෂණ සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවල ආයතනික ධාරිතාව සහ ආයෝජන හැකියාව			
වැඩි දියුණු කරන ලද දිගුකාලීන ධාරිතා වර්ධනය සඳහා වන සහායක යටිතල පහසුකම්		√	
වැඩි දියුණු කරන ලද දිගු කාලීන පුහුණු වැඩසටහන් (සංඛ්‍යාව)	√		

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය සඳහා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය මෙහෙයවීම හා අධීක්ෂණ කටයුතු සිදු කිරීම අමාත්‍යාංශයේ මෙහෙවර බැවින් තිරසර සංවර්ධන අරමුණු ඉටු කරගැනීමට අවශ්‍ය කාර්යයන් වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු හරහා සිදුවේ.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	30	12	18
තෘතීයික	03	02	01
ද්විතියික	48	40	08
ප්‍රාථමික	18	18	-

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය

ආයතනයේ මානව සම්පත කළමනාකාරිත්වයකින් යුතුව අමාත්‍යාංශයේ කාර්ය සාධනය උදෙසා යොදා ගනු ලබයි. අමාත්‍යාංශයේ අතිරික්ත කාර්ය මණ්ඩලය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කරවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

6.3 මානව සම්පත් සංවර්ධනය

- **අමාත්‍යාංශයෙන් පැවැත්වූ පුහුණු වැඩසටහන්**

වැඩසටහනේ නම	පුහුණු කරන සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු. 000)		වැඩසටහනේ ස්වාභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම්/ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
ලිපි ගොනුකරණය	03	2021.02.16	12,000		දේශීය	විෂය පථයට අදාල දැනුම් ලබාගෙන ඇත.
භාෂා පරිවර්තනය පිළිබඳ පුහුණු වැඩසටහන	01	2021.03.22 2021.03.26			දේශීය	
Public Procurement & Asset Management	02	2021.09.29 2021.12.08	60,000		දේශීය	
කාර්යාල කළමනාකරණයෙහි මුදල් රෙගුලාසි	44	2021.12.06 2021.12.08	95,646		දේශීය	

- **රාජ්‍ය දැව සංස්ථාවේ පුහුණු වැඩසටහන් හා පර්යේෂණ පිළිබඳ ප්‍රගතිය**

පැවැත්වූ ආයතනය	පාඨමාලා / වැඩමුළු	පාඨමාලා/ වැඩමුළු සංඛ්‍යාව	යොමු කරන ලද සේවක සංඛ්‍යාව
කල්දෙමුල්ල දැව තාක්ෂණ පුහුණු ආයතනය හා අනුබද්ධව	වන සංගණනය හා GPS තාක්ෂණය	05	182
	Showroom System	01	25
	මුදල් රෙගුලාසි	01	70
	දැව ඉරුම්හල් කියත් සැකසුම	01	32
	ප්‍රසම්පාදනය	01	57
	ප්‍රසම්පාදන නිර්ණායක අනුව බාහිර උපදේශකයකු තෝරා ගැනීම	01	47
	ණයට විකිණුම් පද්ධතිය	01	25
	අල්ලස් හා දූෂණ විමර්ෂණ පනත	02	105
බාහිර ආයතන මගින්) SDFL, SLSI, NIBM, CE-TRAC,SDFL, ප්‍රාග්, ක්‍රම සම්පාදන, පදනම විශ්වවිද්‍යාල ආදිය(	ප්‍රසම්පාදන ක්‍රියාවලි පිළිබඳ පුහුණු පාඨමාලා	52	137
	රාජකාරී විධි හා ආගන්තුක සත්කාර		
	ප්‍රවාහන කළමනාකරණය		
	මානව සම්පත් කළමණාකරණය		
	ඉංග්‍රීසි භාෂාව		
	මූල්‍ය කටයුතු පිළිබඳ පුහුණු පාඨමාලා		
	උපාධි, වන විද්‍යා හා අනෙකුත් පශ්චාත් උපාධි		
	අභ්‍යන්තර විගණන පිළිබඳ පුහුණු පාඨමාලා		
	කණ්ඩායම් ක්‍රියාකාරකම් හා සාමූහික වගකීම		
	විනය කාර්ය පටිපාටිය		
	පරිගණක ක්‍රමලේඛණය		
	ගැටුම් කළමනාකරණය		
	බොයිලේරු පුහුණුව		
	කාර්යාල කාර්ය සහයක පුහුණුව		
වන විද්‍යාලය	**ශ්‍රී ලංකා වන විද්‍යාලයේ වන විද්‍යා ඩිප්ලෝමා පත්‍ර පාඨමාලාව**	01	03
	ශ්‍රී ලංකා වන විද්‍යාලයේ වන විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව	01	07
එකතුව		**67**	**690**

මේ සඳහා වැය කල මුළු මුදල රු. 3,045,123 කි. මීට අමතරව රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය, චීන රජයට අනුබද්ධිත NAFGA (NationalAcademy of Forestry and Grassland Administration) සමඟ සම්බන්ධ වී Online ක්‍රමයට පවත්වන ලද පුහුණු වැඩසටහන් සඳහා පහත පරිදි රාජ්‍ය දැව සංස්ථාවේ සේවක මහත්ම මහත්මීන් යොමු කරවා ඇත.

පැවැත්වූ ආයතනය	වැඩමුළුව	වැඩමුළු සංඛ්‍යාව	යොමු කරන ලද සේවක සංඛ්‍යාව
NAFGA (National Academy of Forestry and Grassland Administration) මහජන චීන සමූහාණ්ඩුව	Seminar on Forest Law Enforcement and Governancefor Officials from Developing Countries	01	03
	Seminar on the Implementation of United NationsForest Instrument (UNFI) and Sustainable ForestManagement for Developing Countries	01	10
	Seminar on Natural Protected Areas Management and Biodiversity Conservation for the Belt and Road Initiative Countries	01	06
	Seminar onClimate Change and Sustainable Development for the Belt Road Initiatives	01	17
එකතුව		**04**	**36**

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
01	**මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූලවේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලවේ		
1.3	ව්‍යාපාර නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.6	වෙනත්			
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම.(මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූලවේ		
2.2	පුද්ගල පඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූලවේ		
2.3	විගණන විමසුම් ලේඛනය	අනුකූලවේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූලවේ		
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම			
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූලවේ		

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූලවේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූලවේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූලවේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූලවේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූලවේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.2	**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම**	අනුකූලවේ		

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දොපර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල නොවේ	අදාල දිනට පිළිතුරු සැපයිය නොහැකි විය	ඉදිරියේදී අදාල දිනයට පිළිතුරු සැපයීමට කටයුතු කිරීම
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණණ සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයත් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූලවේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගනන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA වකුලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් 2021 වර්ෂය සඳහා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පැවැත්වීම	

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූලවේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම		අනුකූලවේ	කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් චක්‍රලේඛයේ නිර්දේශිත කාලය තුල සිදුකිරීමට නොහැකි වුවද මේ වන විට සිදු කොට ඇත
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදුකිරීම	අනුකූලවේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලකයකදී අපහරණය කර තිබීම	අනුකූලවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලවේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූලවේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූලනොවේ		වනජීවී අංශයට අයත් වාහන සංඛ්‍යාව 20ක් වන අතර ඒ අතරින් වාහන 07ක් කල්බදු ක්‍රමය යටතේ ලබා ගත් වාහන වේ. එම වාහන 07 අතරින් වාහන 6ක පරම අයිතිය අහෝසි කර ඇත
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූලවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලවේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයේජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම		අනුකූල නොවේ	සලසා තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූලවේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූලවේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූලවේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූලවේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලවේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූලවේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව රඳස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ		
15.2	රඳස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම			

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලවේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූලවේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූලවේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රාකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම	අනුකූල නොවේ	පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීමටකටයුතු කරමින් පවතී. (2022 මාර්තු 10 දිනට පෙර ඉටු කිරීමට අපේක්ෂා කෙරේ.)	

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	මේ වන විට මෙම කාර්ය ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරියෙකු පත්කර ඇත	
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූලනොවේ	මානව සම්පත් සැලැස්මක් සකස් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. (2022 මාර්තු 25 දිනට පෙර ඉටු කිරීමට අපේක්ෂා කෙරේ)	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූලවේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූලනොවේ	වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් පිළියෙල කරමින් පවතී. (2022 මාර්තු 15 දිනට පෙර ඉටු කිරීමට අපේක්ෂා කෙරේ)	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම ,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූලවේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූලවේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } එන්ඩබ්එල්/සී/එම්ඩබ්එන්සී/එන්ජී/2021

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2022 මැයි 31 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍යාංශය

වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 30 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් අත්තිකාරම් බී ගිණුමට කරන ලද රු.225,829 ක් වූ හර කිරීම එලෙස නොදක්වා අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් කරන ලද බැර කිරීම්වලින් අඩු කර දක්වා තිබුණි.

1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.2.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පතු ලැබීම් හා තැන්පතු ගෙවීම් මුදල් ප්‍රවාහයන් අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ ඊට අනුරූප ශේෂයන් සමඟ සැසඳීමේදී රු.30,350 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.136,077,087 ක් වුවද විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එම මුදල් ප්‍රවාහය රු.173,151,502 ක් වූයෙන් රු.37,074,415 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.2.2 ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන වෙනුවෙන් රු.2,797,481 ක් වියදම් කර තිබූ

නමුත් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එම මුදල් ප්‍රවාහය රු.39,871,896 ක් වූයෙන් රු.37,074,415 ක වෙනසක් නිරීක්ෂණය විය.

2 මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවද අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුවේ වැය විෂයන් 10 ක සියයට 18 සිට සියයට 100 දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය.

2.2 කළමනාකරණ දුර්වලතා

2017 පෙබරවාරි 01 දිනැති අංක අමප16/26/98/708/039 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නව අභය භූමි ප්‍රකාශයට පත් කිරීම, ජාතික අභය භූමි තත්වයට උසස් කිරීම, ස්වභාවික රක්ෂිතයක් බවට පත් කිරීම හා අභය භූමි මායිම සංශෝධනය සිදු කළ යුතු වුවද කලාවැව ජාතික උද්‍යානය හා මාදුගහ අභය භූමියේ මායිම් සංශෝධනය කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 විදේශාධාර ව්‍යාපෘති

ශ්‍රී ලංකාවේ පරිසර පද්ධතිවල කළමනාකරණ හා වැඩි දියුණු කිරීම තුළින් එම පරිසර පද්ධති සංරක්ෂණය කිරීම හරහා ජනතාවට ප්‍රතිලාභ ලබාදීමේ අරමුණින්, පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණය (Eco System Conservation & Management) ව්‍යාපෘතිය අමාත්‍යාංශය යටතේ 2017 වර්ෂයේ ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ඇමරිකානු ඩොලර් මිලියන 45 ක ලෝක බැංකු ණය ආධාර මත 2021 වර්ෂය තෙක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු අතර පසුව එය ඇමරිකානු ඩොලර් මිලියන 35 ක් සඳහා සැලසුම් අනුමත වී තිබුණි. මෙම ව්‍යාපෘතිය සැලසුම් කිරීම සහ කාර්ය සාධනය පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ව්‍යාපෘතිය සැලසුම් කිරීම

i. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව වර්ෂ 03 ක් සඳහා අමාත්‍යාංශ ලේකම් අනුමත කළ ප්‍රධාන ප්‍රසම්පාදන සැලසුමකට අනුව ණය මුදල් පූර්ණව උපයෝජනය වන අයුරින් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවද මෙම ව්‍යාපෘතිය සඳහා මූලික ණය මුදල වූ ඇ.ඩො.මිලියන 45 සඳහා හෝ පසුව සංශෝධනය කළ ණය මුදල වන ඇ.ඩො.මිලියන 35 සඳහා එවැනි සැලසුමක් පිළියෙල කර නොතිබුණි.

ii. 2019 මාර්තු 15 දිනැති හා අංක 1/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9 ඡේදය සහ ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතේ 2.1.1 ඡේදය ප්‍රකාරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කමිටුවක් (Project Steering Committee) පිහිටුවිය යුතු ය. සම්බන්ධිත ආයතන සඳහා ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන් සැපයීම හා එක් එක් ආයතනවල ව්‍යාපෘති ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම මෙම කමිටුවේ කාර්යයන් වන අතර, අවම වශයෙන් කාර්තුවකට එක් වරක්වත් රැස් වී ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කළ යුතු වුවද 2016 වර්ෂයේ සිට 2021 නොවැම්බර් මස දක්වා අදාළ කමිටුව රැස්ව තිබුණේ වාර 06 ක් පමණි. තවද ඉහත චක්‍රලේඛය පරිදි භාණ්ඩාගාර ලේකම් විසින් නම් කරනු ලැබූ නියෝජිතයෙකු මෙම කමිටුවට ඇතුළත් විය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

iii. වටිනාකම ඇ.ඩො.මිලියන 45 ක් වූ සංරචක 04 ක් වෙනුවෙන් විධිමත් ප්‍රතිපාදන පරිදි වෙන්කර තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා පසුව ඇ.ඩො. මිලියන 35 ක් දක්වා ප්‍රතිපාදන අඩු කර නැවත සැලසුම් වෙනස් කිරීමේදී පරිසර සංරක්ෂණය සඳහා අතිශය වැදගත් වන ව්‍යාපෘති සංරචක සඳහා ප්‍රතිපාදන එකතුව මුල් සැලැස්මට සාපේක්ෂව සියයට 38 කින් අඩු කර ආයතන කුසලතාවය හා ආයෝජන ධාරිතාව වැඩිකිරීම සඳහා වන සංරචකය සඳහා වන ප්‍රතිපාදන ඇ.ඩො. මිලියන 6.6 සිට 17.88 දක්වා එනම් ව්‍යාපෘති වටිනාකමෙන් අර්ධයකට වඩා වැඩි ප්‍රමාණයක් වන සමස්ත ප්‍රතිපාදනයෙන් සියයට 51 ක් දක්වා සියයට 36 කින් ප්‍රතිපාදන වැඩි කර තිබුණි. මෙමෙහින් ව්‍යාපෘති හරයන්ට සිදුවන බලපෑම් පිළිබඳව ඇගයීමක් සිදුකර Project Steering Committee මඟින් නිර්දේශ ලබා ගැනීමකින් තොරව මෙලෙස සංරචක අතර ප්‍රතිපාදන මාරු කිරීම සිදු කර තිබුණි. ඒ අනුව මූලික ව්‍යාපෘති අරමුණ වන පරිසර පද්ධතිවල කළමණාකරණය වැඩි කිරීම තුළින් එම පරිසර පද්ධති සංරක්ෂණය කර එමඟින් ජනතාවට ප්‍රතිලාභ ලබාදීම අත්පත් කර ගැනීම යන ප්‍රධාන අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වන බව නිරීක්ෂණය විය.

(ආ) **ව්‍යාපෘතියේ කාර්ය සාධනය**

i. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන වටිනාකම රු.මිලියන 1,311 ක් වූ ව්‍යාපෘති 75 ක් අතරින් වටිනාකම රු.මිලියන 671 ක් වූ ව්‍යාපෘති 35 ක භෞතික ප්‍රගතිය සියයට 50 ක් හෝ ඊට අඩු මට්ටමක පවතින අතර විගණිත දිනය වන විට වටිනාකම රු.මිලියන 22 ක් වූ ව්‍යාපෘති 07 ක් අවලංගු කර තිබුණි.

ii. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන වටිනාකම රු.මිලියන 878.76 ක් වූ ව්‍යාපෘති 273 ක් අතුරින් රු.මිලියන 433.6 ක් වූ ව්‍යාපෘති 106 ක භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු අගයක පවතින අතර වටිනාකම රු.මිලියන 12.07 ක් වූ ව්‍යාපෘති 05 ක් අවලංගු කිරීමද අදාල කාලය තුල සිදු වී තිබුණි.

iii. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් ක්‍රියාත්මක වන වටිනාකම රු.මිලියන 2,598 ක් වූ ව්‍යාපෘති 34 ක් අතරින් ව්‍යාපෘති 28 ක භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

iv. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගම්මාන 13 ක විදුලිවැට ඉදි කිරීම සඳහා හඳුනා ගෙන තිබුණද ගම්මාන තුනක් වෙනුවෙන් විදුලි වැට ඉදි කිරීම සම්බන්ධ කිසිදු ක්‍රියාමාර්යක් ගෙන නොතිබුණි. එසේම වැටවල් තුනක් සඳහා පමණක් උපකරණ ලබා ගෙන තිබුණු අතර ඒ අතරින්ද එක් විදුලි වැටක ඉදි කිරීම පමණක් අවසන් කර තිබුණි. එසේම කුරුණෑගල දිස්ත්‍රික්කයේ හඳුනාගත් ප්‍රදේශ 25 ක් අතරින් ගම්මාන 15 ක් සඳහා සියළු විදුලි වැට උපකරණ මිලදී ගෙන තිබියදීත් 2022 අප්‍රේල් මස වන විටත් විදුලි වැට 10 ක පමණක් ඉදි කිරීම් කටයුතු අවසන් කර තිබුණි.

v. යාල ජාතික උද්‍යානයේ වැව් හා කාර්ය මණ්ඩල අවශ්‍යතා සඳහා ජලය සැපයීමට ඉදි කරන කිලෝමීටර් 18 ක දිගින් යුත් පිවිසි නළ පද්ධතිය ඉදි කිරීම් කටයුතු 2019 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ නමුත් එම වර්ෂයේදී සිදු නොකිරීම හේතුවෙන් 2021 වර්ෂයේදී කිලෝමීටරයක් සඳහා පිරිවැය රු.1,438,759 කින් වැඩි වී තිබුණු අතර ඒ අනුව එම කිලෝමීටර් 9 සඳහා රු.12,948,831 ක අතිරේක වියදමක් රජයට දැරීමට සිදු වී තිබුණි.

vi. උක්ත ජලනල ව්‍යාපෘතියේ ජලනල එලීම (අයිතම D1) වෙනුවෙන් බිල්පත් අංක 03 දක්වා සමුච්චිත ප්‍රමාණය ලෙස මීටර් 19,169 කට රු.29,137,062 ක මුදලක් ගෙවා තිබුණි. එසේ වුවද එම ගෙවීම් සිදු කිරීමේදී උක්ත ව්‍යාපෘතියේ ජලනල එලීම සාර්ථකව සිදු කර තිබේද යන්න පරීක්ෂා කිරීම උදෙසා SIDA/SCA/3/2 5.43 අනුව Hydraulic Pressure Test (පීඩන පරීක්ෂණ) සිදු කිරීම අනිවාර්ය වුවද, උක්ත ගෙවීම් සිදු කිරීමේදී පීඩන පරීක්ෂණ සහතික පරීක්ෂාවකින් තොරව මීටර් 11,123 ක ප්‍රමාණයකට එනම් රු.16,906,960 ක් ගෙවීම් කර තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

අමාත්‍යාංශයේ පුරප්පාඩු තනතුරු 28 ක් වූ අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 18 ක්, තෘතීයික මට්ටමේ තනතුරු 01 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 08 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 01 ක් පැවතුණු අතර ප්‍රාථමික මට්ටමේ අතිරික්ත තනතුරු 01 ක් පැවතුණි. විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	හිඟ සේවක සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
ඡ්‍යෙෂ්ඨ මට්ටම	30	12	18	-
තෘතීයික මට්ටම	03	02	01	-
ද්විතියික මට්ටම	46	38	08	-
ප්‍රාථමික මට්ටම	17	17	01	01
	---	---	---	---
	96	**69**	**28**	**01**
	==	==	==	==

ඩී.වී. චන්ද්‍රලතා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය : 424

පටුන

		පිටුව
පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	85
පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	91
පරිච්ඡේදය 03 -	වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	103
පරිච්ඡේදය 04 -	කාර්යසාධන දර්ශක	110
පරිච්ඡේදය 05 -	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	111
පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	111
පරිච්ඡේදය 07 -	අනුකූලතා වාර්තාව	113

1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීම

1.1 හැදින්වීම

අංක 2187/27 හා 2020.08.09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටවූ අතර ඒ යටතේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගැසට් කළ අතර, අංක 2194/74 හා 2020.09.25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් උක්ත දෙපාර්තමේන්තු දෙකට අමතරව ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවද මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ විෂයය පථය යටතට ඇතුළත් කර ඇත.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

''තිරසාරව සංවර්ධිත ශ්‍රී ලංකාවක්''

මෙහෙවර

''ස්ථානීය වෘක්ෂලතා සංරක්ෂණය සහ ස්ථානීය හා විතැන් සත්ත්ව සංරක්ෂණය තිරසාරව කළමනාකරණය සඳහා නායකත්වය සැපයීම"

1.3 ප්‍රධාන කාර්යයන්

1. වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත '' වනජීවී ආරක්ෂණ හා වන සංරක්ෂණය'' ඇති කිරීම සඳහා අදාල නීති සහ අණපනත් වලට අනුකූලව වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන විෂයයට අදාල ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම.
2. ජාතික අයවැය , රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
3. දෙපාර්තමේන්තු හා ව්‍යාවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

1.3.1 සුවිශේෂී ප්‍රමුඛතා

1. හරිත ආවරණය පුළුල් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
2. වගුරු බිම් හා කඩොලාන පද්ධති සංරක්ෂණය කරමින් ඒවා විනාශ කරන මානව ක්‍රියාකාරකම් පාලනය කිරීම.
3. සෝදාපාලු හා නිසරු බිම් හඳුනා ගෙන, පොල්,වෙනත් බෝග,තෘණ හා කෘෂි වන වගා උද්‍යාන ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම.
4. කර්මාන්තශාලා ආශ්‍රිතව වන වගා තීරු, නාගරික රුක් ගොමු, අධිවේගී හා මහා මාර්ගද ඇතුළත්ව මහ දෙපස රුක්රෝපණ, රජයේ කාර්යාල ආශ්‍රිත ඉඩම්, මහල් නිවාස ආශ්‍රිත රුක් වගා, තුරු උයන් හා ගෘහාශ්‍රිත කෘෂි වන වගා දිරිගැන්වීම.
5. කැලෑ නැවත වගා කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
6. ගංගා ආශ්‍රිත හා භූමිය ආශ්‍රිත නිශ්චිත වැලි කැණීම් තීරු ස්ථාපනය කිරීම හා ගංගා නිම්න සංවර්ධනය
7. හරිත සහ සුහුරු නගර හා වාසස්ථාන සංකල්පය ඇති කිරීම හා ප්‍රචලිත කිරීමත්, පාරිසරික සංවේදී ජනතාවක් බිහිකිරීම සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
8. අලි මිනිස් ගැටුම වැලැක්වෙන පරිදි ගම් හා ජනාවාස ආරක්ෂාව සඳහා අලිවැට, අගල් ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් ග්‍රාමීය ප්‍රජා දායකත්වයෙන් ක්‍රියාත්මක කිරීම.
9. වනජීවීන්ගේ රැකවරණය සඳහා ඔවුන්ට වෙන්වූ භූමි ආරක්ෂා කිරීම, එම ප්‍රදේශ වල වැව්, ගංගා හා කැලෑ සංවර්ධනය කිරීම හා වන සතුන්ගේ ආහාර ප්‍රවර්ධනයට අවශ්‍ය වගාවන් ඇති කිරීම
10. සත්ත්ව සුභසාධනය හා සංරක්ෂණ කටයුතු සිදුකිරීම

1.4 සංවිධාන සටහන


ලේකම්
අධ්‍යක්ෂ ජනරාල් කෘෂිකර්ම (කෘ.අ.ජ. - ඒ.ඉල්.)
අධ්‍යක්ෂ ජනරාල් ඉංජිනේරු (ඉ.අ.ජ. - ඒ.ඉල්.)
අධ්‍යක්ෂ ජනරාල් ක්‍ෂීරපථ සංවර්ධන (ක්‍ෂී.අ.ජ. - ඒ.ඉල්.)
අධ්‍යක්ෂ ජනරාල් පාලන (ප.අ.ජ. - ඒ.ඉල්.)
ප්‍රධාන අභ්‍යන්තර විගණක (ප්‍ර.අ.ජ. - I)
ප්‍රධාන ගණකාධිකාරි (ප්‍ර.අ.ජ. - I)
අධ්‍යක්ෂ ක්‍ෂුද්‍ර ජීවීවේදය (ක්‍ෂු.අ.ජ. - I)
අධ්‍යක්ෂ ඉංජිනේරු (ඉ.අ.ජ. - I)
අධ්‍යක්ෂ ක්‍ෂීරපථ සංවර්ධන (ක්‍ෂී.අ.ජ. - I)
අධ්‍යක්ෂ පාලන (ප.අ.ජ. - I)
ගණකාධිකාරි (ග.අ.ජ. III/ II)
ඉංජිනේරු (ඉ.අ.ජ. -III/II)
ඉංජිනේරු (ඉ.අ.ජ. -III/II)
ස.අ/කි.අ ක්‍ෂුද්‍ර ජීවීවේදය (ක්‍ෂු.අ.ජ. -III/II)
සහකාර අධ්‍යක්ෂ (ප.අ.ජ. - III/II)
සහකාර අධ්‍යක්ෂ (ප.අ.ජ. - III/II)
ස.අ.ලේ පාලන (ප.අ.ජ. -II/III)
ස.අ.ලේ පාලන (ප.අ.ජ. -II/III)
ඉංජිනේරු (ඉ.අ.ජ. - I)
ගණකාධිකාරි (ග.අ.ජ. - I)
අධ්‍යක්ෂ ක්‍ෂුද්‍ර ජීවීවේදය (ක්‍ෂු.අ.ජ. - I)
අධ්‍යක්ෂ (ප.අ.ජ. - I)
අධ්‍යක්ෂ සංවර්ධන (ප.අ.ජ. - I)
අධ්‍යක්ෂ (ප.අ.ජ. - I)
ස.අ.ලේ (ප.අ.ජ. - I)
සංවර්ධන නිලධාරි 0
සංවර්ධන නිලධාරි 5
සංවර්ධන නිලධාරි 2
සංවර්ධන නිලධාරි 0
සංවර්ධන නිලධාරි 0
සංවර්ධන නිලධාරි 6
පරිපාලන නිලධාරි
සංවර්ධන නිලධාරි 4
කළමනාකරණ සහකාර 3
කා.කා.ස 2
ටික්ෂරු 5
කා.කා.ස 0
කා.කා.ස 0
කා.කා.ස 0
කා.කා.ස 0
කා.කා.ස 0
කා.කා.ස

1.5 රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

1.6 රාජ්‍ය අමාත්‍යාංශ කාර්යය භාරය ක්‍රියාත්මක කරන අංශයන්

- **පාලන අංශය**

රාජ්‍ය අමාත්‍යාංශය වෙත පැවරුන කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන මානව සම්පත කළමනාකරණය හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු වල ආයතන කටයුතු ඉටු කිරීමට අවශ්‍ය සහය ලබා දීම පාලන අංශය මගින් සිදු කරනු ලබයි.

- **සැලසුම් අංශය**

අමාත්‍යාංශයේ සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීම මෙම අංශයේ අරමුණ වේ. ඒ අනුව ජාතික අවශ්‍යතාවන් හඳුනාගනිමින් සංවර්ධන කටයුතු සැලසුම් කෙරෙන අතර එකී සැලසුම්, අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු මඟින් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ. වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සැලසුම් කටයුතුවල නිරතවීම මෙම අංශය මඟින් සිදු කරනු ලැබීය

- **සංවර්ධන අංශය**

මෙම අංශය මඟින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු මඟින් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු විධිමත්ව හා ඵලදායීව ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම හා ඉදිරි සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම සිදු කිරීම.

- **මූල්‍ය අංශය**

පාර්ලිමේන්තු මූල්‍ය පාලනය උත්තරදායී බව හා බැඳුනු වනජීවී හා වන සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ලෙස ඉටු කළ යුතු අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මූල්‍ය පාලන කාර්යභාරයට අවශ්‍ය සෘජු සහාය දැක්වීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය යි.
ඒ අනුව, අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මූල්‍ය පාලන කටයුතු සැලසුම් කිරීම, සංවිධානය කිරීම මෙහෙයවීම හා ඊට අදාළ පාලන කටයුතු මෙම අංශය මගින් ඉටු කරනු ලබයි.
වාර්ෂික අයවැය ලේඛනය හා විසර්ජන ගිණුමට අදාළ වන ආදායම් වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ඒවා මහා භාණ්ඩාගාරයේ අදාළ දෙපාර්තමෙන්තු සමග සම්බන්ධීකරණය කිරීම, වාර්ෂික මුදල් ප්‍රවාහ පාලනය, අමාත්‍යාංශයට අවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන කටයුතු, අමාත්‍යාංශය යටතේ වන ආයතනවල ප්‍රසම්පාදන කටයුතුවලට සහය වීම පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගබඩාව පාලනය, ස්ථාවර වත්කම් කළමනාකරණය, ගෙවීම් කටයුතු සිදුකිරීම, කාලීන මූල්‍ය වාර්තා, මූල්‍ය ප්‍රකාශන, ඇතුලුව විසර්ජන ගිණුම පිළියෙල කිරීම සහ විගණකාධිපති හා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා සම්බන්ධ කටයුතු මෙම අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සම්බන්ධයෙන් ක්‍රියා කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

1.7 ප්‍රතිපාදන සාරාංශය

ආයතනය	මූලධන (රු.මි.)				පුනරාවර්තන(රු.මි)			මූලධන + පුනරාවර්තන මුළු එකතුව (රු.මි)
	ඒකාබද්ධ අරමුදල	විශේෂ අයවැය යෝජනා	දෙපාර්තමේන්තු අරමුදල	මූලධන එකතුව	ඒකාබද්ධ අරමුදල	දෙපාර්තමේන්තු අරමුදල	පුනරාවර්තන එකතුව	
වනජීවී හා වන සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය	12.30	-	-	**12.30**	116.25	-	**116.25**	**128.55**
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	384.50	2,370.00	413.60	**3,168.10**	1,773.30	959.61	**2,732.91**	**5,901.01**
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	870.90	934.10	40.40	**1,845.40**	1,670.30	-	**1,670.30**	**3,515.70**
ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව	720.80	-	88.02	**808.82**	566.00	661.53	**1,227.53**	**2,036.35**
එකතුව (රු.මි.)	**1,988.50**	**3,304.10**	**542.02**	**5,834.62**	**4,125.85**	**1,621.14**	**5,746.99**	**11,581.61**

2 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 සංවර්ධන වැඩසටහන් ප්‍රගතිය 2021 - ප්‍රගති සාරාංශය

ඒකාබද්ධ අරමුදල ප්‍රගතිය

ආයතනය	ප්‍රතිපාදන (රු.මි.)	සත්‍ය වියදම (රු.මි.)	වියදම %
වනජීවී හා වන සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය	12.30	7.14	58.0%
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	384.50	121.23	31.5%
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	870.90	736.80	84.6%
ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව	720.80	293.80	40.8%
එකතුව	**1,988.50**	**1,158.97**	**58.3%**

2.1.2 විශේෂ අයවැය යෝජනා මූල්‍ය ප්‍රගතිය

ආයතනය	ප්‍රතිපාදන (රු.මි.)	සත්‍ය වියදම (රු.මි.)	වියදම %
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	2,370.00	841.07	35.5%
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	934.10	551.55	59.0%
එකතුව	**3,304.10**	**1,392.62**	**42.1%**

2.1.3 දෙපාර්තමේන්තු අරමුදල් මූල්‍ය ප්‍රගතිය

ආයතනය	ප්‍රතිපාදන (රු.මි.)	සත්‍ය වියදම (රු.මි.)	වියදම %
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	413.60	408.44	99%
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	-	-	-
ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව	88.02	16.32	19%
එකතුව	**501.62**	**424.76**	**84.68%**

2.1.4 දෙපාර්තමේන්තු සංචාරක පැමිණීම හා ආදායම -2021

ආයතනය	සංචාරක පැමිණීම			ආදායම (රු.මි.)			එකතුව (රු.මි.)
	දේශීය	විදේශීය	එකතුව	දේශීය	විදේශීය	වෙනත්	
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	539,305	53,512	592,817	26.94	135.31	133.62	295.87
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	137,977	9,645	143,931	6.45	10.31	3.04	19.80
ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව	530,877	13,777	544,654	69.75	25.28	14.54	109.57
මුළු එකතුව	**1,208,159**	**76,934**	**1,285,093**	**103.14**	**170.90**	**151.20**	**425.24**

2.2 රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු වල භෞතික ප්‍රගතිය

2.2.1 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය

භෞතික ප්‍රගතිය

2021 වසරේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලසම අනුව ඒම ක්‍රියාකාරකම් වල 2021.12.31 දිනට ලබා ඇති භෞතික ප්‍රගතිය පහත පරිදි වන අතර ,කෝවිඩ් 19 වසංගත තත්ත්වය නිසා ඉලක්ක සපුරා ගැනීමේදී යම් ප්‍රමාදයන් ද ඇති විය.

රජයේ ඒකාබද්ධ අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

1. රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

- 2019 වසරේ ආරම්භ කරන ලද විල්පත්තුව ජාතික උද්‍යානයේ සනීපාරක්ෂක කටයුතු වැඩි දියුණු කිරීම සහ කුමන උද්‍යානයේ සනීපාරක්ෂක කටයුතු වැඩි දියුණු කිරීම අවසන් කර ඇත.
- ජල සැපයුම් පද්ධති වැඩි දියුණු කිරීම යටතේ කාර්යාල සහ නිල නිවාස 05 ක් ජල සැපයුම් පද්ධති නවීකරණය කර ඇත.
- මීට අමතරව කාර්යාල 02 (කුමන සහ ගල්ඔය ජාතික උද්‍යානවල) සනීපාරක්ෂක කටයුතු වැඩි දියුණු කිරීම් සිදු කර ඇත.
- පොළොන්නරුව කුන්දෑවල බීට්ටු කාර්යාලය සඳහා විදුලි සැපයුම් පද්ධතියක් ස්ථාපිත කරන ලදී.

2. රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය කිරීම

- රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය යටතේ යාල, කුමණ , මාඳුරුඔය ජාතික උද්‍යානවල හා තබ්බෝව අභයභූමියේ වැව් 09ක ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර අවසන් කර ඇත.
- බූන්දල ජාතික උද්‍යානයේ හා තබ්බෝව අභයභූමියේ හෙක්ටයාර 40ක ආක්‍රමණ ශීලී ශාක ඉවත්කර වන සතුන්ගේ වාසස්ථාන වැඩි දියුණු කිරමට පියවර ගන්නා ලදී.
- කුමන, වස්ගමුව, මින්නේරිය ජාතික උද්‍යාන තුළ හෙක්ටයාර 47.2 ක යටිරෝපන ඉවත්කර වන සතුන්ගේ වාසස්ථාන වැඩි දියුණු කිරමට පියවර ගන්නා ලදී.
- හොරොව්පතාන, කුමණ, වස්ගමුව ජාතික උද්‍යාන තුළ හෙක්ටයාර 78 ක තෘණ භූමි කළමනාකරණය තුලින් වන සතුන්ගේ අහාර අවශ්‍යතා සපුරාලීමට පියවර ගන්නා ලදි.

3. රක්ෂිත ප්‍රදේශවල මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ රක්ෂිත තුල වනජීවී සම්පත් වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සහ සංචාරක පහසුකම් වැඩි දියුණු කිරීමේ ක්‍රියා මාර්ගක් ලෙස වාර්ෂිකව මාර්ග පද්ධතිය ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සඳහා මාර්ග ඉදිකිරීම හා නඩත්තු කිරීම සිදුකරනු ලබයි.

- ජාතික උද්‍යානවල මාර්ග සංවර්ධනය කිරීම යටතේ යාල, විල්පත්තුව, වස්ගමුව ජාතික උද්‍යානවල මාර්ග පද්ධතියේ කි.මී. 103ක වැඩි දියුණු කිරීම අවසන් කර ඇත.

4. විදුලි වැටවල් ඉදි කිරීම

ශ්‍රී ලංකාවේ ජනගහනය වර්ධනය වීම හා සංවර්ධන ව්‍යාපෘති සඳහා කැලෑ එලි කිරීම සීඝ්‍රයෙන් සිදුවන බැවින් වන අලින්ගේ නිජබිම් අහිමි වීම හේතුවෙන් වනඅලි ගම්වැදීම වසර ගණනක් තිස්සේ නොකඩවා ඉහල යමින් පවතී. මෙම ගැටුම අවම කිරීම සඳහා ඉදිකරන ප්‍රධාන භෞතික බාධකයක් ලෙස විදුලි වැට දැක්විය හැකිය. මෙම වැඩසටහන සඳහා 2021 වසරේදි ඒකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදන යටතේ පහත සඳහන් කාර්යයන් සිදු කර ඇත.

- 2021 වසරේ අවිච්ඡේද කාර්යන් ලෙස තවත් කි.මී. 79ක් දිග විදුලි වැටවල් ඉදි කිරීම මේ වසරේ දී සම්පූර්ණයෙන් අවසන් කර ඇත.
- මේ වනවිට කි.මී. 4633 ක් දිග විදුලි වැටවල් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට භාර දී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ නඩත්තු කටයුතු සිදු කරමින් පවති.

<u>ඒකාබද්ධ අරමුදල - 2021 අයවැය යෝජනා හරහා වෙන් වූ ප්‍රතිපාදන වල ප්‍රගතිය</u>

1. විදුලි වැට ඉදි කිරීම

- මහනුවර දිස්ත්‍රික්කය තුළ කි.මී. 40ක් දිග විදුලි වැට ඉදි කිරීම අවසන් කර ඇත.
- ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ වනඅලි සංරක්ෂණ උද්‍යානය වටා අගල් කැපීම කි.මී. 28ක් අවසන් කර ඇත.
- ඌව කලාපයේ විදුලි වැටට සමාන්තරව තවත් කි.මී. 07ක අගලක් ඉදි කර ඇත
- අම්පාර දිස්ත්‍රික්කයේ කසළ පිළිසරු ඒකක වටා කි.මී. 1.5ක අගල් කැපීම අවසන් කර ඇත.
- එල්ලෙන විදුලි වැටවල් සඳහා පර්යේෂණ සිදු කරන අතර අම්පාර දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කි.මී. 20ක් දිග එල්ලෙන විදුලි වැටක් ඉදි කරමින් පවතී. එහි කි.මී. 04ක වැඩ අවසන් කර ඇත
- දිස්ත්‍රික්ක කිහිපයක කි.මී. 402ක පමණ දිග විදුලි වැට මාර්ග සුද්ද කර ඇත.

2. රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය කිරීම

- ජාතික උද්‍යාන හා අභයභූමි තුළ හෙක්ටයාර 254ක ආක්‍රමණ ශීලි ශාක ඉවත්කරීම හා හෙක්ටයාර 617.6 ක යටිරෝපන ඉවත්කර වන සතුන්ගේ වාසස්ථාන වැඩි දියුණු කිරමට පියවර ගන්නා ලදී.
- මිනනේරිය, කවුඩුල්ල, විල්පත්තුව, හොරොව්පතාන, කුමන හා ලාහුගල යන ජාතික උද්‍යාන හා අභය භූමි තුළ හෙක්ටයාර 617.6 ක තෘණ භූමි කළමනාකරණය තුලින් වන සතුන්ගේ අහාර අවශ්‍යතා සපුරාලීමට පියවර ගන්නා ලදි.
  යාල ජාතික උද්‍යානයේ වැව් 01 ක ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලදි.

3. වනඅලි-මිනිස් ගැටුම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම

- වනඅලි තර්ජන සහිත ප්‍රදේශවල වනඅලි-මිනිස් ගැටුම පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්113ක් සහ විදුලි වැට නඩත්තුව පිළිබඳව සිවිල් ආරක්ෂක හටයින් සඳහා දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් 57 ක් පවත්වා අවසන් කර ඇත.
- වනඅලි - මිනිස් ගැටුම අවම කිරීම සඳහා ක්‍රියාකාරී වැඩසටහනක් සකස් කිරීම පිළිබඳ විද්වත් කතිකාව 2021.03.24 දින SLIDA ආයතනයේදී පවත්වන ලදී.
- වනඅලි - මිනිස් ගැටුම අවම කිරීම සඳහා පර්යේෂණ අත් හදා බැලීම් යටතේ වනඅලි ගම් වැදීම වැළක්වීම සඳහා හඳුන්කුරු දැල්වීම සහ ජීව වැටක් සඳහා හණ පැල 3000ක් සිටුවීම සිදුකර ඇත.

2.2.2 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වල භෞතික ප්‍රගතිය

වන සංරක්ෂණය හා සංවර්ධනය මූලික කරගත් කාර්යයන් සමුදායක් දියත්කල අතර 2021.12.31 දිනට ඒවායේ කාර්ය සාධනය පහත සංරචක ඔස්සේ විස්තර කෙරේ.

<u>රජයේ ඒකාබද්ධ අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්</u>

1.වන ආවරණය ඉහළ නැංවීම.

- ජල පෝෂක ප්‍රදේශ ලෙස වැදගත් වන භායනයට පත් කඳුමුදුන් මත හෙක්ටයාර 30ක පැළ තවාන් නඩත්තු කරමින් පවතී. පයිනස් වන වගා පුළුල් පත්‍ර සහිත වන වගා බවට පත්කිරීම සඳහා පැල තවාන් නඩත්තු කිරීම සිදු කළ අතර පසුගිය වසර වල එසේ පුළුල් පත්‍ර ලෙස පරිවර්තනය කරන ලද වන වගා හෙක්ටයාර 225.4ක් නඩත්තු කර පවත්වා ගෙන යන ලදි.
- විවිධ හේතූන් මත භායනයට පත් ස්වභාවික වනාන්තර කොටස්වල ගුණාත්මය වැඩිකිරීමේ අරමුණින් ස්වභාවික පුනර්ජනනය වැඩිකිරීම මගින් වනාන්තර ලෙස ස්ථාපනය කරන ලද අතර පසුගිය වසර තුළ එසේ ස්ථාපනය කරන ලද වනාන්තර බිම් හෙක්ටයාර 99.08ක් නඩත්තු කර පවත්වාගෙන යන ලදි.

2. වන ආවරණය පවත්වාගෙන යාම

පවත්නා වනාන්තර සුරක්ෂිත කර ගනිමින් වන ආවරණය යථාපරිදි පවත්වාගෙන යාම අරමුණු කරගෙන ස්වාභාවික වනාන්තර කිලෝ මීටර් 2,762.302ක් මිනුම් කර මිනුම් සිතියම් සකස් කරන ලදී. එමෙන්ම කිලෝමීටර් 1166.685 ක් වනාන්තර මායිම් සලකුණු කර ඇත. එමෙන්ම දැන්වීම් පුවරු 407 සකසා ඇත.

3. වන ව්‍යාප්ති හා දැනුවත් කිරීම්

පරිසර සංරක්ෂණය,ජල අවශෝෂණය,ජෛව විවිධත්වය සංරක්ෂණයෙහිලා පාසල් සිසුන් හා ප්‍රජාව නැඹුරු කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දීප ව්‍යාප්තව දැනුවත් කිරීමේ වැඩසටහන් 342ක් පවත්වන ලද අතර පාසල් හා ප්‍රජා දායකත්වයෙන් රුක්රෝපණ වැඩසටහන් 400ක් ක්‍රියාත්මක කරන ලදි. මේ වන විට ගෙවතු 10,149ක් සංවර්ධනය කර ඇති අතර ගස් කළමනාකරණ වැඩසටහන් 204ක් සිදු කර ඇත. පරිසර සංරක්ෂණය, ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය , ජෛව විවිධත්වය සංරක්ෂණයෙහිලා පාසල් සිසුන් හා ප්‍රජාව නැඹුරු කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දීප ව්‍යාප්තව දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු, ගිනි කළමනාකරණ වැඩසටහන්, ශ්‍රමදාන, ක්ෂේත්‍ර චාරිකා, පරිසර කඳවුරු, හා වෙනත් විශේෂ වැඩසටහන් 770 ක් පවත්වන ලද අතර පාසල් හා ප්‍රජා සහභාගිත්වයෙන්, මාර්ග දෙපස, ජලාධාර අවට හා ගං ඉවුරුවල, පාසැල් හා රාජ්‍ය ආයතන භූමිවල, ආගමික සිද්ධස්ථාන භූමිවල මෙන්ම වෙනත් ස්ථානවල රුක්රෝපණ වැඩසටහන් 798 ක් ක්‍රියාත්මක කරන ලදි.





4. පරිසර සංචාරක කටයුතු

හුරුළු, සිංහරාජය, පිටදෙනිය, නකල්ස්, ඩීන්ස්ටන්, කුරුළු රක්ෂිතය,කන්දෙ ඇල තොරතුරු මධ්‍යස්ථානය තෙවන කාර්තුව තුල නඩත්තු කළ අතර නව සංචාරක ස්ථාන හඳුනා ගැනීම සංවර්ධනය කිරීම හා නුවරගල ප්‍රවේශපත්‍ර කවුළුව, ඇල්ලරොක්හි සංචාරක බංගලා පහසුකම් ඉදිකිරීම්, ගල්ඔය පිවිසුම් දොරටුව හා ප්‍රවේශපත්‍ර කවුළුව ඉදිකිරීම අරඹා ඇත. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පාලනය වන පාරිසරික සංචාරක ගමනාන්ත වල දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා වන යටිතල පහසුකම් හා සේවා වැඩි දියුණු කිරීමට 2021 වර්ෂයේ පාරිසරික ගමනාන්ත 12 ක හා කඳවුරු භූමි 03 ක නඩත්තු කටයුතු හා සංවර්ධන කටයුතු සිදු කරන ලදී. ඒ අනුව ස්වභාවික මංපෙත් නඩත්තුව, සිංහරාජයේ කුරුළු නැරඹුම් මැදිරියක් ඉදිකිරීම, බලංගොඩ හිරිකටු ඔය කඳවුරු භූමියේ කඳවුරු කූඩාරමක් ඉදිකිරීම, තුඹතැන්න අධ්‍යාපන හා තොරතුරු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම, කන්නෙලිය දේශන ශාලාව අලුත්වැඩියා කිරීම, පිටදෙනිය සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයේ ප්‍රවේශ මාර්ගය වැඩි දියුණු කිරීම, බදුල්ල ඇල්ලගල කඳවුරු භූමියේ කඳවුරු කූඩාරමක් ඉදිකර ජල පහසුකම් සැපයීම හා වැසිකිලි පද්ධතිය සංවර්ධනය කිරීම, අම්පාර නුවරගල පාරිසරික සංචාරක කලාපයේ පොල්ලේ බැද්ද පිවිසුමේ ප්‍රවේශ පත්‍ර කවුළුව ඉදි කිරීම, පොලොන්නරුව දිසාවේ ගල් ඔය පාරිසරික උද්‍යානය සඳහා ප්‍රවේශපත්‍ර කවුළුව ඉදිකිරීම වැනි ප්‍රධාන සංචාරක යටිතල පහසුකම් හා සංවර්ධන කටයුතු ඉටු කරන ලදී.



සිංහරාජය කුඩව - විහඟ කැදැල්ල කුරුළු නැරඹුම් මැදිරිය



කන්නෙලිය දේශන ශාලාව

5. වන විද්‍යා පර්යේෂණ

පරීක්ෂණාත්මක හා සංවර්ධනාත්මක පර්යේෂණයන් තුළින් ජාතික වන ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන් සඳහා ජාතික ප්‍රමුඛතාවයන්ට අනුකූලව පරීක්ෂණ වැඩසටහන් සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම මෙමගින් සිදු කෙරේ.

- **පර්යේෂණ වැඩසටහන්**

නව පර්යේෂණ වගා සඳහා පැල සෑදීම, පොහොර යෙදීම හා බීජ වර්ග 5 ක ප්‍රරෝහණ අධ්‍යයනය. වන ව්‍යාප්ති කටයුතු සඳහා අවශ්‍ය කරන තවාන් පැළ 417,696 ක සංඛ්‍යාවක් 2021 වසර තුළ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පැළ තවාන්වල නිපද වන ලදී. නිපදවන ලද සම්පූර්ණ තවාන් පැළ සංඛ්‍යාවෙන් පැළ 107,909 ක් අලෙවි කරන ලද අතර 163,448 ක් විවිධ රුක් රෝපණ වැඩසටහන් සඳහා හා රාජ්‍ය සහ වෙනත් විවිධ ආයතන වෙත නොමිලයේ ලබාදෙන ලදි. තවත් කොටසක් ජාතික රුක් රෝපණ වැඩසටහන් හා ගෙවතු සංවර්ධන වැඩසටහන් වැනි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා යොදා ගන්නා ලදී.





<u>විශේෂ අයවැය යෝජනා වැඩසටහන් ප්‍රගතිය</u>

- **අක්කර 15,000 වන වගා කිරීම**

1) තුරු ආවරණය වැඩි කිරීම සඳහා හෙක්ටයාර් 309.21 ක වාණිජව වගා කිරීමක් සිදු කර ඇත.
2) කෘෂි වන වගා ස්ථාපනය කිරීම යටතේ හෙක්ටයාර් 1133.08 ක බිම් ප්‍රමාණයක් ගොවි වන වගා කිරීමක් සිදු කර ඇත.
3) ආක්‍රමණශීලී ශාක ඉවත් කර වනාන්තර ප්‍රතිස්ථාපනය කිරීම හෙක්ටයාර් 371 ක සිදු කර ඇත.
4) වැව් තාවුළු සංරක්ෂණය සඳහා මී පැළ 2500ක් හා කුඹුක් පැළ 500ක් සිටුවා ඇත.
5) කඩොලාන ප්‍රතිස්ථාපනය අක්කර 254ක සිදු කර ඇත.

- **නාගරික ඉඩම් වල වන ඝනත්වය වැඩි කිරීම**

1. නාගරික තුරු ගොමු ඇතිකිරීම යටතේ ජෝජ් ආර්. ද සිල්වා මාවතේ රූට් බෝල් පැළ 16ක්ද ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ රූට් බෝල් පැළ 22ක්ද සිටුවා ඇත.
2. දෙපාරම මධ්‍යම පැළ තවානේ 12"X18" ප්‍රමාණයේ පැළ , මේ වන විට ඉන් පැළ 60,000 ක් නිෂ්පාදනය කර ඇත.
3. තවාන් සංවර්ධන වැඩසටහන් යටතේ තවාන් 02ක වැඩ අවසන් අතර තවාන් 10ක වැඩ ආරම්භ කර ඇත.
4 ගෙවතු සංවර්ධනය සඳහා ගෙවතු 10,149ක් තෝරා ගෙන ඒ සඳහා අවශ්‍ය වන පැළ මේ වන විට නිෂ්පාදනය කර නිම වීම.

- මහ දෙපස රැක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ රැක් රෝපණ වැඩසටහන් 400ක් මේ වනවිට ක්‍රියාත්මක කර ඇත.
- පාසල් රජයේ සහ පෞද්ගලික කාර්යාල භූමි වල වන ඝනත්වය වැඩි කිරීම සඳහා පැළ 500000 නිෂ්පාදනය කර ඇත .

2.2.3 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අදාළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වල භෞතික ප්‍රගතිය

1. දෙහිවල සත්වෝද්‍යානය සංවර්ධනය

නවීන සත්වෝද්‍යාන සංකල්ප වලට අනුව සත්ත්වයින් සඳහා වැඩි ඉඩකඩ සහිත සත්ත්ව අරණ සහ නරඹන්නන් සඳහා නවීන පහසුකම් සපයමින් 2010 වර්ෂයේ සිට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ නවීකරණ කටයුතු ආරම්භ කර ඇත. 2021 වර්ෂයේ සිදු කරනු ලැබූ ප්‍රධාන සංවර්ධන කාර්යයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

<u>රජයේ ඒකාබද්ධ අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්</u>

- හිපෝ අරණෙහි අප ජලය පිරිපහදු ඒකකය ස්ථාපිත කිරීමේ කටයුතු අවසන් කර ඇත.
- සතුන් සඳහා ආහාර පිසින මුළුතැන්ගෙය ඉදිකිරීම් අවසන් කර ඇත.
- සිංහ අරණ අළුත්වැඩියා කටයුතු 50%ක් දක්වා අවසන් කර ඇත.
- මැකෝ ගිරවුන් සඳහා ඉදිකරන අරණ ඉදිකිරීම් 40%ක් දක්වා අවසන් කර ඇත.

<u>සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධනඅරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්</u>

- ගෝනපොළ ගොවිපොලෙහි කුඩා පරිමාණ සංවර්ධන කටයුතු අවසන් කර ඇත.
- ප්‍රවේශ පෙදෙසෙහි භූමි අලංකරණය සහ වැසිකිළි පද්ධතියෙහි ඉදිකිරීම් අවසන් කර ඇත.



මුළුතැන්ගෙය



සත්ත්ව රෝහල



සිංහ අරණ අළුත්වැඩියා කටයුතු



මැකෝ ගිරවුන් සඳහා අරණ

2. පින්නවල අලි අනාථාගාරය සංවර්ධනය

2021 වර්ෂයේ සිදු කරනු ලැබූ ප්‍රධාන සංවර්ධන කාර්යයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

<u>රජයේ ඒකාබද්ධ අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්</u>

- නව අලිමඩු ඉදිකිරීම් 65% ක් දක්වා නිමකර ඇත.
- දේශීය හා විදේශීය නරඹන්නන් සඳහා වූ වැසිකිළි පද්ධතියේ ඉදිකිරීම් 50%ක් දක්වා අවසන් කර ඇත.
- හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි ගේට්ටුව සහ වැටෙහි ඉදිකිරීම් ආරම්භකර ඇත.
- පවතින වැව පුළුල් කිරීමෙහි වැඩ අවසන් කර ඇත.
දේශීය හා විදේශීය නරඹන්නන් සඳහා වූ වැසිකිළි පද්ධතිය



නව අලිමඩු ඉදිකිරීම්



දේශීය හා විදේශීය නරඹන්නන් සඳහා වූ වැසිකිළි පද්ධතිය



හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි ගේට්ටුව සහ වැට



විදුලි බලය බෙදාහැරීමේ පද්ධතියේ අලුත්වැඩියා කටයුතු

3. **පින්නවල සත්වෝද්‍යානය සංවර්ධනය**

2021 වර්ෂයේ සිදු කරනු ලැබූ ප්‍රධාන සංවර්ධන කාර්යයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

<u>රජයේ ඒකාබද්ධ අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්</u>

- අභ්‍යන්තර මාර්ග පද්ධතිය සහ වැසි වතුර බැස යාමේ පද්ධතියේ සහ අභ්‍යන්තර විදුලිය බෙදාහැරීමේ පද්ධතියේ ඉදිකිරීම් 70% අවසන් කර ඇත.
- කබල්ලෑවා සඳහා වූ අරණෙහි ඉදිකිරීම් 50% අවසන් කර ඇත.
- වඳුරු දූපත අදියර - III හි ඉදිකිරීම් අවසන් කර ඇත.

<u>සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්</u>

- නිදහස් කුරුළු අරණ පෙදෙසෙහි චේන් ලින් සහ විදුලි වැට ඉදිකිරීම් අවසන් කර ඇත.
- ප්‍රවේශ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු (water proofing work) 90% අවසන් කර ඇත. ඉදිරි කටයුතු සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමට කටයුතු කරමින් පවතී.





අභ්‍යන්තර මාර්ග පද්ධතිය සහ වැසි වතුර බැස යාමේ පද්ධතියේ සහ අභ්‍යන්තර විදුලිය බෙදාහැරීමේ පද්ධතිය



වඳුරු දූපත අදියර - III



කබල්ලෑවා සඳහා වූ අරණ

4 හම්බන්තොට සෆාරි උද්‍යානය සංවර්ධනය

2021 වර්ෂයේ සිදු කරනු ලැබූ ප්‍රධාන සංවර්ධන කාර්යයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

<u>රජයේ ඒකාබද්ධ අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්</u>

- විදේශීය කුරුළු උයන ඉදිකිරීම් 75%ක් වැඩ අවසන් කර ඇත.
- සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානයේ වැඩ අවසන් කර ඇත.
- ඕස්ට්‍රේලියානු කලාපය
- නොගැඹුරු පොකුණෙහි වැඩ අවසන් කර ඇත.

<u>සත්වෝද්‍යාන සංවර්ධන හා සුඛසාධන අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්</u>

- විටා කලාපයෙහි අඩි 16 උස වේන් ලින්ක් වැට සහ පිටවීමේ දොරටුවේ ඉතිරි වැඩ 35%ක් වැඩ අවසන් කර ඇත. ඉදිරි කටයුතු සිවිල් ආරක්ෂක බලකා දෙපාර්තමේන්තුව විසින් නිම කිරීමට නියමිතය.
- අප්‍රිකානු අලි අරණ 50%ක් වැඩ අවසන් කර ඇත. ඉදිරි කටයුතු සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමට කටයුතු කරමින් පවතී.



සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය



විදේශීය කුරුළු උයන

2.8 රාජ්‍ය අමාත්‍යාංශයේ විශේෂ ජයග්‍රහණ අභියෝග හා ඉදිරි ඉලක්ක

2.8.1 විශේෂ ජයග්‍රහණ

- වේවැල්, පිත්තල, මැටි, ලීබඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත මාතර අපරාක්ක ප්‍රදේශය වේවැල් හෙක්ටයාර 05 ක පිහිටුවීම.
- සුරකිමු ගංඟා වැඩසටහන සඳහා පැළ 200,000 නිෂ්පාදනය.
- "විශේෂ වන වගා වැඩසටහන" යටතේ දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි වන වගා දියත් කිරීම.
- වනාන්තර 69 ක් රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කිරීම
- කඩොලාන පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය කිරීම සඳහා විනාශයට ලක් වූ කඩොලාන හෙක්ටයාර 227 ක් නැවත ස්ථාපිත කරනු ලැබේ.
- රක්ෂිත වනාන්තරවල භූමි ප්‍රමාණය හෙක්ටයාර 40,000 ක් සංවේදී ප්‍රදේශවල පිහිටි වනාන්තර ආරක්ෂිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කිරීම
- මහාමෙව්නා උයනේ රුක් රෝපණය කිරීමේ වැඩසටහන යටතේ පැළ 2000 සිටුවා නඩත්තු කරමින් පවතී.
- දෙහිවල සත්වෝද්‍යානයේ උපත ලද කළු හංස පැටවුන් 05 දෙනෙකුගේ උපත මාධ්‍ය මගින් රටට හඳුන්වාදීමේ වැඩසටහනක් සිදු කිරීම.

2.8.2 ඉදිරි ඉලක්ක

- පවතින විදුලි වැට කි.මී. 4499 නඩත්තු කර පවත්වාගෙන යාම හා නව විදුලි වැට කි.මී. 1500ක් ඉදි කිරීම.
- රක්ෂිත ප්‍රදේශවල හෙ.2200ක් වාසස්ථාන සුපෝෂණය සිදු කිරීම හා ජල ප්‍රභවයන් 33ක් අළුත්වැඩියා කිරීම.
- හඳුනාගත් නව රක්ෂිත ප්‍රදේශ 20ක් පමණ ප්‍රකාශයට පත් කිරීම හා කි.මී.50ක රක්ෂිත ප්‍රදේශ මිනුම් කර මායිම් ගල් යෙදීම.
- ගිනි ගැනීම් සහ පැතිරීම අවම කිරීමට වනජීවී රක්ෂිත තුල ගිනි පටි ඉදි කිරීම හා නියං සමයේ ජල අවශ්‍යතාවයන් සඳහා රක්ෂිත තුල කෘතිම වතුර වලවල් ඉදි කිරීම සහ පවතින ජල ප්‍රභවයන් සංවර්ධනය කිරීම.
- ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම.
- අලින්ගේ සුබසාධනය හා රැකවරණය සහතික කරමින් අලි සංරක්ෂණ වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරීම.

2.8.3 අභියෝග

- කොවිඩ් වසංගත තත්ත්වය නිසා පහත වැටී ඇති ආදායම ඉහළ නංවා ගැනීම.
- විශාල භෞතික හා මානව සම්පත් ප්‍රමාණයක් අවශ්‍යවීම.
- ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමේදී ඊට සම්බන්ධවන ආයතන අතර පවතින අන්තර් සම්බන්ධතාවයේදී මුහුණදීමට සිදුවන ගැටළු.
- තාක්ෂණ කටයුතුවලදී මුහුණ දීමට සිදුවන අපහසුතාවයන්.
- අනපේක්ෂිත කාලගුණික තත්වයන්.
- කොන්ත්‍රාත්කරුවන් වැඩ අවසන් කිරීමේදී සිදුවන ප්‍රමාදයන්.

03. පරිච්ඡේදය වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

අයවැය 2021		සටහන	තත්‍ය		
				නැවත ගලපන ලද	
			2021	2020	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	**ඒසීඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**			-	
-	භාණ්ඩාගාර අග්‍රිම		82,820,000	11,500,000	**ඒසීඒ-3**
-	තැන්පතු		189,402	1,100	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		1,174,224	277,761	**ඒසීඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**84,183,626**	**11,778,861**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**84,183,626**	**11,778,861**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		322,393	479,504	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**83,861,233**	**11,299,357**	
	අඩු කළා : වියදම්				

-	**පුනරාවර්තන ව්යදම්**				
56,800,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	39,915,155	1,020,428	
56,350,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	36,436,056	6,025,193	**ඒසිඒ-2 (ii)**
250,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	297,673	70,163	
	පොළී ගෙවීම්	**8**	-	-	
	වෙනත් පුනරාවර්තන ව්යදම්	**9**	-	-	
113,400,000	**මුළු පුනරාවර්තන ව්යදම් (ඊ)**		**76,648,884**	**17,115,784**	
	මූලධන ව්යදම්				
9,200,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	2,375,879	-	
4,950,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	4,630,340	3,143,870	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසිඒ-2 (ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
1,000,000	හැකියා වර්ධනය	**14**	128,855	22,500	
-	වෙනත් මූලධන ව්යදම්	**15**	-	-	
15,150,000	**මුළු මූලධන ව්යදම් (උ)**		**7,135,074**	**3,166,370**	
	තැන්පතු ගෙවීම්		189,402	1,100	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		2,217,035	2,174,608	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් ව්යදම් (උෆ)		**2,406,437**	**2,175,708**	
	මුළු ව්යදම් එ = (ඊ+උ+උෆ)		**86,190,395**	**22,457,862**	
128,550,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(2,329,161)	(11,158,505)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(2,329,161)	(11,158,505)	**ඒසිඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	**ඒසිඒ-3**

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2021 දෙසැම්බර් **31** දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2021	**2020**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	13,517,923	4,734,703
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	2,939,657	1,896,847
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**16,457,580**	**6,631,550**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		2,939,657	4,734,703
දේපළ පිරියත හා උපකරණ සංචිතය		13,517,923	1,896,847
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**16,457,580**	**6,631,550**

පිටු අංක 01 සිට 28 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ සටහන් පිටු අංක 29 සිට 36 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 28/02/2022	දිනය : 25/02/22	දිනය : 25/02/2022

සෝමරත්න විද්‍යානපතිරණ
ලේකම්
වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පාලිත ප්‍රනාන්දු
ලේකම්
වනජීවී හා වන සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය
අංක 416 සී 1, 5 වන මහල, "සොබාදම් පියස"
රොබට් ගුණවර්ධන මාවත,
බත්තරමුල්ල. 2

ඒස්.ආර්. කුමාරංගේ
ප්‍රධාන ගණකාධිකාරි
වනජීවී හා වන සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය
5 වන මහල, "සොබාදම් පියස"
අංක.416/C/1, රොබට් ගුණවර්ධන මාවත,
බත්තරමුල්ල.

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
		නැවත ගලපන ලද
	2021	**2020**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්		-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,401,230	93,161
අග්‍රිම ලැබීම්	82,820,000	11,500,000
අත්තිකාරම් අයකර ගැනීම්	2,025,662	2,097,015
තැන්පතු ලැබීම්	189,402	1,100
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**86,436,293**	**13,691,276**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	76,095,253	7,915,007
සහනාධාර සහ මාරුකිරීම්	297,673	17,135
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	60,000	60,000
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	322,393	479,504
අත්තිකාරම් ගෙවීම්	2,336,499	2,052,160
තැන්පතු ගෙවීම්	189,402	1,100
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**79,301,219**	**10,524,906**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**7,135,074**	**3,166,370**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	7,135,074	3,166,370
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**7,135,074**	**3,166,370**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)= (ඇ)-(ඉ)	**(7,135,074)**	**(3,166,370)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තා කිරීමේ පදනම</u>

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7) <u>මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.</u>

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු.000‘

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම ඇස්තමේන්තුවේ % ලෙස
අදාල නැත					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	116,250	113,400	76,649	67.6%
ප්‍රාග්ධන	12,300	15,150	7,135	47.1%

රු.000‘

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
අදාල නැත						

රු.000‘

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2021.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2021.12.31 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
611	*ස්ථාවර වත්කම්*		13,517,923		
6112	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ		13,517,923		
61121	ප්‍රවාහන උපකරණ		4,152,880		
6112101	මගී වාහන		4,152,880		
උප එකතුව			**4,152,880**		
611222	වෙනත් යන්ත්‍ර හා උපකරණ		9,365,043		
6112201	කාර්යාලීය උපකරණ		2,612,360		
6112202	පරිගණක උපකරණ		6,750,283		
6112203	විද්‍යුත් උපකරණ		2,400		
උප එකතුව			**9,365,043**		

රු.000'**සටහන -** අමාත්‍යාංශය සතු මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම රු. 13,517,923.00 ක් වන අතර ශීර්ෂ අංක 992 මගින් අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් ලෙස භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 82) මගින් වැරදි ලෙස ඉඩම්, ගොඩනැගිලි,යන්ත්‍ර හා උපකරණ ලෙස රු. 42,952,880.00 ක වාර්තාකර ඇත. මෙය නිවැරදි කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.

3.9 විගණකාධිපති වාර්තාව අමුණා ඇත. (පිටු අංක 120-127)

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
විදුලි වැටේ දිග		√	
ආදායම			√
වසර තුළ වන ආවරණය ඉහළ නැංවීමේ ප්‍රතිශතය		√	

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%

ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය සඳහා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය මෙහෙයවීම හා අධීක්ෂණ කටයුතු සිදුකිරීම අමාත්‍යාංශයේ මෙහෙවර බැවින් තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය කාර්යයන් දෙපාර්තමේන්තු හරහා සිදුවේ.

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අදාල නොවේ.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු /අතිරික්ත **
ජ්‍යෙෂ්ඨ	21	10	11
තෘතීයික	1	0	1
ද්විතීයක	26	15	11
ප්‍රාථමික	15	9	6

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

අමාත්‍යාංශ විෂය පථයට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ කාර්යසාධන කාර්යභාර්ය ද ඇතුළත් වී ඇති බැවින් අනුමත කාර්යය මණ්ඩලයද මෙතෙක් සම්පූර්ණ වී නොමැත. එසේම ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩල නිලධාරීන් 11ක් තෘතීයික මට්ටමේ නිලධාරීන් කිහිපයකුත්, සංවර්ධන නිලධාරීන් 04 ක්ද, රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරීන් 07 ක්ද, කාර්යාල කාර්ය සහායක 06ක් සඳහාද පුරප්පාඩු පවතී

6.3 මානව සංවර්ධනය

වැඩසට හනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව (දින)	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
දෙදින බැහැර වැඩමුළුව - රන්දෙනිගල	18	02	112,855.00		දේශීය	***

*** පහුණුව හා ආකල්ප සංවර්ධනය කිරීම මගින් අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර ළඟාකර ගැනීම සඳහා වඩාත් කාර්යක්ෂම හා සඵලදායී ලෙස කාර්යාලීය මාවන සම්පත සැලසුම් සහගතව මෙහෙයවීමට හැකිවීම

6.4 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

ආයතනයේ නිලධාරීන්ගේ කාර්යය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් තුළින් ධනාත්මක ආකල්ප, දැනුම, කුසලතා වර්ධනය වීම තුළින් රාජකාරී කටයුතු පිළිබඳ කාර්යක්ෂමතාව ,සඵලදායකත්වය හා ඵලදායීතාව ඉහළ යාමත් සිදුවේ.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් කටයුතු සිදුනොකරයි	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	ගබඩා අත්තිකාරම් ගිණුම් කටයුතු සිදුනොකරයි	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	විශේෂ අත්තිකාරම් ගිණුම් කටයුතු සිදුනොකරයි	
1.6	වෙනත්	අනුකූල නොවේ	වෙනත් ගිණුම් නොමැත	
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත්යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.9	හානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	බැරකම් වාර්තා වී නොමැත	
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය දැනුවත් කිරීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අනුමත වෙන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තු සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA /1-2019 වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම			
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරවප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කිරීම			
7	**විගණන හා කළමණාකාර කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමණාකාර කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම			
8	**වත්කම් කළමණාකරනය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත්කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වෙත වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේෂ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල නොවේ	අතිරික්ත හා ඌණතා වාර්තාවී නැත.	2022 වර්ෂයේ අදාල කටයුතු සිදුකරනු ලැබේ.
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ	2020 වර්ෂයේ ආරම්භ කල නව අමාත්‍යාංශයකි.	2022 වර්ෂයේ අදාල කටයුතු සිදුකරනු ලැබේ.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්ථා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	වාහන ගර්හිතවී නොමැත	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109,හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේකය 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව,වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	විවිධ අවස්ථාවල වාහන පවරා ගැනීම් සිදුකළ බැවින් වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීමට අවස්ථාවක් මතු නොවීම	
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල නොවේ	කල්බදු පදනම මත වාහන ලබා ගෙන නැත	
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	2020 වර්ෂයේ ආරම්භ කල නව අමාත්‍යාංශයකි.	
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එමක ශේෂ මාසයක කාලයක් තුල නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමා ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම			
11.2	මු.රෙ.94 (1) ප්‍රකාරව,සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම.			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල නොවේ	අනුමත කාර්ය මණ්ඩලය නොමැතිවීම මත අවම ලැබීම් සීමාව සංශෝධනය කිරීමට සිදුවිය.	2022 වර්ෂයේ සිට අනුමත සීමාවන් තුල පැවතීමට කටයුතු කරනු ලැබේ.
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශලේෂණයක් සිදුකර තිබීම	අනුකූල නොවේ	නව අමාත්‍යාංශයක් බැවින් හිඟ හිටි ණය ශේෂ නොමැත	
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	නව අමාත්‍යාංශයක් බැවින් හිඟ හිටි ණය ශේෂ නොමැත	
13	**පොදු තැන්පත් ගිණුම්**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල නොවේ	නව අමාත්‍යාංශයක් බැවින් කල් ඉකුත් වූ තැන්පතු නොමැත	
13.2	පොදු තැන්පත් සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම්**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තුමේන්තුවට ප්‍රේරණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිමය ,එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිමය නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15	**ආදායම් ගිණුම්**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව ,රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල නොවේ	ආදායම් රැස්කිරීම් නොමැත	
15.2	රැස් කර තිබූ ආදායම් , තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල නොවේ	ආදායම් රැස්කිරීම් නොමැත	
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්ථා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	ආදායම් රැස්කිරීම් නොමැත	
16	**මානව සම්පත් කළමණාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තුලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්ථා කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙක් පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතන පිලිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්ථා ඉදිරිපත් කර ත්බීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කලමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කර කෙටි කාලයක් වීම නිසාත් පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් රාජකාරී කටයුතු යම් සීමාවක් තුල පවත්වාගෙන ගිය බැවින් හා විෂය පථය දෙවරක් සංශෝධනය වීමෙන් විෂය පථය තවත් පුළුල්වීම, අනුමත කාර්යය මණ්ඩලය මෙතෙක් සම්පූර්ණ වී නොමැති වීම පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් මතු නොවීම	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභිප්‍රඥප්තියක්සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂනය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම	අනුකූල නොවේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලනචක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම්කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කර කෙටි කාලයක් වීම නිසාත් පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් රාජකාරී කටයුතු යම් සීමාවක් තුල පවත්වාගෙන ගිය බැවින් හා විෂය පථය දෙවරක් සංශෝධනය වීමෙන් විෂය පථය තවත් පුළුල්වීම, අනුමත කාර්යය මණ්ඩලය මෙතෙක් සම්පූර්ණ වී නොමැති වීම හේතුවෙන් මානව සම්පත් සැලැස්ම සම්පාදනය කර ගැනීම සඳහා කටයුතු සුදානම් කර ගැනීමට අපහසු වීම	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජික යෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට ත්බීම			
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාදන ගිවිසුම් අත්සන් කර තිබීම			
19.4	ඉහත චක්‍රලේඛයේ6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කරිම, නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකිම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම			
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මහින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට ත්බීම.			

අභ්‍යන්තර විගණන අංශයක් මේ වන තෙක් පිහිටුවා නොමැති බැවින් 6.1, 6.2, 6.3 හා 7.1 කරුණු සඳහා තොරතුරු ඉදිරිපත් කර නොමැත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එන්ඩබ්එල්/සී/එම්ඩබ්එන්ඩී/එන්ජී/202 | මෙබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී,

වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.

වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 30 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ ශේෂ පිරික්සුම අනුව අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ලද ආයතනය විසින් දරන ලද වියදම් රු.37,890 ක් වුවද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට රු.60,000 ක් ගලපා තිබුනෙන් රු.22,110 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් බිම් ගිණුම වෙනුවෙන් දරන ලද හර කිරීම් රු.137,890 ක් ලෙස දක්වා තිබුණද අමාත්‍යාංශ ශේෂ පිරික්සුම අනුව එවැනි හර කිරීම් විගණනයට නිරීක්ෂණය නොවිය.

(ඇ) භාණ්ඩාගාර සටහන් SA II අනුව වෙනත් ආයතන විසින් වාර්තාකරණ ආයතනය වෙනුවෙන් දරන ලද වියදම් රු.95,958 ක් වුවද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට රු.255,958 ක් ගලපා තිබුනෙන් රු.160,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 7.5 ඡේදය ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ශේෂය අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂයේ සහ වර්ෂය අවසානයේ අග්‍රිම ශේෂයේ එකතුවට සමාන විය

යුතුය. 2020 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යාද ඒ අනුව දැක්විය යුතු වුවද අග්‍රිම සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී 2020 වර්ෂයේ සංඛ්‍යා ඇතුළත් කර නොතිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි ACA-6 සටහනේ දක්වා ඇති පරිදි අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් රු.13,517,923 ක් ලෙස දක්වා තිබුණද භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව මූල්‍ය නොවන වත්කම් රු.52,317,923 ක් වූයෙන් රු.38,800,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.3.1 මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 3.1 ඡේදය ප්‍රකාරව CIGAS ඩෙස්ක්ටොප් යෙදුම මඟින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම කිසිදු වෙනස් කිරීමකින් තොරව භාවිතා කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වුවද අමාත්‍යාංශයේ ශේෂ පිරික්සුමට අනුව අත්තිකාරම් ගෙවීම්වල වටිනාකම රු.2,198,609 ක් වුවද රු.2,336,499 ලෙස දක්වා තිබුණි.

1.6.3.2 ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

අනාගත සේවා ඉටු කිරීමේ දායකත්වය බලාපොරොත්තුවෙන් සම්පත් සඳහා කරනු ලබන මුදල් ගලායාම් ප්‍රමාණය ආයෝජන ක්‍රියාකාරකම්වලින් ඇතිවන මුදල් ප්‍රවාහයන් මඟින් නියෝජනය කරන නිසා එම මුදල් ප්‍රවාහයන් වෙනම හෙළිදරව් කිරීම වැදගත් වේ. ඒ අනුව මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, හැකියා වර්ධනය සඳහා දරන ලද රු.2,504,734 ක් වූ වියදම මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස දැක්විය යුතු වුවද එම අගය ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි.

2 මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවද අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුවේ වැය විෂයන් 30 ක සියයට 24 සිට 100 දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය.

2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.3 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නීති රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 සහ 41 වන වගන්ති	ගණන්දීමේ නිලධාරියා විසින් රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකයකු පත්කල යුතු අතර තමන්ට සහාය වීම පිණිස විගණන හා කළමනාකරණ කමිටු පත්කර ආයතනයේ ක්‍රියාකාරිත්වය අඛණ්ඩව සමාලෝචනය කල යුතු වුවද රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකයකු හා විගණන හා කළමණාකරන කමිටුවක් පත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

i. මුදල් රෙගුලාසි 104(1) සහ 104(3)	පාඩුවක් හෝ අලාභයක් හෝ සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය කර එයට වගකිව යුත්තන් නිශ්චය කර පරීක්ෂණ ආරම්භ කළයුතු අතර පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින හතකට වැඩි ප්‍රමාදයක් සිදු වේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක් වහාම එවිය යුතු අතර මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. අනතුරු සිදු වී මාස තුනකට වඩා වැඩි කාලයක් ගත වුවද වාහන අනතුරු 05 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.
ii. මුදල් රෙගුලාසි 1642	වාහන භාවිත කරන නිලධාරීන් විසින් හෝ නිලධාරීන් නොමැති අවස්ථාවක රියදුරන් විසින්, සිදුවන සියලුම හදිසි අනතුරු ළඟම ඇති පොලිසියට දැන්විය යුතු වුවද එසේ කටයුතු කර නොතිබූ අවස්ථා 04 ක් නිරීක්ෂණය විය.

(ඇ) 2017 දෙසැම්බර් 21 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	භාවිත කරන රජයට අයත් සෑම රථයක්ම එම ආයතනය නමින් ලියාපදිංචි කළ යුතු වුවත් පරීක්ෂාවට ලක් කළ ලියාපදිංචි සහතිකවලට අනුව වාහන 05 ක අයිතිය 2022 අප්‍රේල් වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මානව සම්පත් කළමනාකරණය

අමාත්‍යාංශයේ පුරප්පාඩු තනතුරු 30 ක් වූ අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක්, තෘතීයික මට්ටමේ තනතුරු 01 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 ක් පැවතුණු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරික්ත තනතුරු 01 ක් පැවතුණි. විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	21	10	12	01
තෘතීයික මට්ටම	01	-	01	-
ද්විතියික මට්ටම	26	15	11	-
ප්‍රාථමික මට්ටම	15	09	06	-
	63	34	30	01

ඩී.වී චන්ද්‍රලතා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට